# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# இலங்கை வயம்ப பல்கலைக்கழகம்

# WAYAMBA UNIVERSITY OF SRI LANKA

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## ஆண்டறிக்கையும் கணக்கும்

## ANNUAL REPORT & ACCOUNTS

**2012**

# පටුන


| අංකය | | පිටු |
|---|---|---|
| | දැක්ම | 01 |
| | මෙහෙවර | 01 |
| 1 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු | 02 |
| 2 | විශ්වවිද්‍යාලයේ නිලධාරීන් | 03 |
| 3 | පාලක සභාවේ සාමාජිකයින් | 04 |
| 4 | උපකුලපතිගේ සටහන | 05 |
| 5 | සම්පත් සහ සිසුන් සම්බන්ධ විස්තර - 2012 | 07 |
| 6 | අභ්‍යන්තරව බඳවා ගන්නා ලද සිසුන්ගේ විස්තර - 2012 | 08 |
| 7 | 2012 වසරේ වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර | 09 |
| 8 | 2012 වසරේදී විශ්වවිද්‍යාලය මගින් පවත්වන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර | 13 |
| 9 | 2012.12.31 දින වන විට අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ විස්තර | 14 |
| 10 | 2012.12.31 දින වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර | 16 |
| 11 | පුස්තකාලය | 18 |
| 12 | උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2012 | 21 |
| 13 | මහපොළ සහ ශිෂ්‍යාධාර ලාභීන් - 2012 | 23 |
| 14 | පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන | 24 |
| 15 | 2012 වසරේදී අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි | 26 |
| 16 | ලැබී ඇති ප්‍රදානයන් පිළිබඳ විස්තර | 28 |
| 17 | ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 30 |
| 18 | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | 39 |
| 19 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය පරිශ්‍රය | 41 |
| 20 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මාකඳුර පරිශ්‍රය | 43 |
| 21 | ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | 45 |
| 22 | ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය | 47 |
| 23 | වෛද්‍ය මධ්‍යස්ථානය | 49 |
| 24 | පුනරාවර්තන වියදම් විස්තර | 50 |

25 මූලධන වියදම් විස්තර 50

26 මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්) 50

27 මූල්‍ය ප්‍රගතියේ විස්තර (උපයන ලද ආදායම්) 51

28 මූල්‍ය ප්‍රගති සමාලෝචනය – 2012 51

29 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 52

30 ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 53

31 2012 වර්ෂයේදී යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ විස්තර 54

**2012 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය 55**

**2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව 64**

## *දැක්ම*

*"ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ විශිෂ්ඨතම මධ්‍යස්ථානය බවට පත්කිරීම "*

## *මෙහෙවර*

**"නව්‍යකරණ අධ්‍යාපන පාඨමාලා, පර්යේෂණ සහ බාහිර ක්‍රියාකාරකම් මඟින් ජාතික සංවර්ධනයට ගැලපෙන පරිදි මානව සම්පත් වැඩිදියුණු කිරීම"**

## 1. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු

*1.) උපාධිපාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිකිරීම.*

*2.) රටේ උසස් අධ්‍යාපනයේ වර්ධන වේගයට සරිලන පරිදි ශිෂ්‍ය බඳවා ගැනීම් වැඩිකිරීම.*

*3.) උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩි කිරීම.*

*4.) සේවාවල සඵලතාවය සහ සම්පත් භාවිතයේ කාර්යාක්ෂමතාවයේ ප්‍රමාණය වැඩි කිරීම තුළින් සමස්ත ඵලදායිතාවය වැඩි කිරීම.*

*5.) උපරිම ලෙස සම්පත් ලබා ගැනීම සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙනයාම.*

*6.) ඉහළ ගුණත්වයෙන් යුක්ත වැඩ කිරීමේ පරිසරයක් මගින් ශිෂ්‍ය හා කාර්යය මණ්ඩල අතර ජනවාර්ගික ඒකාබද්ධතාවය වර්ධනය කර විශ්වවිද්‍යාල ප්‍රජාවේ තත්වය තවදුරටත් ගොඩනැගීම.*

## 2. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2012

**කුලපති**

මහාචාර්ය සී. එල්. වී. ජයතිලක මහතා

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා, *බී.එස්.සී (කෘෂිකර්මය) (පකිස්ථානය),*

*පී.එච්.ඩී (එක්සත් රාජධානිය)*

**පීඨවල පීඨාධිපතිවරු**

**කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය**

මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා, *බී.එස්.සී (කෘෂිකර්මය) (පේරදෙණිය),*
*එම්.එස්.සී., පී.එච්.ඩී (බර්මිංහැම්)*

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා, *බී.එස්.සී. (කැලණිය), එම්.එස්.සී., ඩී.එස්.සී. (ජපානය)*

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා, *බී.ඒ. (කොළඹ),පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කොළඹ)*
*එම්. කොම්. (කැලණිය),*

**පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

ආචාර්ය කේ. ඩී. ආර්. ආර්. සිල්වා මහතා ,*බී.එස්.සී (කෘෂිකර්මය) (පේරාදෙණිය),*
*පී.එච්.ඩී (එක්සත් රාජධානිය)*
*2012.02.07 දක්වා*

ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා, *බී.එස්.සී (රසායන විද්‍යාව) (පේරදෙණිය),*
*පී.එච්.ඩී (ඇ.එ.ජ)*
*2012.02.08 සිට*

**ලේඛකාධිකාරී**

ඊ. එම්. ගාමිණී ඒකනායක මහතා, *බී.ඒ.(විශේෂ) (පේරදෙණිය), කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (විවෘත විශ්වවිද්‍යාලය), මානව සම්පත් කළමණාකරන සහතිකය (හයිද්‍රාබාද්)), එම්. බී. ඒ. (ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය)*

**මූල්‍යාධිකාරී**

ඩී. ඒ. යූ. ධර්මදාස මහතා, *බී.එස්.සී (කැලණිය), ඒ සී ඒ., ඒ එස් සී එම් ඒ*

**පුස්තකාලයාධිපති**

ඩබ්ලිව්. ජී. පී. ගම්ලත් මහතා, *බී.ඒ. (පේරදෙණිය), බී එල් එස් (ඉන්දියාව), එම් එල් එස් (ඉන්දියාව)*

## 3. පාලක සභාවේ සාමාජිකයින් - 2012

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා

**පීඨවල පීඨාධිපතිවරු**

| | |
|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය | - මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | - ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | - මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා |
| පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - ආචාර්ය කේ. ඩී. ආර්. ආර්. සිල්වා මහතා *2012.02.07 දක්වා* |
| | ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා *2012.02.08 සිට* |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා

ඒ. ඒ. ජිනදාස මහතා

ජේ. එච්. ආර්. කරුණාරත්න මහතා

ජේ. එම්. ගුණතිලක මහතා

එෆ්. ප්‍රීති පෙරේරා මහතා

ආර්. පී. එල්. වීරසිංහ මහතා

නාරද එදිරිසිංහ මහතා

ආර්. එම්. වන්නිනායක මහතා

**සනාතන සභාව මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය කේ. ඩී. ඩී. එන්. දිසානායක මහතා

ආචාර්ය ඩබ්ලිව්. ජේ. එස්. කේ. වීරක්කොඩි මහතා - 2012.05.31 දක්වා

මහාචාර්ය ආර්. සී. ඩබ්ලිව්. එම්. ආර්. ඒ. නුගවෙල මහතා - 2012.06.01 සිට

**ලේඛකාධිකාරී (ලේකම්)**

ඊ. එම්. ගාමිණී ඒකනායක මහතා

# 4. උපකුලපතිගේ සටහන

## 4.1 හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 30% අධ්‍යයන, 2% අධ්‍යයන සහායක, 7% පරිපාලන සහ 61% අනධ්‍යයන සේවක පිරිසකගෙන් සැදුම් ලත් 440 කින් යුත් කාර්යය මණ්ඩලයක් දායකත්වය දක්ව ඇත. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ කථිකාචාර්ය යන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිවෙළින් 3% , 6%, 2%, 43% සහ 46%කි. කාර්මික නිලධාරී, ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි සහ කම්කරු ශ්‍රේණි ආදී වශයෙන් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිවෙළින් 10%, 41% සහ 49% කි. පීඨ හතරෙහිම මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2113 වූ අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් 766 දෙනෙක් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයන ලදී. අපේ උපාධිධාරීන්ගේ රැකියා වාර්තා ඉහළ ස්ථානයක පවතී. විශ්වවිද්‍යාලයේ බාහිර තොරතුරු අංශය මඟින් පැවැත් වූ සමීක්ෂණයට අනුව 2012 වර්ෂයේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය 80%ට වැඩි බව වාර්තා විය.

## 4.2 2012 වසරේදී නිම කරන ලද කාර්යයන්

උපාධි ප්‍රධානෝත්සවය 2012.03.20 වන දින කොළඹ BMICH හිදී පවත්වන ලදී. එහිදී 337 දෙනෙකු ප්‍රථම උපාධියද 5 දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද ලබාගත් අතර පශ්චාත් උපාධිය ලබා ගත් සංඛ්‍යාව **27**කි. මහාචාර්ය කේ.එම්.ආර්.ටී. කරුණාරත්න මහතා හට ගෞරවනීය උපාධියක් පිරිනැමිණි. කුලියාපිටියේදි පැවති විශේෂ උත්සවයකදී සිසුන් 50 දෙනෙකුට "පිරිස් මුල්‍ය කළමණාකරණය" පිළිබඳව සහතික පිරිනමන ලදි. මෙම උත්සවය සංවිධානය කරන ලද්දේ AVIVA-NDB පුද්ගලික සහ රක්ෂණ සහ තක්සේරු දෙපාර්තමේන්තුව යන ආයතන දෙක මඟිනි. විශ්වවිද්‍යාලයේ සේවක සංවර්ධන මධ්‍යස්ථානය මඟින් කාර්යය මණ්ඩලය සඳහා පාඨමාලාවන් රැසක් මෙම වර්ෂය තුළ පවත්වන ලදී. ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි හතරවෙනි වාර්ෂික ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය (Symposium) 2012 මැයි 10 වන දින පවත්වන ලදී.

කෘෂිකර්ම හා වැවිළි කළමණාකරණ පීඨය ශ්‍රී ලංකා කජු සංස්ථාව සමඟ එකතුවී WUCC1 සහ WUCC23 යනුවෙන් කජු ප්‍රභේද දෙකක් 2012.12.18 වන දින හඳුන්වා දෙන ලද අතර ඒවා වගා කිරීම සඳහා ගොවින්ට බෙදා දෙන ලදී. IDRC ව්‍යාපෘතිය හරහා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් සාර්ථකව හඳුන්වා දුන් "ශ්‍රී ලංකාවේ සමාජීය අධ්‍යාපනය තුළින් ග්‍රාමීය ආදායම ඉහළ නැංවීම" වැඩසටහන 2012 දෙසැම්බර් මස අවසන් කරන ලදි.

මැලේසියාවේ පර්ල්ඩ් විශ්වවිද්‍යාලය සමග නැනෝ තාක්ෂණය සම්බන්ධයෙන් සහ ICMA ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් දෙකක් විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලදි. 2012 වර්ෂය තුළදි HETC ව්‍යාපෘතිය හරහා QIG ප්‍රතිපාදන 3ක් විශ්වවිද්‍යාලය වෙත ලැබුණි. 2012 වර්ෂය තුළදි පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ අප අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙක් නැවත විශ්වවිද්‍යාලය වෙත පැමිණෙන ලදි. විශ්වවිද්‍යාලයේ සියවන සනාතන සභා රැස්වීම 2012 ඔක්තෝබර් මස 17 වන දින පැවැත්විණි.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 17 දෙනෙකු ක්‍රීඩා අංග 10ක් සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය ලබා ගන්නා ලදි.

### 4.3 අසමත්වීම් හා ඊට හේතු

වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන ලැබීම් ප්‍රමාදවීම නිසා සමහර සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකි විය. වර්ෂයේ දෙවනි භාගයේ පැවැති අධ්‍යයන සහ අනධ්‍යයන වර්ජන හේතුවෙන් වැඩ කරන මාස හතරකට ආසන්න කාලයක් විශ්වවිද්‍යාලයට අහිමි විය. මෙම වර්ජන නිසා සියලුම අධ්‍යයන වැඩසටහන් නියමිත දිනට කළ නොහැකි වූ අතර සැලසුම් කළ ඇතැම් ක්‍රියාකාරකම් අවලංගු කිරීමට සිදු විය.

### 4.4 අනාගත සැලසුම්

විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කටයුතු, පර්යේෂණ, සහ සාමුහිකත්ව ක්‍රියාකාරකම් ඉදිරියේදි පුළුල් කරනු ලැබේ.

විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක්ම සැලසුම් කරන ලදී. උදා:- නේවාසිකාගාර අදියර V සහVI , පිවිසුම් මාර්ගය අදියර I , මාකඳුර පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය අදියර III සහ කුලියාපිටිය ව්‍යවහාරික විද්‍යා පීඨය අදියර III.

## 5. සම්පත් සහ සිසුන් සම්බන්ධ විස්තර - 2012

| **පීඨය** | **පාඨමාලාව** | **ශිෂ්‍ය සංඛ්‍යාව** | **අධ්‍යයන කාර්යය මණ්ඩලය** | **අනධ්‍යයන කාර්යය මණ්ඩලය** |
|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 382 | 30 | 34 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය/බද්ධ ප්‍රධාන විෂය) | 375 | 37 | 23 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී බැංකු හා මූල්‍ය (විශේෂ) උපාධිය | 1042 | 24 | 14 |
| | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ) උපාධිය | | | |
| | විද්‍යාවේදී රක්ෂණ හා තක්සේරුකරන (විශේෂ) උපාධිය | | | |
| | විද්‍යාවේදී ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය (විශේෂ) උපාධිය | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 212 | 28 | 31 |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 102 | | |
| **එකතුව** | | **2113** | **119** | **102** |

2012 වසර තුළ විශ්වවිද්‍යාලයේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 2113ක් වූ අතර අධ්‍යයන කාර්යය මණ්ඩලය 119කි. පීඨ හතරකින් ප්‍රථම උපාධි 8ක් ප්‍රදානය කරනු ලැබේ.

## 6. අභ්‍යන්තරව බඳවා ගන්නා ලද සිසුන්ගේ විස්තර - 2012

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 2012 බඳවා ගැනීම් | පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව | දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | හතරවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | - | 111 | 98 | 91 | 82 | 84 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) | ඉංග්‍රීසි | - | 141 | 98 | 100 | 36 | 57 |
| | විද්‍යාවේදී උපාධිය (බද්ධ ප්‍රධාන විෂය) | | | | | | | 22 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී බැංකු හා මූල්‍ය (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | - | 344 | 285 | 201 | 212 | 15 |
| | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 48 |
| | විද්‍යාවේදී රක්ෂණ හා තක්සේරුකරන (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 16 |
| | විද්‍යාවේදී ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 57 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | - | 66 | 53 | 39 | 54 | 58 |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | - | 39 | 34 | 29 | - | - |
| **එකතුව** | | | **-** | **701** | **568** | **460** | **384** | **357** |

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පළමු වසර සිට අවසන් වසර දක්වා සිසුන්ට උපාධි පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. උසස් පෙළ සිසුන්ගේ ප්‍රතිඵලවල පැවති යම් යම් දෝෂයන් නිසා 2012 වර්ෂය තුළ අලුතෙන් සිසුන් බඳවා නොගන්නා ලදි.

පීඨ හතරේම සිසුන් 357ක් 2012 වසරේදී උපාධි පාඨමාලා සම්පූර්ණ කරන ලද අතර ඔවුන් 2013 මැයි මස දී පැවැත්වූ උපාධි ප්‍රධානෝත්සවයේදී උපාධි ලබා ගත්හ.

## 7. 2012 වසරේ වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර


ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ බාහිර කටයුතු (External Affairs) ඒකකය මඟින් සිසුන්ට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් පසු පහත තොරතුරු ලබා ගන්නා ලදි. උපාධිධාරීන් 98% ක් එයට ප්‍රතිචාර දක්වා ඇති අතර 2013 මැයි මස වන විට ඔවුන්ගේ සේවා නියුක්ති තත්ත්වයන් පහත දක්වා ඇත.

මෙම බාහිර ඒකකයේ එක් අරමුණක් වන්නේ විශ්වවිද්‍යාලයත් බාහිර ප්‍රජාවත් අතර සම්බන්ධතාවය වර්ධනය කිරීමය. මෙම සම්බන්ධතාවය මඟින් මෙම විශ්වවිද්‍යාලයෙන් උපාධි ලබා ඉවත්ව ගිය සිසුන් තම සේවා ස්ථානවල ඔවුන්ගේ කාර්යය සාධනය, ඔවුන්ගේ සේවා තත්ත්වය, ලබාගන්නා වැටුප් මට්ටම්, ඔවුන් ලබා ගත් උපාධි ඔවුන්ගේ සේවාව සමඟ කොතෙක් දුරට සම්බන්ධතාවයක් පවතීද යන්න හා විශ්වවිද්‍යාලයෙන් ඉවත්ව ගිය පසු ලබා ගත් අතිරේක සුදුසුකම් මොනවාද යන්න විස්තර ලබා ගෙන ඇත.

### 7.1 කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| වැවිළි කළමනාකරන | 8 | 13 | 1 | 4 | **26** |
| උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | 4 | 11 | 1 | 1 | **17** |
| ජෛව තාක්ෂණ | 3 | 6 | - | 1 | **10** |
| කෘෂිව්‍යාපාර කළමනාකරණ | 15 | 6 | - | 6 | **27** |
| **එකතුව** | **30** | **36** | **2** | **12** | **80** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 37.50% | 45.00% | 2.50% | 15.00% |



### 7.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| කර්මාන්ත කළමනාකරණ | 12 | 2 | 1 | 1 | **16** |
| ගණිතමය විද්‍යා | 21 | 4 | 1 | 1 | **27** |
| ඉලෙක්ට්‍රොනික විද්‍යා | 8 | 5 | - | 1 | **14** |
| පරිගණක හා තොරතුරු පද්ධති | 7 | 1 | - | 5 | **13** |
| **එකතුව** | **48** | **12** | **2** | **8** | **70** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 68.57% | 17.14% | 2.86% | 11.43% |



**7.3** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ | 19 | 16 | - | 3 | **38** |
| ගණකාධිකරන | 34 | 14 | - | 4 | **52** |
| බැංකු හා මූල්‍ය | 9 | 2 | - | - | **11** |
| රක්ෂණ හා තක්සේරුකරන | 10 | 2 | 1 | - | **13** |
| **එකතුව** | **72** | **34** | **1** | **7** | **114** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 63.16% | 29.82% | 0.88% | 6.14% |



**7.4 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

| අධ්‍යයන අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත | එකතුව |
|---|---|---|---|---|---|
| ජල ජීවී වගා හා මත්ස්‍ය | 1 | 9 | 1 | - | **11** |
| පශුසම්පත් හා පක්ෂි විද්‍යා | 9 | 6 | - | - | **15** |
| ආහාර විද්‍යා හා තාක්ෂණ | 7 | 6 | - | 1 | **14** |
| ව්‍යවහාරික පෝෂණ | 3 | 7 | - | 4 | **14** |
| **එකතුව** | **20** | **28** | **1** | **5** | **54** |

| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවල නියුතු | රැකියාවිරහිත |
|---|---|---|---|
| 37.04% | 51.85% | 1.85% | 9.26% |



## 8.2012 වසරේදී විශ්වවිද්‍යාලය මඟින් පවත්වන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර

### *1.) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය*

- ව්‍යාපාර පරිපාලනපති උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

### *2.) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය*

- විද්‍යාවේදී (කෘෂිකර්ම කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව

### *3.) ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය*

- ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

### *4.) තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය*

- පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

### *5.) තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර*

- තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව


| පාඨමාලාව | 2012 වසරේදී ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2012 වසරේදී පාඨමාලාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| අ. ව්‍යාපාර පරිපාලනපති උපාධි පාඨමාලාව | 110 | 47 |
| ආ. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 102 | 04 |
| ඇ. විද්‍යාවේදී (කෘෂිකර්ම කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව | 54 | 16 |
| ඈ. රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 76 | 58 |
| ඉ. ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 299 | 246 |
| ඊ. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 91 | - |
| උ. තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 44 | 41 |
| ඌ. පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 80 | 65 |

## 9. 2012.12.31 දින වන විට අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ විස්තර

| පීඨය | අධ්‍යයනාංශ | අනුමත සේවක සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / කථිකාචාර්ය (ආධුනික) | උපදේශක | පද්ධති ඉංජිනේරු | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | පීඨාධිපති කාර්යාලය | 2 | - | - | - | - | - | - | - | - | 2 |
| | කෘෂිව්‍යාපාර කළමනාකරණ | 8 | - | 2 | - | 2 | 2 | - | - | 6 | 2 |
| | ජෛව තාක්ෂණ | 8 | - | - | 1 | 3 | 3 | - | - | 7 | 1 |
| | උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | 10 | 1 | 1 | - | 3 | 3 | - | - | 8 | 2 |
| | වැවිලි කළමනාකරණ | 10 | - | 2 | - | 4 | 3 | - | - | 9 | 1 |
| ව්‍යවහාරික විද්‍යා | පීඨාධිපති කාර්යාලය | 1 | - | - | - | - | - | - | - | - | 1 |
| | පරිගණක හා තොරතුරු පද්ධති | 9 | - | - | - | - | 8 | - | - | 8 | 1 |
| | ඉලෙක්ට්‍රොනික විද්‍යා | 8 | 1 | 1 | - | 5 | 1 | - | - | 8 | 0 |
| | කර්මාන්ත කළමනාකරණ | 15 | - | - | - | 6 | 5 | - | - | 11 | 4 |
| | ගණිතමය විද්‍යා | 14 | - | - | - | 3 | 7 | - | - | 10 | 4 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | පීඨාධිපති කාර්යාලය | 1 | - | - | - | - | - | - | - | - | 1 |
| | ගණකාධිකරණ | 11 | - | - | - | 3 | 4 | - | - | 7 | 4 |
| | බැංකු හා මූල්‍ය | 7 | - | - | - | 5 | - | - | - | 5 | 2 |
| | ව්‍යාපාර කළමනාකරණ | 11 | - | - | 1 | 4 | 3 | - | - | 8 | 3 |
| | රක්ෂණ හා තක්සේරුකරණ | 7 | - | - | - | 2 | 2 | - | - | 4 | 3 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | පීඨාධිපති කාර්යාලය | 2 | - | - | - | - | - | - | - | - | 2 |
| | ව්‍යවහාරික පෝෂණ | 9 | - | - | - | 4 | 3 | - | - | 7 | 2 |
| | ජල ජීවිවගා හා මත්ස්‍ය | 8 | 1 | 2 | - | 3 | - | - | - | 6 | 2 |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | 11 | 1 | - | - | 5 | 3 | - | - | 9 | 2 |
| | පශුසම්පත් හා පක්ෂි විද්‍යා | 7 | - | - | - | 3 | 3 | - | - | 6 | 1 |
| ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය | 4 | - | - | - | - | 4 | - | - | 4 | 0 |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – මාකඳුර | 3 | - | - | - | - | - | 1 | - | 1 | 2 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය | 5 | - | - | - | - | 3 | 1 | 1 | 5 | 0 |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර | 6 | - | - | - | - | 2 | 1 | 1 | 4 | 2 |

| ඒකය | අනුමත සේවක සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / කථිකාචාර්ය (ආධුනික) | උපදේශක | පද්ධති ඉංජිනේරු | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශාරීරික අධ්‍යාපන ඒකකය | **3** | **-** | - | - | - | - | 2 | - | 2 | **1** |
| **එකතුව** | **180** | **4** | **8** | **2** | **55** | **59** | **5** | **2** | **135** | **45** |

30%ක් වූ අධ්‍යයන, 2%ක් වූ අධ්‍යයන සහායක, 7%ක් වූ පරිපාලන සහ 61%ක් වූ අනධ්‍යයන වශයෙන් සමන්විත, 440ක් වූ සමස්ත කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කරන ලදි.




**විශ්වවිද්‍යාලයේ 2012 වර්ෂයේ කාර්යය මණ්ඩලය**

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය පිළිවෙලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය 3%ක් ද, මහාචාර්ය 6%ක් ද, සහාය මහාචාර්ය 2%ක් ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 43%ක් ද සහ කථිකාචාර්ය 46%ක් ද වේ.





**2012 වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය**

## 10. 2012.12.31 දින වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර

| පීඨය/අංශය | පරිපාලන කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| උපකුලපති කාර්යාලය | 1 | - | 1 | 1 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 2 | - | 2 | 1 |
| අධ්‍යයන ආයතන අංශය | 1 | - | 4 | 1 |
| අනධ්‍යයන ආයතන අංශය | 1 | - | 4 | 1 |
| සාමාන්‍ය පාලන අංශය | 2 | - | 4 | 6 |
| මූලධන අංශය | - | - | 1 | 1 |
| අධ්‍යයන අංශය | 1 | - | 1 | 1 |
| පොදු සේවා ඒකකය - මාකඳුර පරිශ්‍රය | 2 | - | 2 | 1 |
| අභ්‍යන්තර විගණන අංශය | 1 | - | 3 | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | 1 | - |
| බාහිර සම්බන්ධතා අංශය | - | - | 1 | - |
| ගිණුම් අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 5 | - | 8 | 2 |
| ගිණුම් අංශය - මාකඳුර පරිශ්‍රය | 2 | - | 4 | 2 |
| ගබඩා සහ සැපයුම් අංශය | 1 | - | 4 | 2 |
| ආරක්ෂක අංශය | - | - | 2 | 2 |
| ප්‍රවාහන අංශය | - | - | - | 9 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1 | 4 | 8 | 10 |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2 | 5 | 10 | 17 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1 | 1 | 6 | 6 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 1 | 7 | 10 | 13 |
| විභාග අංශය | 1 | - | 6 | 2 |
| පුස්තකාලය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | - | 6 | 9 |
| පුස්තකාලය - මාකඳුර පරිශ්‍රය | - | - | 4 | 4 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | 1 | 2 | 2 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 2 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | - | - | 1 |

| පීඨය/අංශය | පරිපාලන කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 3 | 1 | 2 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 3 | - | 1 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 1 | - | 1 | 3 |
| සේවක සංවර්ධන මධ්‍යස්ථානය | - | - | 1 | - |
| ශිෂ්‍ය සේවා අංශය | 1 | - | 4 | 1 |
| නඩත්තු අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | 1 | 3 | 21 |
| නඩත්තු අංශය - මාකඳුර පරිශ්‍රය | - | 1 | 1 | 6 |
| නේවාසිකාගාර - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 2 | 2 |
| නේවාසිකාගාර - මාකඳුර පරිශ්‍රය | - | - | 2 | - |
| **එකතුව** | **29** | **26** | **111** | **134** |

අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය (පරිපාලන නිලධාරීන් හැර) අනුපාතිකව කාර්මික 10%ක් ද, ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි 41%ක් ද සහ සුළු සේවක 49% ක් ද වශයෙන් මුළු එකතුව 271කි.



# 11. පුස්තකාලය

## 11.1 පසුබිම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය කොටස් දෙකකින් සමන්විතය. කුලියාපිටිය පරිශ්‍ර කොටස මඟින් ව්‍යවහාරික විද්‍යා පීඨයට සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයට පහසුකම් සපයනු ලබන අතර මාකඳුර පරිශ්‍ර කොටස මඟින් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයට හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයට පහසුකම් සපයනු ලැබේ.

## 11.2 ගොඩනැගිලි

### 11.2.1 *පුස්තකාලය - කුලියාපිටිය*

කුලියාපිටිය පුස්තකාලය පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වම් කොටසේ පිහිටුවා තිබුණි. පරිපාලන කාර්යාලය වෙනත් ස්ථානයකට මාරු කළ පසු එම කොටස ද පුස්තකාලයට එක් කරමින් පුස්තකාලය ප්‍රසාරණය කරන ලදි. දැනට ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය දළ වශයෙන් වර්ග අඩි 7326ක් වන අතර 141 දෙනෙකුට ආසන පහසුකම් ඇත.

### 11.2.2 *පුස්තකාලය - මාකඳුර*

මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය ප්‍රධාන මාවතට සමීපව අනෙකුත් පීඨ දෙකට අතරමැදිව පිහිටා ඇත.  මෙය 2006 ජූලි මස 27 දින විවෘත කළ නව දෙමහල් ගොඩනැගිල්ලක් වන අතර බිම් ප්‍රමාණය වර්ග අඩි 7200කි.

## 11.3 නව ජයග්‍රහණ

- මාකඳුර පුස්තකාල පරිශ්‍රය සඳහා වෙබ් අඩවියක් සකස් කර හඳුන්වා දීම.
- IT උපකරණ මිලදී ගන්නා ලද අතර ප්‍රධාන පුස්තකාලයෙහි 24X7 ප්‍රමාණයක සුරක්ෂිත පිවිසුම් පරිසරයක් පිහිටුවීම.
- මාකඳුර පුස්තකාලයේ AGORA database හරහා e-journals සේවා පහසුකම සැපයීම.
- පුස්තකාලය භාවිතා කරන්නන් සඳහා පුස්තකාල දෙකෙහිම ඡායා පිටපත් සේවයන් ආරම්භ කිරීම.
- පුස්තකාල දෙකෙහිම තොග සත්‍යාපන කටයුතු සිදු කර තිබේ.

## 11.4 පුස්තකාලය නව්‍යකරනය

- ව්‍යාපාර  අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සිසුන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන 2012 මාර්තු 14 වන දින කුලියාපිටිය ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයෙහි ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

- පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා 2012 ජනවාරි 11 වන දිනට නියමිත වු පුස්තකාල හඳුන්වාදීමේ වැඩසටහන නොවැලැක්විය හැකි හේතුන් මත අවලංගු කිරීමට සිදු විය.

**11.5 වැඩමුළු**

- 2012 නොවැම්බර් 22 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා තොරතුරු විඥාපන ආයතනය මගින් පවත්වනු ලැබූ සම්මන්ත්‍රණයේ ආරම්භක සැසිය සඳහා පුස්තකාලයාධිපති, W.G.P. ගම්ලත් මහතා සහභාගි විය.

- Seeping Technology into Library Services පිළිබඳව වූ වැඩමුළුව සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිනි, මහීකාන්ති තුසිතා කුමාරි මහත්මිය 2012 ජුනි 21 වන දින සහභාගී විය. එම තාක්ෂණය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල සඳහා මෑතකදී හඳුන්වාදී ඇත. විසින් මෑතකදී ළඟා කර ගන්නා ලදි.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සේවක සංවර්ධන ඒකකය මඟින් 2012 නොවැම්බර් 16, 30 සහ දෙසැම්බර් 14 යන දිනයන්හි පවත්වනු ලැබූ "වෘත්තීය සංවර්ධනය සඳහා ව්‍යාපෘති කළමණාකරණ ප්‍රතිපත්තීන් භාවිතා කිරීම" පිළිබඳව වූ වැඩමුළුව සඳහා සහකාර ලේඛකාධිකාරි (පුස්තකාල සේවා), B.H.පෙරේරා මහතා සහභාගි විය.

- කොළඹ කාර්මික තාක්ෂණික ආයතනය මඟින් 2012 දෙසැම්බර් 05 වන දින පැවැත් වූ "ඵලදායී තොරතුරු සේවා සඳහා අත්‍යවශ්‍ය දේ" පිළිබඳව වූ වැඩමුළුව සඳහා පුස්තකාල සහායක, (දෙවැනි ශ්‍රේණිය) W.M.A.S.බංඩාර මහතා සහභාගි විය.

**11.6 පොත් සහ වාර සඟරා සඳහා වැය ශීර්ෂය**

*පුස්තකාලය සඳහා වෙන් කිරීම්:*

පොත් සහ වාර සඟරා - මිලියන 6

*වියදම:*

**අ) පුස්තකාලය – කුලියාපිටිය**

| පොත් | වාර සඟරා |
|---|---|
| රු..4,648,038.43 | Rs. 1,625,618.00 |
| පොත් 498 | වාර සඟරා 08 |

**සම්පූර්ණ වියදම - රු. 6,273,656.43**

**ආ) පුස්තකාලය – මාකඳුර**

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 2,813,771.29 | රු. 179,625.14 |
| පොත් 203 | වාර සඟරා 08 + AGORA පරිගණක දත්ත ගබඩාව |

**සම්පූර්ණ වියදම - රු. 2,993,396.43**

## 11.7 පොත් ප්‍රමාණයන්

පුස්තකාලයේ පොත් ලබා ගැනීමේ ලේඛනයට අනුව 2012.12.31 දින වන විට සම්පූර්ණ පොත් සංඛ්‍යාව.

පුස්තකාලය කුලියාපිටිය පරිශ්‍රය - 33797

පුස්තකාලය මාකඳුර පරිශ්‍රය - 16374 (මාකඳුර  පොත් ලබා ගැනීම් ලේඛන අංක 66374 ට අනුව)

වර්ෂය තුළ කුලියාපිටිය පුස්තකාලය සඳහා පොත් 859 අතරින් පොත් 360 ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. එමෙන්ම මාකඳුර පුස්තකාලය සඳහා ලබා ගත් පොත් 648න් 445ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත.

## 11.8 2012.12.31 දිනට පුස්තකාලයේ කාර්යය මණ්ඩලය (අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන)

| පුස්තකාලය | අනුමත සේවක සංඛ්‍යාව | පුස්තකාලයාධිපති | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | සහකාර පුස්තකාලයාධිපති | සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) | පද්ධති විශ්ලේෂක | එකතුව | පුරප්පාඩු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාලය – කුලියාපිටිය පරිශ්‍රය | 5 | 1 | 1 | 1 | 1 | 1 | **5** | **0** |
| පුස්තකාලය – මාකඳුර පරිශ්‍රය | 2 | - | 1 | - | - | - | **1** | **1** |


## 12. උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2012

| විශ්වවිද්‍යාල නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලබාගත් සිසුන් සංඛ්‍යාව | | කුලියට ලබා ගත් නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලබාගත් සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | | පිරිමි | ගැහැණු |
| පණ්ඩුකාභය – කුලියාපිටිය | - | 60 | කාරියවසම් | 150 | - |
| දීඝගාමිණී - කුලියාපිටිය | - | 56 | (1 සහ 2 මහළ) | | |
| ස්වර්ණපාලී - කුලියාපිටිය | 60 | - | අශෝක | - | 40 |
| චිත්‍රාදේවී- කුලියාපිටිය | 60 | - | | | |
| නව කාන්තා නේවාසිකාගාරය - කුලියාපිටිය | - | 100 | | | |
| සපුමල් බණ්ඩාර I සහ II - මාකඳුර | 120 | - | | | |
| බිසෝ බණ්ඩාර I සහ II - මාකඳුර | - | 120 | | | |
| **එකතුව** | **240** | **336** | **එකතුව** | **150** | **40** |


2012 වසරේ දී ශිෂ්‍ය සංඛ්‍යාව පිරිමි 862 සහ ගැහැණු 1251 කි. ඉන් පිරිමි ළමුන් 240ක් සඳහා ද ගැහැණු ළමුන් 336 දෙනෙකු සඳහා ද විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලයේ පළමු වසර හා අවසන් වසර සිසුනට නේවාසිකාගාර පහසුකම් ලබා දෙන අතර ඒ සඳහා ඔවුන්ගේ පදිංචි ස්ථානයේ සිට විශ්වවිද්‍යාලයට ඇති දුර ප්‍රමාණය සලකා බලනු ලබයි.

මෙම වසර තුලදී ද විශ්වවිද්‍යාලය සතුව ඇති නේවාසිකාගාරය ප්‍රමාණවත් නොවන බැවින් බදු පදනම මත පෞද්ගලික අංශයෙන් නේවාසිකාගාර 2ක් ලබා ගෙන පිරිමි සිසුන් 150ක් සඳහා ද ගැහැණු සිසුන් 40ක් සඳහා ද නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත.

**2012 නේවාසිකාගාර පහසුකම් – පිරිමි**




**2012 නේවාසිකාගාර පහසුකම් – කාන්තා**





**12.1 කුලී නේවාසිකාගාර සඳහා වාර්ෂික වියදම**

| **නේවාසිකාගාර (කුලියාපිටිය පරිශ්‍රය)** | **වියදම් වූ මුදල රු.** |
|---|---|
| කාරියවසම් (1 සහ 2 මහළ) | 2,622,000.00 |
| අශෝක | 540,000.00 |
| එකතුව | **3,162,000.00** |

## 13. මහපොළ සහ ශිෂ්‍යාධාර ලාභීන්

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ | 125 | 124 |
| ව්‍යවහාරික විද්‍යා | 77 | 167 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 493 | 354 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 192 | 116 |
| **එකතුව** | **887** | **761** |

2012 වසරේදී විශ්වවිද්‍යාලයේ 2113ක් වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 887ක් මහපොළ ලාභීන් වූ අතර 761ක් සිසුන් ශිෂ්‍යාධාර ලාභීන් වූහ. එනම් 42% ක් සහ 36%ක් වශයෙනි.




**ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්ව ලැබීම් - 2012**

# 14. පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන

## 14.1 කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 86 | - | 78 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 14 | - | 12 |
| ඈ. පොත් සංඛ්‍යාව | 04 | - | 01 |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 21 | - | 13 |
| ඊ. අනෙකුත් | 07 | - | - |
| **එකතුව** | **132** | **-** | **104** |

## 14.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 25 | - | 12 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 02 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 03 | - | - |
| ඊ. අනෙකුත් | 02 | - | - |
| **එකතුව** | **32** | **-** | **12** |

**14.3** **ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 06 | - | 03 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 02 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 05 | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 07 | - | 03 |
| ඊ. අනෙකුත් | - | - | - |
| **එකතුව** | **20** | **-** | **06** |

**14.4** **පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 33 | - | 24 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | 02 | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 05 | - | 03 |
| ඈ. පොත් සංඛ්‍යාව | 03 | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 16 | - | 03 |
| ඊ. අනෙකුත් | 10 | - | 08 |
| **එකතුව** | **69** | **-** | **38** |

## 15. 2012 වසරේදී අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි

### 15.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| විෂය | 2012.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2012 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 18 | - | 01 |
| දර්ශනපති | 01 | - | - |
| විද්‍යාපති | 03 | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **22** | | **01** |

### 15.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | 2012.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2012 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනශූරී/D.Sc./D.Eng. | 11 | - | 01 |
| දර්ශනපති | 01 | - | - |
| විද්‍යාපති | 11 | 01 | - |
| ව්‍යාපාර පරිපාලනපති | 05 | - | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **28** | **01** | **01** |

**15.3** වයාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | 2012.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2012 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 02 | - | 01 |
| දර්ශනපති | - | - | - |
| M.Com./විද්‍යාපති/M.S. | 09 | - | - |
| ව්‍යාපාර පරිපාලනපති | 06 | - | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 01 | - | - |
| **එකතුව** | **18** | **-** | **01** |

**15.4** පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | 2012.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | 2012 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරී | 14 | - | - |
| දර්ශනපති | 03 | - | - |
| විද්‍යාපති | 04 | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **21** | **-** | **-** |

# 16. ලැබී ඇති ප්‍රදානයන් පිළිබඳ විස්තර

## 16.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | 04 | 02 | - |
| ආ. ජාතික ප්‍රදාන | - | - | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | 02 | 02 | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | 06 | 03 | - |

*ජාත්‍යන්තර ප්‍රදාන*

**ආචාර්ය එන් එස් කෝට්ටේආරච්චි** - පොදුරාජ්‍ය මණ්ඩල ශාස්ත්‍රීය අධිශිෂ්‍යත්ව ප්‍රදානය, බැන්ගර් විශ්වවිද්‍යාලය, එක්සත් රාජ්‍යය

**එච් එම් එල් කේ හේරත් මහතා** - IBC 2012 ප්‍රධානය, කෝබේ, ජාත්‍යන්තර ජෛවමිතික සංගමය විසින් ප්‍රදානය කර ඇත.

*දේශීය ප්‍රදාන*

**එච් එම් එල් කේ හේරත් මහතා**

- ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යානය සඳහා විශිෂ්ඨ ප්‍රදානය : 2012 නොවැම්බර් මස 15 සහ 16, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 24 වන වාර්ෂික සම්මේලනය
- ශිෂ්‍ය ඉදිරිපත් කරන්නන් අතරින් පළමු අනුශූරතාවය : 2012 නොවැම්බර් 15 - 16, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

**ජේ එම් එම් උඩුගම මිය**

විශිෂ්ට ඉදිරිපත් කිරීම : ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, සේවක සංවර්ධන ඒකකය මගින් පවත් වල ලද සේවක සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (5 වන කණ්ඩායම 2011) (ප්‍රදානය කළ දිනය 2012 අප්‍රේල් 04)

- විශිෂ්ට ඉදිරිපත් කිරීම සඳහා සහතිකය : ශ්‍රී ලංකා විද්‍යා හා පර්යේෂණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ YSF (Young Scientists Forum) විසින් සංවිධානය කරන ලද "YSF 2011 සම්මන්ත්‍රණය"

## 16.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | 02 | 02 | - |
| ආ. ජාතික ප්‍රදාන | - | - | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | - | - | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | 02 | 02 | - |

*දේශීය ප්‍රදාන*

**එන් ඒ ඩී එන් නාපාගොඩ මිය** - ව්‍යවහාරික සංඛ්‍යාන ආයතනය, විශිෂ්ඨ පශ්චාත් පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රන් පදක්කම

**පී ඒ ඩී ඒ එන් අප්පුහාමි මහත්මිය** - විශිෂ්ඨ ඉදිරිපත් කිරීම සඳහා රන් පදක්කම උපාධි ප්‍රදාන උත්සවයේදී පිරිනමන ලදි. (ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති)

**16.3 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | 03 | 03 | - |
| ආ. ජාතික ප්‍රදාන | 03 | | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | 01 | 01 | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | 07 | 03 | - |

*ජාත්‍යන්තර ප්‍රදාන*

**ආචාර්ය පී ඒ ගමික මහතා** - 2012 පෙබරවාරි 4 සිට 7 දක්වා ඉරාන ජනරජයේ ටෙහෙරාන් නුවරදී පවත්වන ලද 4 වන ප්‍රාදේශීය නවෝත්පාදන සහ නවනිපැයුම් ප්‍රදර්ශනය - 2012 දී ප්‍රදානය කරන ලදි.

*දේශීය හා ජාතික ප්‍රදාන*

**ආචාර්ය පී ඒ ගමික මහතා**

- සනීපාරක්ෂක විධික්‍රම යටතේ 3 වන ස්ථානය - ශ්‍රී ලංකා නිමැවුම්කරුවන්ගේ කොමිසම, පර්යේෂණ සහ තාක්ෂණ අමාත්‍යංශය විසින් 2012 නොවැම්බර් 04 වන දින සිට 06 වන දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සංවිධානය කරනු ලැබූ සහසක් නිමැවුම් ප්‍රදර්ශනය.

- ආනයන ආදේශක යටතේ 2 වන ස්ථානය - ශ්‍රී ලංකා නිමැවුම්කරුවන්ගේ කොමිසම සහ පර්යේෂණ සහ තාක්ෂණ අමාත්‍යංශය විසින් 2012 නොවැම්බර් 04 වන දින සිට 06 වන දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සංවිධානය කරනු ලැබූ සහසක් නිමැවුම් ප්‍රදර්ශනය.

- ශ්‍රී ලංකා නිමැවුම්කරුවන්ගේ කොමිසම, පර්යේෂණ සහ තාක්ෂණ අමාත්‍යංශය මඟින් 2012 දී පිරිනැමූ නව නිපැයුම් වාණිජ්‍යකරණය සඳහා වූ ප්‍රදානය.

- විශිෂ්ඨ පෝස්ටර් ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ වාර්ෂික ශාස්ත්‍රීය විද්‍යාත්මක සැසිය, 2012 මැයි 11.

**තක්ෂිලා අදිකාරි මහත්මිය** - HETC ව්‍යාපෘතියේ HRD වැඩසටහන යටතේ පශ්චාත් උපාධිය සඳහා ශිෂ්‍යත්වයක් ලැබීම.

**ආර්.එල්.ඩී. කුමාරි මල්කාන්ති මිය** - පශ්චාත් උපාධි සමීක්ෂණ ප්‍රදානය 2012 (commendation award) by Sri Lanka Association for the Advancement of Science (SLASS) for the contribution towards the postgraduate research M.Phil carried out in Sri Lanka. The research was based on *"**Development of household food security index to assess household food and nutrition security in rural subsistence paddy farming households in Sri Lanka**"*

# 17. ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### 17.1 කාර්යය මණ්ඩල ව්‍යුහය

2011/2012 වර්ෂය තුළදී ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සුදුසුකම් ලත් බාහිර උපදේශකවරුන් 10 දෙනෙකු බඳවා ගන්නා ලද අතර, පහත සඳහන් ක්‍රීඩා පුහුණු කිරීමට ඔවුන්ගේ උපරිම දායකත්වය ලැබීය.

| ක්‍රීඩාව | බාහිර උපදේශකවරයාගේ නම | අදාළ ක්‍රීඩාව සඳහා සුදුසුකම් |
|---|---|---|
| බැඩ්මින්ටන් | කේ.ඩබ්ලිව්.එස්.ප්‍රනාන්දු මහතා | කොට්ඨාස පුහුණුකරු - වෙන්නප්පුව |
| පැසිපන්දු | ආර්. ඩී. නානායක්කාර මහතා | වයඹ පළාත් පැසිපන්දු කණ්ඩායම් පුහුණුකරු |
| කැරම් | එම්. ෂෙරිෆඩීන් මහතා | 2010 SAARC සංසදයේ සාමාජිකත්වය |
| චෙස් | ජේ.එම්.සී.බී. රත්ගල්ල මහතා | විශ්වවිද්‍යාල කණ්ඩායමේ හිටපු ක්‍රීඩක සහ විශ්වවිද්‍යාලයේ වර්ණ ප්‍රදානයේ ජයග්‍රාහකයා |
| එල්ලේ | ජී. විමලසිරි මහතා | වයඹ පළාත් විශිෂ්ඨ ජාතික ක්‍රීඩකයා |
| හොකි | ඩබ්ලිව්.එස්.එම්.ඩී. බොතේජු | ශ්‍රී ලංකා ගුවන් සේවා හොකි කණ්ඩායමේ සමාජිකත්වය |
| රගර් | බී.එම්.බී.ඩී. බණ්ඩාර මහතා | සුදුසුකම්ලත් දෙවන තලයේ රග්බි පුහුණුකරු |
| පිහිනුම් | එන්.එම්.ජේ.කේ. නවරත්න මහතා | පිහිනුම් පුහුණුකරු – ශිල්ප ශාලිකා |
| මේස පන්දු | ටී.එම්.කේ.පී.බී. තෙන්නකෝන් මහතා | පාසල් පුහුණුකරු |
| බර එසවීම | එස්.එම්.ආර්.ගුණතිලක මහතා | ජාතික සහකාර පුහුණුකරු |

### 17.2 පළමුවැනි SLUSA වර්ණ ප්‍රධානෝත්සවය

පළමුවැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ ප්‍රධාන උත්සවය 2012 ජනවාරි 19 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විය. අදාළ ක්‍රීඩා ඉසව් සඳහා දක්ෂතාවය දක්වමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 17 දෙනෙක් ක්‍රීඩා ඉසව් 10 කට පිදුම් ලැබූහ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රිඩා සමාජය සහ උසස් අධ්‍යාපන ඇමති විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ එස්.බී. දිසානායක මැතිතුමාය. හිටපු සහ වර්තමාන නිලධාරින් කිහිපදෙනෙක් සහ ක්‍රීඩකයින් පිරිසක් මෙම වටිනා අවස්ථාවට සහභාගි වූහ.

**ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ ජයග්‍රහකයන් 2011**

**පිරිමි**

01. සී.එල්.පී. අප්පුහාමි ( 104009) – අත්පන්දු

02. බී.ඩබ්.එම්.ඒ.එස්.බී. වීරසූරිය. (088066) – පාපන්දු

03. ඩබ්.ඒ.පි.ඩී.ඩී. පතිරණ (094138) – පාපන්දු

04. ඩබ්.එස්.බී. දිසානායක (082130) – බර එසවීම

05. එච්.ආර්. කරුණාරත්න (086026) – එල්ලේ

06. ඩි.ආර්.සි.පි. ජයවර්ධන (074062) – කැරම්

07. එම්.එම්.ජේ.ඩී. රෙපිනෝල්ඩ් (104166) – කැරම්

08. කේ.එන්. මධුෂංක (082133) – කැරම්

09. ආර්.ඒ.ඒ. ප්‍රියන්ත (094220) – මල්ලව පොරය

10. එස්.ඒ.එම්.ඒ.එම්. සීලරත්න (094175) – ක්‍රිකට්

11. එම්.ඩී.එස්. ජයසේකර (084064) - ක්‍රිකට්

12. ඩී.එම්.ඊ.පී.බී. දසනායක (102013) - බේස් බෝල්

13. එම්.සී.පී.එම්. ප්‍රේමතිලක (082143) – රගර්

**කාන්තා**

01. ඒ.ඒ.ආර්. සිෆායා (074143) - බේස් බෝල්

02. ජේ.එස්.එම්. මදනායක (096029) – එල්ලේ

03. එස්.ඒ.එම්.ආර්.ටී. අබේසේකර (096002) – කැරම්

04. ටී.බී.ටී. බුද්ධිමා (104288) - අත්පන්දු

**17.3 වාර්ෂික වැඩසටහන් සහ ජයග්‍රහන**


***17.3.1 අන්තර් පීඨ නවක සිසුන්ගේ ශූරතාව – 2012***

අලුත් කණ්ඩායමක සිටින තරුණ පිරිස අලුත් පරිශ්‍රයකට පියවරක් තබන විට ඔවුන්ව ක්‍රීඩා කටයුතු සඳහා සහභාගි කර ගැනීමට නවෝත්පාදන විසඳුම් අවශ්‍ය විය. මෙම අවශ්‍යතාවය තේරුම් ගැනීමෙන් අනතුරුව නවක සිසුන්ව විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතුවලට දිරිමත් කිරීම සඳහා ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව අන්තර් පීඨ නවක ශූරතාවය සංවිධානය කරනු ලබයි.

මෙම වර්ෂයේද දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා අංග 18ක් ඇතුලත් කරමින් අන්තර් පීඨ නවක ශූරතාවය සංවිධානය කරනු ලැබීය.

01. බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා)
02. පැසිපන්දු (පිරිමි/කාන්තා)
03. ක්‍රිකට්
04. අත්පන්දු (පිරිමි/කාන්තා)
05. පාපන්දු
06.කැරම් (පිරිමි/කාන්තා)
07. දැල්පන්දු
08. බර එසවීම
09.එල්ලේ (පිරිමි/කාන්තා)
10. චෙස් (පිරිමි/කාන්තා)
11. මේසපන්දු (පිරිමි/කාන්තා)

මෙය 2012 ජනවාරි 04 සිට 14 වන දින දක්වා කුලියාපිටිය සහ මාකඳුර විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී මෙම ක්‍රීඩා තරග පැවැත්විය.





### 17.3.2 අන්තර් පීඨ ශූරතාව -*2012*

අන්තර් පීඨ ශූරතාව 2012 පෙබරවාරි 10 සිට පෙබරවාරි 20 දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදි සහ ශිල්ප ශාලිකා ක්‍රීඩා සංකීර්ණයේදි පැවැත්විණි. පිහිනීම්, ජවන සහ පිටියේ ක්‍රීඩා ඇතුලත්ව ක්‍රීඩා අංග 23ක් පැවැත්විණි.


**අන්තර් පීඨ සහභාගිත්වය**

| 2012 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ (APM) | ව්‍යවහාරික විද්‍යා (AS) | ව්‍යාපාර අධ්‍යනය සහ මූල්‍ය (BSF) | පශු සම්පත්, ධීවර හා පෝෂණ (LFN) | |
| පිරිමි | 46 | 64 | 53 | 51 | 214 |
| ගැහැණු | 35 | 31 | 43 | 40 | 149 |
| එකතුව | 81 | 95 | 96 | 91 | 363 |
| ලියාපදිංචි වූ ප්‍රමාණය 2012 | 382 | 375 | 1042 | 314 | 2113 |
| සහභාගි වූ ප්‍රතිශතය | 21% | 25% | 9% | 29% | 17% |




අන්තර් පීඨ ශූරතාවලිය සඳහා සිසුන්ගේ සහභාගි වීමේ ප්‍රතිශතය ක්‍රීඩා කටයුතුවලට සහභාගි වී සිටින විශ්වවිද්‍යාලයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් කොපමණදැයි ඉදිරිපත් කරයි. සංසන්දනය කිරීමේදි මෙම අගය ඉතා අඩු මට්ටමක පවතී.

2012 අන්තර් පීඨ ශූරතාවලියේ අවසන් ප්‍රතිඵල පහත පරිදි වේ.




### *17.3.3 අන්තර් විශ්වවිද්‍යාලයීය තරඟාවලිය -2012*

36 වැනි අන්තර් විශ්වවිද්‍යාලයීය තරඟාවලිය 2012 මැයි 01 වන දින සිට සැප්තැම්බර් 30 වන දින දක්වා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කෙරිණි.

විවිධ විශ්වවිද්‍යාල පරිශ්‍රයන් තුළ ක්‍රීඩා අංග 34ක් සංවිධානය කෙරුණ අතර අන්තර් විශ්වවිද්‍යාල මල්ලවපොර තරඟාවලිය සංවිධානය කිරීම සඳහා වයඹ විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව පුරෝගාමී විය. එය 2012 සැප්තැම්බර් මස 23 වන දින කුලියාපිටිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී පැවැත්විණි. මේ සඳහා විශ්වවිද්‍යාල 9ක් සහභාගි වූ අතර අපගේ විශ්වවිද්‍යාලය හතරවැනි ස්ථානය දිනා ගත්හ.

*2012 අන්තර් විශ්වවිද්‍යාලයීය තරගාවලියේ ජයග්‍රහණ*

සමස්ථ ජයග්‍රහණ : විශ්වවිද්‍යාල 14 ක් අතරින් 8 වෙනි ස්ථානය දිනා ගැනීම සහ ක්‍රීඩා ඉසව් 30 කට සහභාගි වීම.

***තනි ඉසව්***

| නම | ක්‍රීඩාව | ලැබූ ස්ථානය |
|---|---|---|
| ආර්.ඒ.ඒ. ප්‍රියන්ත | මල්ලව පොර 55 Kg | ශූරතාවය |
| බී.ඒ.එස්.ඒ. තිලකරත්න | බර ඉසිලීම 56 Kg | පළමු අනුශූරතාවය |
| ඩබ්.බී.එම්. වීරසේකර | බර ඉසිලීම 56 Kg | පළමු අනුශූරතාවය |
| එස්.ඒ.ඩී.එස්.ආර්. ප්‍රියාන් | මල්ලව පොර 96 Kg | පළමු අනුශූරතාවය |
| අයි.ජී.ජී.කේ. ගමගේ | ධවන සහ පිටිය - දුර පැනීම | පළමු අනුශූරතාවය |
| ජී.සී.එම්. රණසිංහ | ධවන සහ පිටිය - රිටි පැනීම | පළමු අනුශූරතාවය |
| ජී.සී.එම්. රණසිංහ | ධවන සහ පිටිය - 200 m | දෙවන අනුශූරතාවය |
| ඒ.එස්.කේ. නදීශානි | කරාටේ | දෙවන අනුශූරතාවය |
| ඩබ්.එම්.අයි.යූ.කේ. විජේසිංහ | කරාටේ | දෙවන අනුශූරතාවය |

***කණ්ඩායම් තරග***

| *ක්‍රීඩාව* | *ලැබූ ස්ථානය* |
|---|---|
| කැරම් (ගැහැණු) | අනුශූරතාවය |
| චෙස් (පිරිමි) | තුන්වන ස්ථානය |

තරග 20කට සහභාගී වී කණ්ඩායම් 10 ක් අර්ධ අවසාන තරග සඳහා සුදුසුකම් ලැබූහ.


1. බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා) 2. කැරම් (පිරිමි/කාන්තා) 3. චෙස් (පිරිමි)
4. ක්‍රිකට් (පිරිමි) 5.පාපන්දු (පිරිමි) 6.මේස පන්දු (කාන්තා)
7.දැල් පන්දු (කාන්තා) 8.මල්ලව පොර (පිරිමි)

**අන්තර් විශ්වවිද්‍යාලයීය සහභාගීත්වය**

| 2012 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන | ව්‍යවහාරික විද්‍යා | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | පශුසම්පත්, ධීවර හා පෝෂණ | |
| පිරිමි | 20 | 64 | 59 | 18 | 161 |
| ගැහැණු | 15 | 36 | 33 | 6 | 90 |
| එකතුව | 35 | 100 | 92 | 24 | 251 |
| ලියාපදිංචි වූ ප්‍රමාණය 2012 | 382 | 375 | 1042 | 314 | 2113 |
| සහභාගි වූ ප්‍රතිශතය | 9% | 27% | 9% | 8% | 12% |

ව්‍යවහාරික විද්‍යා පීඨය , 27% ක් වූ ඉහළම සහභාගිත්ව ප්‍රතිශතයක් පෙන්වූ අතර අනෙකුත් පීඨ තුනෙහිම අඩු අගයන් පෙන්වූහ.

2011 වර්ෂය සමඟ සංසන්ධනය කරන විට, 2012 වර්ෂයේදී ව්‍යවහාරික විද්‍යා පීඨය සහ ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය පීඨය යන පීඨ දෙකෙහිම සහභාගිත්ව ප්‍රතිශතය වර්ධනය වී ඇත. නමුත් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ සිසුන්ගේ සහභාගිත්වය අඩු අගයන් ගනී.




2011 වර්ෂය සමග සැසඳීමේදී, 2012 වර්ෂයේ ශිෂ්‍ය සහභාගිත්ව ප්‍රතිශතය 11.7% සිට 11.9% දක්වා සුළු වැඩි වීමක් පෙන්නුම් කරයි.

**17.4 අනෙකුත් තරග**

## 17.4.1 T-20 Red bull ක්‍රිකට් ශූරතාවලිය

Another exuberant period was kicked – off in the University Cricketing Area. 2012 දෙසැම්බර් මාසයෙන් පටන් ගෙන සති 7ක් මුළුල්ලේ, විශ්වවිද්‍යාල කණ්ඩායම් 14ක් 2013 **Red bull** ක්‍රිකට් තරගාවලිය සඳහා දේශීය වශයෙන් සුදුසුකම් ලැබීමට තරග වැදුනෝය. මෙම වටිනා තරගය IPL වැනි වාතාවරණයක සූදානම් කර තිබුණි.

මෙම තරගාවලියෙහි තරග කිහිපයක්ම 2012 දෙසැම්බර් 22 වන දින සිට 24 වන දින දක්වා තෙදිනක් පුරාවටම මාකඳුර පරිශ්‍රයේදී සංවිධානය කෙරුණි.

අපේ විශ්වවිද්‍යාලයේ "Wayamba Heroes" ක්‍රිකට් කණ්ඩායම අර්ධ අවසාන වටයට තේරී පත් වූයේ විශ්වවිද්‍යාල 10ක් අභිබවමිනි. "SJP King", "Pera Lions", "Mora Sharks" සහ "Wayamba Heroes" යන කණ්ඩායම් අවසාන තරගයට තරග වැදීමට සූදානමින් සිටි. මෙම තරගයෙන් ජය ලබා ගන්නා ශූරයින්හට, ඉන්දියාවේදී පැවැත්වීමට නියමිත ලෝක අවසාන - "Red Bull විශ්වවිද්‍යාල ක්‍රිකට් තරගාවලිය 2013" සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමේ මහඟු අවස්ථාව හිමි වේ.

**17.4.2 ජාත්‍යන්තර තරගාවලි**

**හත්වන වාර්ෂික UiTM ක්‍රීඩා උත්සවය, 2012 ,මැලේසියාව**

2012 වාර්ෂික UiTM ක්‍රීඩා උත්සවය 2012 සැප්තැම්බර් 06 වන දින සිට 09 වන දින දක්වා, මැලේසියාවේ UiTM විශ්වවිද්‍යාලය විසින් සෙලන්ග(ර්) (Selangor) හිදී පැවැත්විය.
අපේ විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 20 දෙනෙක් , බැඩ්මින්ටන්, රග්බි යන ක්‍රීඩාවන්ට සහභාගි වූහ. රටවල් 7ක් නියෝජනය කරමින් විශ්වවිද්‍යාල 24ක තරගකරුවන් මෙයට සහභාගි වූහ.

අපේ තරගකරුවන්ට කිසිම ක්‍රීඩාවක් ජයගත නොහැකි වූ නමුත් , ඔවුන් ඔවුන්ගේ උපරිම උත්සහයන් පෙන්වූහ. ඉහළ දක්ෂතා , උපාය මාර්ග සහ ජාත්‍යන්තර අත්දැකීම් ග්‍රහණය කර ගැනීම අපේ ක්‍රීඩකයින් හට බෙහෙවින් අවශ්‍ය බව ඉතා පැහැදිලිය.

### 17.4.3 ජාතික සහ විශ්වවිද්‍යාල තරඟාවලි

අපේ සිසුන් ,ඔවුන්ගේ අත්දැකීම් සහ හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා පහත සඳහන් බාහිර තරඟාවලි සඳහා සහභාගි වූහ.

- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ UiTM බැඩ්මින්ටන් තරඟාවලිය - 2012
- ශ්‍රී ලංකා
- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් පවත්වනු ලැබූ දොළොස් වැනි සහ දහතුන් වැනි ජනාධිපති කුසලාන කැරම් තරඟාවලිය - 2012
- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් සංවිධානය කළ හතලිස් හතර වැනි ජාතික කැරම් තරඟාවලිය - 2012 සහ ලංකා ප්ලේට් කැරම් තරඟාවලිය - 2012
- කුරුණෑගල දිස්ත්‍රික්ක ක්‍රිකට් සංගමය විසින් පවත්වනු ලැබූ කොට්ඨාශ 111 ක්‍රිකට් තරඟාවලිය - 2012. තරඟ කිහිපයක්ම අප විශ්වවිද්‍යාල පරිශ්‍රයේදිද සංවිධානය කෙරිණි.
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora Six a Side ක්‍රිකට් තරඟාවලිය - 2012
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora Soccer පාපන්දු ශූරතාවලිය - 2012
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Pera Sixes හොකි තරඟාවලිය - 2012
- කොළඹ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ UOC Hockey Sevens තරඟාවලිය - 2012
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ දොළොස් වැනි Mora Sevens රග්බි තරඟාවලිය - 2012
- ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය විසින් පවත්වනු ලැබූ සි කොට්ඨාශ රග්බි තරඟාවලිය - 2012
- ශිල්ප ශාලිකා පිහිණුම් සමාජය විසින් සංවිධානය කළ ශිල්ප ශාලිකා පිහිණුම් ශූරතාවලිය
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora Smashes 2012 මේස පන්දු තරඟාවලිය
- ජාතික තරුණ ක්‍රීඩා උත්සවය - 2012 පළාත් මළල ක්‍රීඩෝත්සවය
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ ගැමුණු රත්නායක අනුස්මරණ අත්පන්දු ශූරතාවලිය
- ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය විසින් පවත්වනු ලැබූ ශ්‍රී ලංකා අන්තර් බර ඉසිලීමේ ශූරතාවලිය 2012 සහ ශ්‍රී ලංකා ආධුනික බර ඉසිලීමේ ශූරතාවලිය 2012
- වයඹ පළාත් ක්‍රීඩා අමාත්‍යංශය විසින් සංවිධානය කළ දිස්ත්‍රික් මල්ලවපොර ශූරතාවලිය

### 17.4.4 තරඟවලින් ලැබූ ජයග්‍රහණ

- ශ්‍රී ලංකා අන්තර් බර ඉසිලීමේ ශූරතාවලිය 2012
  56 කාණ්ඩය
  බී.එ්.එස්.ඒ.තිලකරත්න
  ආර්.එ්.ඒ.ප්‍රියන්ත - විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය ලබා ගැනීම

- ජාතික ක්‍රීඩා උත්සවය 2012
  56 කාණ්ඩය
  ආර්.එ්.ඒ.ප්‍රියන්ත

- Mora Smashes 2012 මේස පන්දු තරඟාවලිය

  කණ්ඩායම් තරඟ
  මේස පන්දු - කාන්තා

  තනි තරඟ
  ඩබ්.වී.ටී.මධුෂානි

### 17.5 විශේෂ වැඩසටහන්

සෞඛ්‍ය සම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සමාජයට බිහි කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් දායකත්වය දක්වනු ලබයි. ඒ අනුව, සිසුන් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා පුළුල් වැඩසටහන් කිහිපයක්ම සංවිධානය කරන ලදි.

#### 17.5.1 හඳුන්වාදීමේ වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි අභිප්‍රාය, දැක්ම සහ පරමාර්ථය, ශාරීරික අධ්‍යාපන කටයුතු වලට සම්බන්ධ වීමට ඇති හැකියාව සහ එහි අනාගත වාසි, විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කටයුතු වලට සම්බන්ධ වීමේ ප්‍රවණතාවයන් පිළිබඳව තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා නවක සිසුන් වෙනුවෙන් හඳුන්වාදීමේ වැඩසටහන පවත්වනු ලැබීය.

#### 17.5.2 ඇරෝබික් ව්‍යායාම වැඩසටහන සහ ශාරීරික යෝග්‍යතා වැඩසටහන

සෞඛ්‍ය සම්පන්න සේවකයින්, සෞඛ්‍ය පිරිහුණු සේවකයින්ට වඩා තුන් ගුණයක් ඵලදායි බව පරීක්ෂණ තුළින් පෙන්වා දෙයි.
"" සෞඛ්‍ය සම්පන්න සේවකයින්ගේ නිවාඩු සහ සෞඛ්‍ය පිරිහුණු සේවකයින්ගේ නිවාඩු සංසන්දනය කර බලන විට සෞඛ්‍ය සම්පන්න සේවකයින්ගේ නිවාඩු 02කට සෞඛ්‍ය පිරිහුණු සේවකයින් ලෙඩ නිවාඩු 1ක් ලබා ගනී.ැකියා ස්ථාන තුළ සෞඛ්‍ය පිළිබඳව වැඩසටහන් පැවැත්වීම මඟින් ලෙඩ නිවාඩු 30% කින් අඩු කර ගත හැකි බවත්, එමෙන්ම ඵලදායිතාවය 53%කින් වැඩි කර ගත හැකි බවත්, ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් කළ පරීක්ෂණ තුළින් පෙන්වා දෙයි.

දෙපාර්තමේන්තුව විසින් මෙම ඇරෝබික් ව්‍යායාම වැඩසටහන ආරම්භ කරනු ලැබුවේ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා කාර්ය මණ්ඩලය දිරිමත් කිරීමට සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම වෙනුවෙන් ක්‍රීඩාවට උනන්දු සංස්කෘතියක් ළඟා කර ගැනිම යන පරමාර්ථ දෙක මතය. මෙම අවස්ථාව සඳහා සිසුන් සහ කාර්ය මණ්ඩලය යන දෙපාර්ශවයම සහභාගි වුහ. වර්ෂය පුරාවටම සෑම ක්‍රීඩකයෙකුම ශාරීරික යෝග්‍යතාව ඉහළ මට්ටමක පවත්වාගත යුතුය. එම නිසා විශ්වවිද්‍යාල ක්‍රීඩකයින් සඳහා අතිරේක ශාරීරික යෝග්‍යතා වැඩසටහනක් ආරම්භ කරන ලදි.

### 17.6 2012 වසරේ ප්‍රධාන සිදුවීම්

#### 17.6.1 විශ්වවිද්‍යාල ක්‍රීඩාංගනයේ දියුණුව

2012 දෙසැම්බර් 01 වන දින කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ක්‍රීඩාංගන දියුණුවෙහි මූලික පියවරක් සනිටුහන් කරන ලදි. වසර ගණනක් මුළුල්ලේම මෙය විශ්වවිද්‍යාලයට මහත් වූ අවශ්‍යතාවයක් වී තිබුණි. පළමු අදියරේදි, ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 50ක මුදලක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් "ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීම" යටතේ වෙන් කර ඇත.

මෙම නව පහසුකම් ඉදිකිරීම සඳහා මාස 06ක පමණ කාලයක් ගත වන අතර 2013 අප්‍රේල් මස තුළ එහි කටයුතු අවසන් කිරීමට නියමිතය. පළමු අදියරේදි, ක්‍රීඩාගාර පහසුකම් වල කඩිනම් දියුණුවක් සහ සාමාන්‍ය ක්‍රිකට් පිටියක් සහ ක්‍රීඩා මහලක් ඉදිකිරීම යන කාර්යයන් හට මුල් තැන ලබා දෙයි. ක්‍රීඩා කටයුතු පැවැත්වීමට පමණක් නොව විශ්වවිද්‍යාලයේ සිදුවන සංස්කෘතික කටයුතුද පැවැත්විය හැකි වන පරිදි, පහසුකම් විශාල ප්‍රමාණයකින් යුත් ක්‍රීඩාගාරයක් ඉදි කෙරේ.

### 17.6.2 දෙපාර්තමේන්තුව නව ස්ථානයක ස්ථානගත කිරීම

ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 2012 දෙසැම්බර් මස 08 වන දින කුලියාපිටිය පරිශ්‍රයේ නව ස්ථානයක ස්ථානගත කරනු ලැබීය. මෙම අවස්ථාව සඳහා සරල ආගමික උත්සවයක් සංවිධානය කෙරිණි. මෙමඟින් කාර්ය මණ්ඩලය සහ සිසුන් යන දෙපාර්ශවයටම පහසුකම් සැපයේ.

### 17.7 යෝජනා

**යහපත් අනාගතයක් සඳහා පහත කරුණු සළකා බැලීම සුදුසු වේ.**

1) අලුත් ක්‍රීඩා වලින් සමන්විත වූ සහ සියලු පහසුකම් සහිත ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ආරම්භ කිරීම.

2) එකම කාලයක් තුළ සියලුම අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම.

3) සිසුන් ප.ව. 4.30න් පසු අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම.

4) අනෙකුත් කාර්යය මණ්ඩලයට ද සිසුන් ක්‍රීඩාව සඳහා දිරිගැන්වීමට හැකි නම් එය ක්‍රීඩා අංශයට මහගු සහයෝගයකි.

5) සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා විශ්වවිද්‍යාලය නියෝජනය කරන විට දී අධ්‍යයන කටයුතුවලට සහනයක් ලබා දීම.

# 18. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි 03 දින ස්ථාපිත කරන ලදි. විශ්වවිද්‍යාල සිසුන් හා රැකියා උත්පාදකයින් අතර සම්බන්ධය වඩා ශක්තිමත් කිරීම, සිසුන්ගේ නිපුනතා දියුණු කිරීම හා විශ්ව විද්‍යාල සිසුන්ගේ වෘත්තීයමය හැකියාවන්වල ගුණත්වභාවය වැඩි දියුණු කිරීම මෙහි අරමුණවේ. මෙම ඒකකය සෘජුවම උපකුලපතිවරයාගේ අධීක්‍ෂණයට යටත් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මෙම ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා පහසුකම් සපයනු ලැබේ.

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මඟින් සිසුන්ට තම ඉලක්ක වෙතට අධ්‍යාපනය සාර්ථක ලෙස රැගෙන යාම සඳහා සහයෝගය දෙනු ලැබේ. මෙම ඒකකය මඟින් සෘජු සේවා, අධ්‍යාපනික වැඩ සටහන් සහ සම්පත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉතා හොඳ සමබරතාවයක් පවත්වනු ලැබේ.

- ප්‍රයෝජනවත් රැකියාවක් ලබා ගැනීමේ හැකියාව
- සේවාවන් පුහුණුවීමට අස්ථාව ලබා ගැනීම
- සිසුන්ගේ ජීවන අරමුණු හා බද්ධ වූ අතිරේක දැනුමක් ලබා ගැනීම

පුද්ගල පෞර්ෂ සංවර්ධනය මඟින් ඔවුන්ට ජගත් තලයේ තම රදා පැවැත්ම තහවුරු වීමට අදාල ක්ෂේත්‍ර නිපුනතා සම්බන්ධයෙන් වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ වෙනත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධ වැඩ සටහන් සඳහා සිසුන් තෝරා සහභාගී කරගෙන ඇත. සමාගම් මෙම උපාධි අපේක්ෂකයින් තෝරාගෙන ඇත්තේ පෞද්ගලික සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

මෙම ඒකකය මඟින් 2012 වර්ෂය තුළ මෙහෙයවන ලද වැඩසටහන් 18.1 වගුවේ දක්වා ඇත.

**18.1 2012 වසර තුළ මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්**

| වැඩසටහන් | අපේක්ෂිත කණ්ඩායම |
|---|---|
| "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" | මාකඳුර පරිශ්‍රයේ පළමු, දෙවන සහ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් |
| "තේ රස හඳුනාගැනීමේ" වැඩමුළුව | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ, තෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| "JA/YESL ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන | මාකඳුර පරිශ්‍රයේ පළමු, දෙවන සහ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් |
| "ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම" වැඩමුළුව | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| "ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම - 02" වැඩමුළුව | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් |

| | |
|---|---|
| කවිතා කුසලතා වැඩසටහන | වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් |
| "ඔබේ දෙපයින් නැගී සිටින්න " හඳුන්වාදීමේ වැඩසටහන | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| " ජීවිතය දැකීම සඳහා අරමුණු පිහිටුවා ගැනීම" වැඩමුළුව | සියලුම පීඨවල පළමු වසර උපාධි අපේක්ෂකයින් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන" වැඩමුළුව | තුලියාපිටිය පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන" වැඩමුළුව | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| "උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය" වැඩසටහන | වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරින් |
| "කොළඹ කොටස් වෙළඳපොළ අනුපාතය" පිළිබඳ වැඩමුළුව | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ, තෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| "සෞන්දර්ය හැකියා දියුණු කිරීම" වැඩමුළුව | මාකඳුර පරිශ්‍රයේ සියලුම සිසුන් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන - පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය " වැඩමුළුව | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු සහ දෙවන වසර සිසුන් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය " වැඩමුළුව | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර සිසුන් |
| "JA/YESL ව්‍යාපාර ලියාපදිංචි කිරීම - පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය " වැඩමුළුව | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු සහ දෙවන වසර සිසුන් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය " වැඩමුළුව | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ, පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| "උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය" වැඩසටහන | වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරින් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය " වැඩමුළුව | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයේ, පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් |
| "JA/YESL ව්‍යාපාර වැඩසටහන - පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය " වැඩමුළුව | පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු සහ දෙවන වසර සිසුන් |
| "උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය" (සම්මුඛ පරීක්ෂණය) | වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරින් |

### 18.2 දුෂ්කරතාවයන්

ඒකකය මඟින් පවත්වන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය හා ඵලදායී බව වැඩිකිරීමට මූලික පහසුකම් කිහිපයක් අවශ්‍යය ඇත.

## 19. තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

## කුලියාපිටිය පරිශ්‍රය

### 19.1 හැඳින්වීම

මෙම ඒකකය මගින් ව්‍යවහාරික විද්‍යා පීඨය සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය යන පීඨ දෙකෙහි සිසුන් සඳහා සේවා සැපයීම් කරනු ලැබේ. මෙහි විද්‍යාගාරය කොටස් දෙකකින් යුක්ත වන අතර එක කොටසක් අන්තර්ජාල පහසුකම් හා අනෙක් කොටස ප්‍රායෝගික කටයුතු සඳහා වෙන් කෙරේ. මෙම විද්‍යාගාරය අති නවීන තාක්ෂණික ගුණාංගවලින් සමන්විත වේ. අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා වෙන වෙනම කොටස් දෙකක් ස්ථාපිත කර ඇත. සාමාන්‍යයෙන් මෙම විද්‍යාගාරය රාජකාරී කාලය තුළ විවෘතව තිබේ. සිසුන් සඳහා පස්වරු 8.00 දක්වා විවෘතය. ඊට අමතරව සති අන්තයේ දී සහ නිවාඩු දිනවලදී ද විවෘතව ඇත. වෙබ් අඩවි සහ ඉලෙක්ට්‍රොනික තැපැල් සේවාවලට අදාළ පද්ධති උපකරණ මෙම මධ්‍යස්ථානයේ සවිකර ඇති අතර ඒවා පාලනය කරනු ලබන්නේ ද මෙම කාර්යය මණ්ඩලය මගිනි. දැනටමත් මෙම ඒකකය මයික්‍රෝසොෆ්ට් සමාගම සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට ලක්ෂ 30 ක පමණ වටිනා මෘදුකාංග අයකිරීමකින් තොරව ලැබී ඇත. මෙම ඒකකය පරිශ්‍රයේ සියළු දෙනාටම සේවා සපයනු ලැබේ. එමෙන්ම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර දුරකථන ජාලය නිර්මාණය, පරිපාලනය පමණක් නොව ස්ථාපිත කිරීම ද මෙම ඒකකය මගින් සිදු කර ඇත. ඊට අමතරව පසුගිය කාලය ඇතුලත බාහිර ප්‍රජාව සහ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා නව පාඨමාලා කිහිපයක් හඳුන්වා දී තිබේ.

### 19.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- නවක සිසුන් සඳහා පරිගණක භාවිතය
- උපාධි අපේක්ෂකයින් සඳහා වන MS Office සහතික පත්‍ර පාඨමාලාව
- බාහිර පාර්ශවය සඳහා වන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අය කෙරේ)
- අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා වන තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන
- අනධ්‍යයන කාර්මික කාර්යය මණ්ඩලය සඳහා වන පරිගණක ජාලගත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන

### 19.3 අයවැය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන | - | මිලියන 1.2 |
| පුනරාවර්තන | - | මිලියන 3.4 |

### 19.4 වසර තුළ ලැබූ ප්‍රගතිය

- පාඨමාලා පවත්වාගෙන යාමට හා පරීක්ෂණ කාර්යයන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීම
- උපාධි අපේක්ෂකයින් සඳහා MS Office සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම (මෙය කෙරෙමින් පවතී)
- විද්‍යාගාරයේ පරිගණක ප්‍රතිස්ථාපනය කිරීම හා උසස් කිරීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම

### 19.5 අනෙකුත් දුෂ්කරතාවයන්

- කාර්යය මණ්ඩලය සඳහා ලබා දෙන යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණාත්මක නොවීම
- නව තාක්‍ෂණික ප්‍රවීනතා දැනුම යෙදවීම අඩුවීම
- ශිෂ්‍යය සංඛ්‍යාවේ වැඩිවීමේ ප්‍රමාණයට සරිලන ආකාරයට පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩිකිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම.
- පරිගණක අලුත් වැඩියාකිරීමට ස්ථානයක් නොමැති වීම සහ කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම
- කාර්යය මණ්ඩලයට ලබා දෙන පුහුණු පාඨමාලා ප්‍රමාණවත් නොවීම.
- අධ්‍යයන කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.

### 19.6 ඉදිරි සංවර්ධනය සඳහා යෝජනා

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව දක්වා වැඩිදියුණු කිරීම.
- ඉගෙනීම් කළමණාකරන පද්ධතිය (LMS) අධ්‍යයන කාර්යය මණ්ඩලයට හඳුන්වා දීම.
- බාහිර පුද්ගලයන්ට වැඩමුළු පැවැත්වීම.
- වැඩිවන ශිෂ්‍ය කණ්ඩායම්වලට ගැලපෙන ආකාරයට පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩි කිරීම.
- රැහැන් රහිත ජාල පහසුකම් වැඩිකිරීම.
- "වෙබ් අඩවි සංවර්ධනය" නමින් ගාස්තු අයකරන පාඨමාලාවක් ආරම්භ කිරීම.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- සාමාන්‍ය තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථාන සහතික පත්‍ර විභාගය සඳහා සිසුන් පුහුණු කිරීම.

### 19.7 අනෙකුත් අදාල තොරතුරු

විශ්වවිද්‍යාලයට හා බාහිර ප්‍රජාවට බහු සේවා සපයන මධ්‍යස්ථානයක් බවට තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය දියුණු කිරීමට අවශ්‍යව ඇත.

# 20. තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

## මාකඳුර පරිශ්‍රය

### 20.1 හැඳින්වීම

සිසුන්ගේ සීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂෙත්‍රවලට අදාල තොරතුරු තාක්ෂණ අභියෝගයන්ට මුහුණ දිය හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්ෂරතාවය මෙන්ම ඉහළ වෘත්තීය කාර්යය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්ෂණ හා උසස් පරිගණක භාවිතාව පිළිබඳ පාඨමාලා ප්‍රදානය කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්ෂණ පාඨමාලාව ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා විශේෂයෙන්ම ප්‍රායෝගික පාඨමාලාවලදී මෙම ඒකකය මඟින් සහයෝගය දෙනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන වැවිළි කළමනාකරණ (බාහිර) උපාධියට අයත් සිසුන්ගේ පාඨමාලා දෙකක් වන පරිගණක තාක්ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලාවලට සහයෝගය දෙනු ලැබේ. එමෙන්ම වයඹ පළාතේ ප්‍රජාවට ප්‍රයෝජනවත්වන පරිදි පරිගණක තාක්ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම ප්‍රදානය කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් කරනු ලබන සේවා පුළුල් කර ඇත.

මෙම පරිගණක තාක්ෂණ මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුළදී පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘත කර ඇත.

### 20.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- "පරිගණක දෘඩාංග එකලස් කිරීම" පිළිබඳව එක් දින වැඩමුළුව - 2012 මාර්තු 11
- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ තෙවන කණ්ඩායම පාඨමාලාව සම්පූර්ණ කරන ලදි - 2012 අප්‍රේල් 28
- UDG / HETC ව්‍යාපෘතිය යටතේ පැවැත් වූ "Need analysis for enhancing ICT skills required for employments" පිළිබඳ වැඩමුළුව - 2012 මැයි 10
- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ හතරවන කණ්ඩායම - 2012 ඔක්තෝබර් 27
- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ දෙවන කණ්ඩායම - 2012 නොවැම්බර් 04
- තොරතුරු තාක්ෂණ නොවන වැඩසටහන් යටතේ ඇති තොරතුරු තාක්ෂණ විෂය මාලාව සංශෝධනය කිරීම සඳහා , UDG / HETC ව්‍යාපෘතිය යටතේ පැවැත් වූ වැඩමුළුව - 2012 නොවැම්බර් 04

### 20.3 පර්යේෂණ කටයුතු

SAITM පර්යේෂණ සම්මන්ත්‍රණයේදී H.A.C.K ජයතිලක මහතා විසින් "Plant Selection database for Landscape Designers" නම් පර්යේෂණ කෘතිය ප්‍රසිද්ධ කිරීම.

## 20.4 කාර්ය මණ්ඩල තත්ත්වය

- තාවකාලික පදනම මත පරිගණක උපදේශකවරයෙක් ලෙස , H.W.H.ප්‍රේමචන්ද්‍ර මහතාගේ සේවා කාළය 2012 අගෝස්තු 16 වන දින සිට දීර්ඝ කරන ලදී.
- තාවකාලික පදනම මත පරිගණක උපදේශකවරයෙක් ලෙස , SBMCP හේරත් මහතාගේ සේවා කාළය 2012 නොවැම්බර් 19 වන දින සිට දීර්ඝ කරන ලදී.

## 20.5 අයවැය

විශ්වවිද්‍යාල අරමුදලින් මිලියනයක මුදලක් වෙන් කිරීම.

## 20.6 අනෙකුත් දුෂ්කරතා

පරිගණක තොරතුරු අංශය සඳහා දැනට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොමැත

## 20.7 යෝජනා

මධ්‍යස්ථානය දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය වේ.

## 20.8 අනෙකුත් අදාල තොරතුරු

පේරාදෙණිය විශවවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මඟින් 2012 පෙබරවාරි 06 සිට 11 දක්වා පවත්වන ලද **"GIS and Applications"** නේවාසික කෙටි පාඨමාලාව සඳහා එච් ඒ සී කේ ජයතිලක මහතා සහභාගී වීය.

## 21. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය

**21.1) දැක්ම**

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වීම.

**21.2) මෙහෙවර**

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉගෙන ගැනීම සම්බන්ධ තෝරාගත් ක්‍රමවේද මගින් උපාධි අපේක්ෂකයින්ගේ භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම.

- ඵලදායී ක්‍රමවේද මගින් කතාව, කියවීම, ලිවීම, සහ සවන්දීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම.
- ශාස්ත්‍රීය, සමාජීය, හා වෘත්තීය ප්‍රජාවේ ක්‍රියාකාරී කොටසක් බවට පත්වීම සඳහා සිසුන් පෙළඹවීම.
- ජාතික සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඵලදායි සංනිවේදන කුසලතා ලබා දීම.

කුලියාපිටිය ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මගින් සිසුන්ට ඔවුන්ගේ අනාගතය හමුවේ ඇති අභියෝග ජයගැනීම සඳහා අවශ්‍ය භාෂා නිපුණතා ලබා ගැනීමට, ඔවුන්ගේ අවංකභාවය වැඩි කිරීම, අවස්ථාවෝචිත පරිදි අනුවර්තනයවීමේ හැකියාව සහ සක්‍රීය ඵලදායී පුරවැසියන් බිහිකිරීම අපේක්ෂා කරනු ලැබේ. ජාතියේ සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වීමට සහ සමාජය සමඟ අන්‍යෝන්‍ය ක්‍රියාත්මක වීම වර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලා, සහභාගීත්ව සහ ක්‍රියාකාරකම් පුරුකක් වශයෙන් ක්‍රියාත්මක වනු ඇත. මෙම පාඨමාලා UTEL (University Test of English Language) ප්‍රමිතීන්ට සමාන වන අතර 2012 වසරේදී සිසුන්ට තම ඉංග්‍රීසි භාෂාවේ නිපුණත්වය සහ විශ්වාසය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

**21.3) 2011 වසරේදී ප්‍රදානය කළ පාඨමාලා**

**I) ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා**

- නවක සිසුන් සඳහා මූලික ඉංග්‍රීසි පාඨමාලාව.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය පිළිබඳ පාඨමාලා පළමු මට්ටමේ සිසුන් සඳහා
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය පිළිබඳ පාඨමාලා දෙවන මට්ටමේ සිසුන් සඳහා.
- ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව තුන්වන මට්ටමේ සිසුන් සඳහා.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය පිළිබඳ උසස් පාඨමාලාව තුන්වන මට්ටමේ සිසුන් සඳහා.

**II) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය.**

- ප්‍රථම වසර සිසුන් සඳහා ව්‍යාකරණ පදනම ඉංග්‍රීසි පාඨමාලාව (ELTU 1110)
- ප්‍රථම වසර සිසුන් සඳහා රචනා හැකියාව දියුණු කිරීම පාඨමාලාව (ELTU 1210)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන I පාඨමාලාව (BSF 2131)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන II පාඨමාලාව (BSF 2251)

උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි නිපුනත්වය සඳහා විශ්වවිද්‍යාලය තුළ පවත්වන ලද පාඨමාලාවලට අමතරව බාහිර ප්‍රජාව සඳහා ද විවිධ බාහිර පාඨමාලාවන් හා වැඩමුළු 2012 වසරේදි සංවිධානය කර ඇත. පාසල් සිසුන් සඳහා අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විභාග සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වා ඇත. එක් අවුරුදු ඉංග්‍රීසි ඩිප්ලෝමා 6වන කණ්ඩායම 2012 දී බඳවා ගත් අතර සිසුන් 260දෙනෙකු පමණ සාර්ථකව පාඨමාලාව නිම කර ඇත.

විශ්වවිද්‍යාලයට පරිබාහිර විවිධ ආයතනවල ප්‍රවීනයන් මඟින් තුන්වන වසරේ උපාධි අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීම පිළිබඳ නිපුණතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒවා ශිෂ්‍යයන්ට ඉතාමත් ඵලදායී වී ඇත.

**21.4 පර්යේෂණ ක්‍රියාකාරකම්**

2012 වර්ෂයේදී ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිරත වී ඇත.

| | |
|---|---|
| ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා | 'What kind of writing activities should EFL/ESL teachers use with post, beginners- A study of 1st year students at the Wayamba University of Sri Lanka.' |
| එම් කේ එස් එම් සමරනායක මහතා | 'Article usage by undergraduates' |
| ඩබ්ලිව් එස් ඒ ප්‍රනාන්දු මිය | 'Why do students fail to acquire basic sentence structure of English at the O/L standard? –A case study.' |

**21.5 සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද බාහිර ක්‍රියාකාරකම්**

UDG ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. එම ක්‍රියාකාරකම්වලින් උපාධි අපේක්ෂයන්ට ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය සහ විශ්වාසය වැඩි දයුණු කරනු ලැබේ.

අ. ඉංග්‍රීසි භාෂා විෂය මාලාව නැවත සංශෝධනය

ආ. ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ පහසුකම් තව දුරටත් සංවර්ධනය කිරීම

ඇ. විෂය මාලාව ට E-Learning ඇතුලත් කිරීම

ඈ. අධ්‍යයන කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

ඉ. භාෂා කඳවුරු සංවිධානය කිරීම

ඊ. ඉංග්‍රීසි දිනය ආශ්‍රිත තරඟ සංවිධානය

උ. උපාධි අපේක්ෂකයන් බිත්ති පුවත්පත්/සඟරා/වාර සඟරා යනාදිය නිර්මාණය කිරීමට යොමු කිරීම

**21.6 දුෂ්කරතා**

සෑම වසරකම පීඨ සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩිකරනු ලැබුවද කාර්ය මණ්ඩල ප්‍රතිපාදන 2005 වසරේ සිටම ලබා දී නැත. එසේ තිබියදී කථිකාචාර්යයවරුන් හතර දෙනෙකු මෙම පීඨ සඳහා තම උපරිම ශක්ති ප්‍රමාණයෙන් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කිරීම සඳහා කැපවී සිටිති. නව කථිකාචාර්යවරුන් ලබා දෙන්නේ නම් වඩාත් හොඳ සේවාවක් ලබා දිය හැකි අතර ආචාර්ය තනතුරු හිඟය නිසා ඇතිවන ගැටළු එවිට අවම වනු ඇත. එමෙන්ම මධ්‍යස්ථානය නිසි පරිදි ක්‍රියාත්මක වීම සඳහා කථිකාචාර්යයවරුන්ගේ සේවය ද අත්‍යාවශ්‍යව ඇත.

භාෂා විද්‍යාගාරයේ පවත්වන වැඩසටහන් නිසියාකාරව සිදුකිරීම සඳහා කාර්මික නිලධාරීවරයෙකු නොමැතිකම විශාල ගැටළුවකි. එම නිසා භාෂා විද්‍යාගාරය සඳහා කාර්මික නිලධාරීවරයෙකු පත් කිරීම පිළිබඳ ඉක්මනින් අවධානය යොමු කළ යුතුව ඇත.

# 22. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය

## 22.1 හැඳින්වීම

මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකක 1, 2 සහ 3 වසර සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 1 වසර සිසුන් සඳහා "පදනම් ඉංග්‍රීසි" පාඨමාලාවද, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 1 වසර සිසුන්ට "විද්‍යාව සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත් වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 2 වසර සිසුන් සඳහා "ශාස්ත්‍රීය ලිවීම" පාඨමාලාව ද, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 2 වසර සිසුන් සඳහා "ශාස්ත්‍රීය ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 3 වසර 2 වන සමාසිකයේ සිසුන් සඳහා "ව්‍යාපාර ඉංග්‍රීසි" පාඨමාලාව පවත්වනු ලැබේ. මෙම වර්ෂය සඳහා නවක සිසුන් ලියාපදිංචි කර නොගත් හෙයින් මෙම වර්ෂයේ මූලික ඉංග්‍රීසි පාඨමාලාව නොපැවැත්විණි.

## 22.2 පවත්වන ලද පුහුණුවීම් හා දැනුවත්වීම් වැඩ සටහන්

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය විසින් කෘෂිකර්ම පීඨ පරිශ්‍රයේදි Talkfest නමින් 2011 සඳහා භාෂා කඳවුරක් පවත්වන ලදි. මෙය මාකඳුර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලදි. මාකඳුරෙහි පිහිටා ඇති පීඨ දෙකින්ම සිසුන් 50 දෙනෙකු මෙම එක් දින වැඩමුළුව සඳහා සහභාගි වූහ. HETC ව්‍යාපෘතිය විසින් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා තරඟය සංවිධානය කරන ලදි. ඇමරිකානු තානාපති කාර්යාලය මඟින් ලියාපදිංචි වී ඇති උපාධි ශිෂ්‍යයින් හට ශිෂ්‍යත්ව ප්‍රධානය කළේය.

HETC ව්‍යාපෘතිය විසින් ඉංග්‍රීසි තරඟාවලිද සංවිධානය කෙරිණි. මාකඳුර පරිශ්‍රයේ උපදේශකයින් විසින්, ලිවීමේ ක්‍රියාකාරකම් වලට සහ වාචික ඉදිරිපත් කිරීම් සඳහා සිසුන්ව පුහුණු කරන ලදි. HETC ව්‍යාපෘතිය මඟින් සැලසුම් කරන ලද කටයුතු කිහිපයක් මෙන්ම ඉදිරිපස ප්‍රවේශයේ ඉදිකිරීම් කටයුතුද සාර්ථකව කරමින් පවති.බ්‍රිතාන්‍ය කවුන්සිලය මඟින් සංවිධානය කරනු ලැබූ ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහනකට, WMC ප්‍රනාන්දු මහත්මිය සහභාගි විය. මෙය 2012 අගෝස්තු 21 දින සිට 31 දින දක්වා වූ දින පහක වැඩමුළුවකි.

## 22.3 කාර්යය මණ්ඩල තත්ත්වය

මෙම ඒකකය සඳහා එක් ස්ථිර ඉංග්‍රීසි උපදේශකවරයෙකු සහ බාහිර ඉංග්‍රීසි උපදේශකවරයෙක් සිටිති. ඊට අමතරව පරිගණක යෙදුම් සහකාරවරයෙකු සහ කම්කරු ශ්‍රේණියේ සේවකයෙකු අනුයුක්ත කොට ඇත.

## 22.4 වසරේ දියුණුව

HETC ව්‍යාපෘතිය හරහා ලක්ෂ 2ක් වටිනා පොත් 2012 වර්ෂයේදි ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය වෙත ලැබිණි. ඉංග්‍රීසි තරඟ සඳහා සහභාගි වූ සිසුන් පීඨ මට්ටමින් ජයග්‍රහණ ලැබූහ.

**22.5 දුෂ්කරතා**

මූලික දුෂ්කරතාවය වනුයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය සඳහා ප්‍රමාණවත් තරම් ගුරුවරුන් නොමැති වීමය. මෙම ප්‍රශ්නය පිළිබඳව සනාථන සභාව ඇතුළු විවිධ රැස්වීම් වලදී සාකච්ඡා කෙරිණි.

**22.6 යෝජනා**

මෙම ඒකකය සඳහා ස්ථිර කාර්යය මණ්ඩලයක් බඳවා ගත යුතුව ඇත. විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ආරම්භ කරන ලද සංවර්ධන වැඩ කටයුතු ඉක්මනින්ම කළ යුතුව ඇත. මෙම ඒකකයේ ඉදිරි පස කොටස දැනටමත් අළුත්වැඩියා කොට ඇත. සිසුන්ගේ ලිවීමේ නිපුනතාව සංවර්ධනය සඳහා වැඩමුළු කීපයක් පැවැත්වීමට යෝජිතව ඇත. භාෂා ඉගෙනීමෙ මෘදුකාංග මලට ගැනීමට යෝජිතව ඇත.

# 23. වෛද්‍ය මධ්‍යස්ථානය

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රවල ස්ථාපිත කර ඇති අතර එම මධ්‍යස්ථානය මඟින් 2011 වසරේදී මෙන් 2012 වසරේදී ද සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ඉතා කැපී පෙනෙන භූමිකාවක් ඉටු කර ඇත.

කුලියාපිටිය වෛද්‍ය ඒකකය 2010 වසරේදී නව ගොඩනැගිල්ලකට ස්ථාපිත කර ඇති අතර දැනට ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

මාකඳුර පරිශ්‍රයේ වෛද්‍ය මධ්‍යස්ථානය 2011 ඔක්තෝබර් මාසයේ අලුත් ගොඩනැගිල්ලකට ස්ථාපිත කර ඇත. එදින සිට එහි කටයුතු සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

කුලියාපිටිය පරිශ්‍රයේ කාර්යය මණ්ඩලය 2011 වසරේදී පරිදි හෙද නිලධාරියෙක්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්, ඖෂධවේදියෙක්, යතුරු ලේඛිකාවක්, සාත්තුසේවකයෙක් සහ කම්කරුවෙකු යන සේවක මණ්ඩලයකින් සමන්විත වේ. මාකඳුර පරිශ්‍රයේ ද යතුරු ලේඛිකාවක් හැර මෙවැනිම කාර්යය මණ්ඩලයක් සේවය කරති.

එමෙන්ම වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් නවක කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ සහ සේවා දීර්ඝ කිරීම සඳහා අයදුම්කරන කාර්යය මණ්ඩලයේ වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලබා දෙන ලදි.

වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් සිසුන් සහ කාර්ය මණ්ඩලය වෛද්‍ය පරීක්ෂණයට භාජනය කල අතර විශේෂඥ වෛද්‍ය අවධානය අවශ්‍ය වූවන් කුලියාපිටිය මූලික රෝහල වෙත යොමු කරන ලදි.

**2012 වසරේදී කරන ලද සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන් පහත දැක්වේ.**

1. තැලසීමියා රෝගය සම්බන්ධයෙන් දැනුවත් කිරීම, පරීක්ෂා කිරීම
2. Leptospirosis සඳහා කරන ලද අධ්‍යාපන වැඩසටහන හා රෝගී නිවාරණය
3. බෝනොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ සුවනාරී සායනයක් පැවැත්වීම
4. දඩාවතේ යන සුනඛයින් වන්ධ්‍යකරණය කිරීම
5. මදුරු මර්ධන වැඩ සටහන්

2012 වසරේදී වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය කණ්ඩායමක් ලෙස සීමිත ප්‍රතිපාදන යටතේ වැඩ කිරීමෙන් කුලියාපිටිය හා මාකඳුර පරිශ්‍ර දෙකෙහිම සමස්ථ විශ්වවිද්‍යාල ප්‍රජාවටම සේවය ලබා දීමට හැකිවිය.

## 24 .පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2011<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| අ. පුද්ගල වැටුප් හා වේතන | 268,105,027 | 314,206,381 |
| ආ. ගමන් වියදම් | 1,006,540 | 875,428 |
| ඇ. සැපයුම් | 22,634,745 | 19,492,978 |
| ඈ. නඩත්තු | 7,613,077 | 8,881,711 |
| ඉ. ගිවිසුම් ගත සේවා | 80,740,847 | 99,703,430 |
| ඊ. අනෙකුත් | 9,590,867 | 10,542,783 |
| එකතුව | **389,691,103** | **453,702,711** |

## 25. මූලධන වියදම් විස්තර

| **විෂය** | **2011**<br>**රු.** | **2012**<br>**රු.** |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම් | 35,815,148 | 48,918,403 |
| ආ. යන්ත්‍ර අත්පත්කර ගැනීම් | - | - |
| ඇ. ගොඩනැගිලි සහ සවිකිරීම් අත්පත්කර ගැනීම් | - | - |
| ඈ. අනෙකුත් (පොත් සහ අනෙකුත් භාණ්ඩ) | 10,559,440 | 9,267,227 |
| **එකතුව** | **46,374,588** | **58,185,630** |

## 26. මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්)

| **විෂය** | **2012 සඳහා ප්‍රතිපාදන**<br>**රු.** | **2012 වර්ෂය තුළ වියදම් කිරීම්**<br>**රු.** | **ඉතිරිකිරීම් /අතිරික්තය**<br>**රු.** |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 431,000,000 | 453,702,711 | (22,702,711) |
| ආ. ව්‍යාපෘති හැර මූලධන | 226,915,000 | 226,816,094 | 98,906 |
| ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල් | - | - | - |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් | - | - | - |
| **එකතුව** | **657,915,000** | **680,518,805** | **(22,603,805)** |

## 27. මූල්‍ය ප්‍රගතියේ විස්තර (උපයන ලද ආදායම්)

| ආදායම් ප්‍රභවය | 2012 සඳහා ප්‍රතිපාදන රු. | 2012 වර්ෂයේ රැස්කිරීම් රු. | ඌනතාවය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධිඅපේක්ෂක අධ්‍යයන | - | 2,565,000 | - |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයන | - | 8,608,675 | - |
| ඇ. උපදේශන | - | 2,165,200 | - |
| ඈ. අනෙකුත් | - | 48,082,470 | - |
| **එකතුව** | **-** | **61,421,345** | **-** |

## 28. මූල්‍ය ප්‍රගති සමාලෝචනය – 2012

| විෂය | සමීකරණය | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් | ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 214,719.69 |
| ආ. ඒක ශිෂ්‍ය මූලධන වියදම් | ඒක ශිෂ්‍ය මූලධන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 27,536.98 |
| **එකතුව** | | |

## 29. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම සහ විස්තරය | ණය/ප්‍රතිපාදන | අරමුදල් ප්‍රභවය | මුළු පිරිවැයේ එකතුව රු. | RFA රු. | DF රු. |
|---|---|---|---|---|---|
| සෞඛ්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර - කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 17,500,000 | - | - |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 7,500,000 | - | - |
| දේශන ශාලා පළමු අදියර – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 165,000,000 | - | - |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 | - | - |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 | - | - |
| දේශන ශාලා දෙවන අදියර - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 125,000,000 | - | - |
| නේවාසිකාගාර හතරවන අදියර- කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| නේවාසිකාගාර පස්වන අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| නේවාසිකාගාර හයවන අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |

## 30. ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම | මුළු පිරිවැයේ එකතුව රු. | 2011වර්ෂයේ වියදම රු. | 2012 වර්ෂයේ වියදම රු. | 31.12.2012 වර්ෂය වන විට මුළු වියදම | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| සෞඛ්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර- කුලියාපිටිය | 17,500,000 | 2,100,000 | 1,700,000 | 3,800,000 | 90% |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | 7,500,000 | 3,500,000 | 1,670,000 | 5,170,000 | 100% |
| කාර්යය මණ්ඩල නේවාසිකාගාර - කුලියාපිටිය | 49,000,000 | 7,100,000 | 7,160,000 | 14,260,000 | 50% |
| කාර්යය මණ්ඩල නේවාසිකාගාර - මාකඳුර | 49,000,000 | 7,200,000 | 1,960,000 | 9,160,000 | 80% |
| පීඨ ගොඩනැගිල්ල – ව්‍යවහාර විද්‍යා පීඨය - කුලියාපිටිය (අදියර I සහ II) | 118,200,000 | 89,200,000 | - | 89,200,000 | 100% |
| පීඨ ගොඩනැගිල්ල – කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය - මාකඳුර (දෙවන අදියර) | 125,000,000 | - | 20,500,000 | 20,500,000 | 10% |
| පීඨ ගොඩනැගිල්ල – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - කුලියාපිටිය (අදියර I) | 165,000,000 | 44,240,000 | 32,240,000 | 76,480,000 | 90% |
| පීඨ ගොඩනැගිල්ල– පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය- මාකඳුර (අදියර I සහ II) | 97,000,000 | 60,620,000 | - | 60,620,000 | 100% |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය IV අදියර - කුලියාපිටිය | 69,000,000 | 25,100,000 | - | 25,100,000 | 50% |

## 31. 2012 වර්ෂයේදී යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය II අදියර (I කොටස) | රදවා ගැනීම් නිදහස් කළ යුතුව ඇත<br>0 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය II අදියර (II කොටස) | | |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යවහාරික විද්‍යා පීඨය II අදියර (I කොටස) | රදවා ගැනීම් නිදහස් කළ යුතුව ඇත<br>0 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යවහාරික විද්‍යා පීඨය II අදියර (II කොටස) | | |
| පීඨ ගොඩනැගිල්ල - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය I අදියර | 1,100,000 | 100% |
| පරිපාලන ගොඩනැගිල්ල | 800,000 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය I අදියර | 32,240,000 | 90% |
| වෛද්‍ය මධ්‍යස්ථානය I අදියර - මාකඳුර | 1,670,000 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය II අදියර – කුලියාපිටිය | 1,700,000 | 90% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | 1,960,000 | 80% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | 7,160,000 | 50% |
| නේවාසිකාගාර අදියර IV, කුලියාපිටිය | 25,100,000 | 50% |
| පීඨ ගොඩනැගිල්ල - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය II අදියර | 20,500,000 | 10% |

**1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ජේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2012වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව**

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ජේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබේ.

   (i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපනය කිරීම සංගතතාවයක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පිරිවයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

අ **මූල්‍ය හෙළිදරවුව**

(1) **රජයේ ප්‍රතිපාදන**

| | රු. | **2012** | **2011** |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 431,000,000.00 | 379,462,613.00 |
| මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 12,459,350.00 | 014,860,550.00 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 8,727,200.00 | 010,738,100.00 |
| මූලධන101 පුනරුත්තාපන වැඩසටහන | රු. | 50,000,000.00 | 025,200,000.00 |
| මූලධන 102 වත්කම් අත්පත් කර ගැනීම | රු. | 57,000,000.00 | 034,541,000.00 |
| මූලධන 103 ස්ථිර ඉදිකිරීම් | රු. | 115,000,000.00 | 089,000,000.00 |
| තොරතුරු තාක්ෂණය සඳහා විශේෂ මූලධන ප්‍රතිපාදන | රු. | 4,915,000.00 | - |
| **එකතුව** | රු. | **679,101,550.00** | **553,802,263.00** |

| | | | |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | **2012** | **2011** |
| ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 2,709,175 | 4,933,225.00 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 5,899,500 | 6,677,196.44 |
| **බාහිර උපාධි පාඨමාලා** | | | |
| කෘෂිකර්ම කළමනාකරණ පාඨමාලාව – මාකඳුර | රු. | 2,565,000 | 4,201,396.50 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | රු. | 12,268,260 | 4,787,600.00 |
| රක්ෂණ ඩිප්ලෝමාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 2,660,875 | 3,517,302.80 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර – කුලියාපිටිය | රු. | 292,500 | 814,500.00 |
| බාහිර පරිගණක පාඨමාලා – මාකඳුර | රු. | 3,368,700 | 1,950,087.21 |
| **පර්යේෂණ ප්‍රතිපාදන** | | | |
| NSF ප්‍රතිපාදන | රු. | 1,543,989 | 0,4,307,174.00 |
| IUCN ප්‍රතිපාදන | රු. | 240,686 | 127,550.00 |
| **අනෙකුත් ප්‍රතිපාදන** | | | |
| IDRC | රු. | 24,507,460 | 10,223,469.72 |
| බාහිර කටයුතු මධ්‍යස්ථානය - මාකඳුර | රු. | 2,165,200 | 938,450.00 |
| Castor ව්‍යාපෘතිය | රු. | 3,200,000 | |
| **එකතුව** | රු. | **61,421,345** | **42,477,951** |

(2) 2012 වර්ෂයේදී ආදායම ඉක්මවා ගිය වියදම වූ රු. (125,110,996.85) 2011 වර්ෂයේදී රු. (100,553,542.15). මෙය ප්‍රධාන වශයෙන්ම ගිණුම්කරණ ක්ෂය වීම නිසා සිදුව ඇත.

(3) පසුගිය වසරේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ ණය හා අත්තිකාරම් මුදලින් අයකර ගත යුතු වූ රු. 26,516,893.87 මුදල මෙම වසරේදී රු. 25,889,537.55.

(4) 2010 වසරේදී රු. 12,275,144.46 වූ විශ්වවිද්‍යාලය මගින් රැස් කරන ලද අරමුදල ආයෝජනයෙහි වටිනාකම ශේෂ පත්‍ර දිනය වන විට රු. 16,841,710.51 ක් විය.

(5) අභ්‍යන්තර ආදායම් ප්‍රභවය

| **2011** රු. | **2012** රු. | **වෙනස රු.** | **වෙනස ප්‍රතිශතයක් ලෙස %** |
|---|---|---|---|
| 7,614,628.45 | 7,460,135.46 | 154,492.99 | (2.03)% |

**a)** විශ්ව විද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් වල 2012.12.31 දිනට ශේෂයන් එදිනට අදාළ මුදල් පොත් සමඟ සසඳන ලද අතර ශේෂ තහවුරු කිරීම් විගණකාධිපති වෙත සෘජුවම යොමු කරන ලෙස අදාළ බැංකුවලට උපදෙස් දෙන ලදී. මෙම ශේෂයන් කෙටි කාලීන බැදීම් වලට සමාන වේ.

**b)** ශේෂ පත්‍රයේ 2012.12.31 දිනට ගබඩා තොග ලෙස දක්වා ඇති ශේෂ වන රු. 17,516,654.45 ගබඩා තොග භෞතික සත්‍යාපනයෙන් ලබාගත් ශේෂය වන අතර අතිරික්ත හා ඌණ ශේෂයන් තොග ගැලපුම් ගිණුමට ගලපන ලදී. තොග සත්‍යාපනය වත්කම් වල හිමිකම පැවැත්ම හා වටිනාකම අනුව ගණනය කළ අතර තොග වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ පවත්වාගෙන යන ගිණුම් ලේඛන සමඟ සසඳන ලදී.

**c)** මූලධන කෙරීගෙන යන වැඩ ගිණුමෙහි 2012.12.31 දිනට ශේෂ පත්‍රයේ සදහන් වන රු. 31,447,688.17 අගයන ලද්දේ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අනුවය.

**d)** පොදු සංචිත ගිණුමේ 2012.12.31 දිනට ශේෂය රු. 712,425,487.27 ක් වන අතර 2011 වර්ෂයේදී රු.587,314,490.42 කි. මෙය 2012 වර්ෂයෙන් වෙන් කළ විශ්‍රාම පාරිතෝෂික හා ස්ථාවර වත්කම් ක්ෂය වීම් පොදු සංචිතයට ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

කෙසේ වෙතත් වාර්ෂික ගිණුම් වාර්තා වලට ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ සංකල්පය යොදා ගැනීම 649 අංක දරණ 5.10.1995 චක්‍රලේඛ UGC චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද අතර 2012 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ගැලපීම රු. 109,868,421.45 කි.

2012.12.31 දිනට විශ්‍රාම පාරිතෝෂික දීමනා වෙන් කිරීමට රු. 66,771,880.00 ක් වන අතර එය විශ්‍රාම පාරිතෝෂික දීමනා පිලිබඳ පනත හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් අනුව වෙන් කර ඇත.

**ආ) අයවැය පාලනය**

වැඩසටහන් අයවැය ලේඛණය 2012 වර්ෂයේදිද ඵලදායි කළමණාකරන උපක්‍රමයක් ලෙස භාවිතා කරන ලදී.

**ඇ) දේපල, පිරියත හා කාර්යාලීය උපකරණ පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය**

මෙම ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී.

**ඈ) පාලන ගිණුම් සැසදිම**

2012.12.31 දිනට පිළියෙල කළ උපලේඛන හා සියලුම පාලන ගිණුම් සසඳන ලද අතර එම සසඳන ලද උපලේඛන 2012.12.31 ගිණුම් වාර්තා සමඟ ඉදිරිපත් කර ඇත.

**පොදු කරුණු**

අවසාන වශයෙන් 2012 වර්ෂය තුළ විශ්ව විද්‍යාලයට පාලනය කල නොහැකි කපා හැරීම් සීමා කිරීම් හා මිල උච්චාවචනයන් වැනි දුෂ්කරතා යටතේ වැඩකටයුතු සිදුකරගෙන යාමට සිදු වූ නමුත් එම බාධා මැඩගෙන 2012 වර්ෂයට අදාල අධ්‍යයන හා අනධ්‍යයන සැලසුම් වල සාර්ථකත්වය ලඟාකර ගත් බව දන්වනු කැමැත්තෙමි.

මහාචාර්ය S.J.B.A.ජයසේකර
උපකුලපති
වයඹ විශ්වවිද්‍යාලය
26 පෙබරවාරි 2013

# 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

රු ' 000

| | සටහන | 2012 දෙසැම්බර් 31 දිනට | | 2011 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | **1** | 978,065 | | 932,210 | |
| නොනිමි වැඩ | **2** | 109,004 | | 39,826 | |
| දිගුකාලීන ආයෝජන | **3** | 16,842 | | 12,275 | |
| කාර්යය මණ්ඩල ණය | **4** | 25,550 | 1,129,461 | 25,281 | 1,009,592 |
| **ජංගම වත්කම්** | | | | | |
| වට්ටෝරුගත/ගබඩාගත | **5** | 17,517 | | 16,979 | |
| වෙළඳ හා වෙනත් ලැබීම් | **6** | 999 | | 189 | |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් | **7** | 967 | | 608 | |
| මූලධන අත්තිකාරම් | **8** | 59,911 | | 46,565 | |
| සේවා සහ සැපයුම් සඳහා අත්තිකාරම් | **9** | 1,140 | | 3,013 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 1,341 | | 1,541 | |
| අනෙකුත් ජංගම වත්කම් | **10** | 4,935 | | 3,314 | |
| ඉතිරිකිරීම් තැන්පත් | **11** | 342 | | 309 | |
| බැංකු ගිණුම් ශේෂය | **12** | 28,732 | 115,884 | 31,597 | 104,115 |
| **වත්කම්වල එකතුව** | | | **1,245,345** | | **1,113,707** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| විවිධ ණය හිමියෝ | **13** | 13,981 | | 30,087 | |
| තැන්පත් | **14** | 2,891 | | 812 | |
| වීයදම් ණය හිමියෝ | **15** | 14,372 | | 15,839 | |
| වෙනත් | **16** | 49,137 | 80,381 | 62,340 | 109,078 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| මූලධන - වැයවූ මූලධන ප්‍රතිපාදන | | 1,453,863 | | 1,292,665 | |

| | | 2010 දෙසැම්බර් 31 දිනට | | 2009 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| මූලධන - වැයවූ ප්‍රතිපාදන / නොනිමි වැඩ | | 109,004 | | 39,826 | |
| වැය නොවූ මූලධන ප්‍රතිපාදන | **17** | 562 | | 835 | |
| විශේෂ ප්‍රතිපාදන | | 200,047 | 1,763,476 | 162,423 | 1,495,749 |
| පරිත්‍යාග අරමුදල් | **18** | 396 | | 389 | |
| විශේෂ අරමුදල් | **19** | 12,530 | | 6,328 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 66,772 | 79,698 | 55,261 | 61,978 |
| **වගකීම්වල එකතුව** | | | **1,923,555** | | **1,666,805** |
| **ශුද්ධ වත්කම්වල එකතුව** | | | **(678,210)** | | **(553,098)** |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | | | | |
| ඒකාබද්ධ අරමුදල | | (712,426) | | (587,314) | |
| සංචිත | | 34,216 | (678,210) | 34,216 | (553,098) |
| **ශුද්ධ වත්කම්/කොටස්වල එකතුව** | | | **(678,210)** | | **(553,098)** |

| | | |
|---|---|---|
| ................................ | ................................ | ...................................... |
| (මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) | (ඊ එම් ජී ඒකනායක මයා) | (ඩී එල් ආර් ද සිල්වා මිය) |
| උපකුලපති | ලේඛකාධිකාරී | වැඩ බලන මූල්‍යාධිකාරී |

## 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

| මෙහෙයුම් ආදායම | මෙම වර්ෂය 2012 (රුපියල් '000) | පසුගිය වර්ෂය 2011 (රුපියල් '000) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | 431,000 | 379,463 |
| ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රතිපාදන | 8,727 | 10,746 |
| මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන | 12,459 | 14,861 |
| පුනරාවර්තන ප්‍රතිපාදන (පුනරුත්තාපන ස්වභාවයේ) | 247 | 1,214 |
| ආයෝජන පොලිය | 220 | 12 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | 960 | 1,003 |
| දේපල කුලිය | 551 | 509 |
| පැරණි භාණ්ඩ අලෙවිය | 1,123 | 125 |
| ඵලදා විකිණීම | 589 | 411 |
| විවිධ ලැබීම් | 3,814 | 4,728 |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 85 | 729 |
| විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 23 | 43 |
| පුස්තකාලයීය දඩ | 95 | 54 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | **459,893** | **413,898** |
| **මෙහෙයුම් වියදම (ක්ෂයවීම් ඇතුළුව)** | | |
| පුද්ගල වැටුප් හා වේතන (සටහන 01) | 314,206 | 268,105 |
| ගමන් වියදම් | 875 | 1,007 |
| සැපයුම් හා පාරිභෝජන | 19,493 | 22,635 |
| නඩත්තු | 8,882 | 7,613 |
| ගිවිසුම්ගත සේවා | 99,703 | 80,741 |
| ක්ෂයවීම් | 109,869 | 97,919 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 10,543 | 9,591 |
| මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් | 21,187 | 25,606 |
| පුනරුත්තාපන වියදම් (පුනරාවර්තන ස්වභාවයේ) | 247 | 1,214 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **585,005** | **514,431** |
| **මෙහෙයුම් කාර්යයන්හි අතිරික්තය/හිඟය** | **(125,112)** | **(100,533)** |

| | | |
|---|---|---|
| මූල්‍ය පිරිවැය | | - |
| වත්කම් යන්ත්‍ර උපකරණ විකිණීමෙන් ලැබීම් | | - |
| සමස්ත මෙහෙයුම් නොවන ආදායම (වියදම) | | - |
| ශුද්ධ අතිරික්තය (ඌනතාව) - අතිවිශේෂ අයිතමයන් ගැලපීමට පෙර | (125,112) | (100,533) |
| අතිවිශේෂ අයිතම | | - |
| **ශුද්ධ අතිරික්තය (ඌනතාව) ගත වූ කාලය තුළ** | **(125,112)** | **(100,533)** |
| | | |
| ඉදිරියට ගෙනා පෙර වර්ෂ ශේෂය | (587,314) | (487,049) |
| වර්ෂයේ ඌනතාව | (125,112) | (100,533) |
| එකතු කිරීම් - පෙර වර්ෂයේ ආදායම් | | |
| වෙනත් ගැලපීම් | | 554 |
| අඩු කිරීම් - පෙර වර්ෂයේ වියදම් | | |
| වෙනත් ගැලපීම් | | (286) |
| **ඉ/ගෙ පොදු සංචිතය** | **(712,426)** | **(587,314)** |

සටහන 01

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 151,073 | 138,281 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 7,751 | 8,282 |
| වෙනත් දීමනා | 102,134 | 75,182 |
| විශ්‍රාම ප්‍රතිලාභ (වි.වි.අ.අ., සේ.නි.භා.අ., විශ්‍රාම වැටුප්, පාරිතෝෂික) | 53,248 | 46,360 |
| **සමස්ත පුද්ගල ගෙවීම්** | **314,206** | **268,105** |

................................. .................................... ....................................

(මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) (ඊ එම් ජී ඒකනායක මයා) (ඩී ඒ යූ ධර්මදාස මයා)

උපකුලපති ලේඛකාධිකාරී මූල්‍යාධිකාරී

## 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2012 දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2011 දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | | |
| අතිරික්තය/(ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරීත්වය | (125,112) | (100,267) |
| **එකතු කිරීම්ඃ සංචලනය නොවන මුදල්** | | |
| ක්‍ෂය | 109,869 | 97,919 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 12,683 | 13,364 |
| පාරිතෝෂික ගෙවීම් | (251) | (107) |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් ලද ආදායම් | | - |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම් | | - |
| තොගයේ වැඩිවීම්/අඩුවීම් | (538) | (1,450) |
| ණයගැතියෝ වැඩිවීම්/අඩුවීම් | (810) | (10) |
| කාර්යය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම් | (269) | (1,311) |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | (359) | 39 |
| සැපයුම් සහ සේවා අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 1,873 | (1,285) |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | 200 | (985) |
| අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම් | (1,621) | 377 |
| විවිධ ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | (419) | (627) |
| තැම්පත් වැඩිවීම්/අඩුවීම් | 2,079 | (2,411) |
| වියදම් ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | (1,467) | 4,554 |
| අනෙකුත් ජංගම වගකීම් වැඩිවීම්/අඩුවීම් | (92) | 4,432 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | (4,234) | 12,232 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | (4,234) | 12,232 |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (230,622) | (149,341) |
| සීමිත අරමුදල් ආයෝජන | (4,567) | (5,509) |
| පරිත්‍යාග අරමුදල් | 7 | 4 |
| **ශුද්ධ ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | (235,182) | (154,846) |

| මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය | 2012දෙසැම්බර් 31 දිනට<br>රු ' 000 | 2011දෙසැම්බර් 31 දිනට<br>රු ' 000 |
|---|---|---|
| මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 50,000 | 21,500 |
| මූලධන ප්‍රතිපාදන - වත්කම් අත්පත්කර ගැනීම් | 57,000 | 34,045 |
| මූලධන ප්‍රතිපාදන - ස්ථිර ඉදිකිරීම් | 115,000 | 89,000 |
| විශේෂ ප්‍රතිපාදන | 8,349 | 5,516 |
| විශේෂ ලැබීම් | 6,202 | 4,424 |
| CARP අරමුදල | - | - |
| **ශුද්ධ මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | **236,551** | **154,485** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | **(2,865)** | **11,871** |
| | **31,597** | **19,726** |
| | **28,732** | **31,597** |

| මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය | 2012 දෙසැම්බර් 31 දිනට | 2011 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| මහජන බැංකුව කුලියාපිටිය - ගි. අ. 028100151586123 | 11,754 | 10,135 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000171 | 4,023 | 8,320 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140000165 | 441 | 1,175 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0002874770 | 1,400 | 1,680 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00001473507 | 5,651 | 3,527 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473508 | 613 | 587 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473388 | 476 | 739 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000963 | 1,826 | 4,911 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100130041538 | 1,138 | 516 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140044857 | 1,410 | 7 |
| එකතුව | 28,732 | 31,597 |

164

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

WAYAMBA UNIVERSITY OF SRI LANKA ★ KULIYAPITIYA ★
07 JAN 2014
VICE CHANCELLORS OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>துலைவா<br>My No | එන්ඩබ්ලිව්/පීටී/බී/1-2/ව.වි.වි<br>අ.ගි. විගණනය/<br>2013/24 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2013 දෙසැම්බර් 31 දින. |

WAYAMBA UNIVERSITY OF SRI LANKA ★ KULIYAPITIYA ★
VC-cc k7
08 JAN 2014
REGISTRAR'S OFFICE

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ විගණන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

(එම්.එල්.කේ. පද්මිණි)
සහකාර විගණකාධි,
විගණකාධිපති වෙනුවට


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මගේ අංකය : එන්ඩබ්/පීටී/බී/1-2/ව.පි.වි/
2012/අ.ගි/2013/24 2013 දෙසැම්බර් 31 දින

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.

**ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ විගණන වාර්තාව**

---

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර කළමනාකරණ විගණන වාර්තාව.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිත පරිදි සහ අවස්ථානුකූලව ප්‍රමාණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**1.3 විගණන විෂයපථය සහ මතය සඳහා පදනම**

---

මාගේ වගකීම වන්නේ විගණන නිරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් විය. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි.

## 02. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව (SLPSAS 1) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) පොත් අගය ශූන්‍ය ලෙස පෙන්වා තිබූ නමුත් විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන පිරිවැය රු. 64,954,050 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත සඳහන් අවස්ථාවන් නිරීක්ෂණය විය.

(අ)

(i) විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පොලී ආදායම් ගිණුම්ගත කිරීමේදී මුදල් පදනම මත ගිණුම්ගත කළ යුතු වුවද, බාහිර පාඨමාලාවල අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් විශ්ව විද්‍යාලයට ලැබී තිබූ රු.143,237 ක පොලී මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ii) ගිවිසුම් කඩකිරීම් මත විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩලයෙන් අය කර ගෙන, ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමෙන් ලැබී තිබුණු රු. 493,369 ක් වූ පොලිය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 737 හා 1998 අගෝස්තු 18 දිනැති චක්‍රලේඛය ප්‍රකාර විශ්ව විද්‍යාල වියදම් පියවා ගැනීම සඳහා යොදවාගත නොහැකි වුවද, එම පොලිය විශ්ව විද්‍යාල ආදායමට ගෙන නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් මිලදී ගත් දින සිට අපහරණය කරන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම ප්‍රතිපත්තිය වුවද, සමාලෝචිත වර්ෂය ආරම්භයේ තිබූ වත්කම් වෙනුවෙන් ක්ෂය ගණනය කිරීම වැරදි සහගත විය. ඒ අනුව මෝටර් රථ සඳහා රු. 1,240,482 ක්ද, කාර්යාල උපකරණ සඳහා රු. 494,923 ක්ද, විදුලි හා තාක්ෂණ උපකරණ සඳහා රු. 431,555 ක්ද අඩුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණු අතර මෝටර් රථ හැර අනෙකුත් වත්කම් සඳහා නිසි පරිදි ලේඛණ නඩත්තු කර නොතිබුණි.

2.3 2012 හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පෙර වර්ෂයේ තත්ත්වයන් සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 දෙසැම්බර් 31 දිනට | 2011 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| | රු.('000) | රු.('000) |
| රජයේ ප්‍රදාන පුනරාවර්තන වියදම් සඳහා | 431,000 | 379,463 |
| රජයේ ප්‍රදාන ශිෂ්‍යාධාර | 8,727 | 10,746 |
| රජයේ ප්‍රදාන මහපොල | 12,459 | 14,861 |
| පුනරාවර්තන ප්‍රදාන (පුනරුත්ථාපන ස්වරූපයේ) | 247 | 1,214 |
| ආයෝජන පොළී | 220 | 12 |
| සේවක ණය පොළී | 960 | 1,003 |
| දේපළ කුලියට දීම | 551 | 509 |
| පැරණි ගබඩා ද්‍රව්‍ය විකුණුම් | 1,123 | 125 |
| නිශ්පාදන විකුණුම් | 589 | 411 |
| විවිධ ලැබීම් | 3,814 | 4,728 |
| ඇතුලත්වීමේ ගාස්තු | 85 | 729 |
| විභාග ගාස්තු | 23 | 43 |
| පුස්තකාල දඩ | 95 | 54 |
| මුළු මෙහෙයුම් ආදායම | 459,893 | 413,898 |
| <u>මෙහෙයුම් වියදම් (ක්ෂය ඇතුළත්ව)</u> | | |
| පුද්ගල පඩිනඩි | 314,206 | 268,105 |
| ගමන් වියදම් | 875 | 1,007 |
| සැපයුම් පාරිභෝජන ද්‍රව්‍ය | 19,493 | 22,635 |
| අළුත්වැඩියා වියදම් | 8,882 | 7,613 |
| ගිවිසුම්ගත සේවා | 99,703 | 80,741 |
| ක්ෂයවීම | 109,869 | 97,919 |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 10,543 | 9,591 |
| මහපොල හා ශිෂ්‍යාධාර ගෙවීම් | 21,187 | 25,606 |
| පුනරුත්ථාපන වියදම | 247 | 1,214 |
| මුළු මෙහෙයුම් වියදම | 585,005 | 514,431 |
| කාලපරිච්ජේදය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) | (125,112) | (100,533) |
| පෙර වර්ෂයේ ඉදිරියට එන ශේෂය | (587,314) | (487,049) |
| එකතු කළා :- පෙර වර්ෂ ගැලපුම් | - | 286 |
| අඩු කළා :- පෙර වර්ෂ ගැලපුම් | - | (554) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | (712,426) | (587,314) |

## 2.4 2012 හා 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පෙර වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 දෙසැම්බර් 31 දිනට | | 2011 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | රු.('000) | | රු.('000) | |
| දේපළ, පිරියත හා උපකරණ | 978,065 | | 932,210 | |
| කෙරගෙන යන වැඩ | 109,004 | | 39,826 | |
| දිගුකාලීන අයෝජන | 16,842 | | 12,275 | |
| සේවක ණය දිගුකාලීන | 25,550 | 1,129,461 | 25,281 | 1,009,592 |
| ජංගම වත්කම් | | | | |
| ඉන්වෙන්ට්‍රි තොග | 17,517 | | 16,979 | |
| වෙනත් ලැබීම් | 999 | | 189 | |
| සේවක අත්තිකාරම් | 967 | | 608 | |
| ප්‍රාග්ධන අත්තිකාරම් | 59,911 | | 46,565 | |
| සැපයුම් අත්තිකාරම් | 1,140 | | 3,013 | |
| ඉදිරියට ගෙවීම් | 1,341 | | 1,541 | |
| වෙනත් ජංගම වත්කම් | 4,935 | | 3,314 | |
| ඉතිරි කිරීම් තැන්පත් | 342 | | 309 | |
| මුදල් සහ බැංකු | 28,732 | 115,884 | 31,597 | 104,115 |
| මුළු වත්කම් | | 1,245,345 | | 1,113,707 |
| වගකීම් | | | | |
| ජංගම වගකීම් | | | | |
| විවිධ ණය හිමියෝ | 13,981 | | 30,087 | |
| තැන්පත් | 2,891 | | 812 | |
| ගෙවිය යුතු වියදම් | 14,372 | | 15,839 | |
| වෙනත් වියදම් | 49,137 | (80,381) | 62,340 | (109,078) |
| ජංගම නොවන වගකීම් | | | | |
| මූලධන වියදම් | 1,453,863 | | 1,292,665 | |
| මූලධන ගෙවීම් කෙරගෙන යන වැඩ | 109,004 | | 39,826 | |
| වියදම් නොකළ මූලධන ප්‍රදාන | 562 | | 835 | |
| විශේෂ ප්‍රදාන | 200,047 | (1,763,476) | 162,423 | (1,495,749) |
| පරිත්‍යාග අරමුදල | 396 | | 389 | |
| ශිෂ්‍ය සුභ සාධක අරමුදල | - | | - | |
| විශේෂ අරමුදල් | 12,530 | | 6,328 | |
| පර්යේෂණ අරමුදල් | - | | - | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 66,772 | (79,698) | 55,261 | (61,978) |
| මුළු ශුද්ධ වත්කම් | | (678,210) | | (553,098) |
| සමුච්චිත අරමුදල | (712,426) | | (587,314) | |
| වෙන් කිරීම් | 34,216 | | 34,216 | |
| ස්කන්ධය | | (678,210) | | (553,098) |

## 03. විගණන විෂය පථය සීමා කිරීම

| විෂය පථය සීමා කළ අයිතමයන් | වටිනාකම රු. | විෂය පථය සීමා කළ ආකාරය |
|---|---|---|
| i. ඉන්ධන වියදම් | 5,106,936 | මුදල් රෙගුලාසි 1646 අනුව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ කොටසක් විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| ii. වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 2,991,600 | |

## 04. ස්ථාවර වත්කම් ක්ෂයකිරීමේ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට අනුව පහත දැක්වෙන අනුපාතයන්ට ක්ෂය කර තිබුණි.

| වත්කම් වර්ගය | ක්ෂය ක්‍රමය | ක්ෂය අනුපාතය |
|---|---|---|
| ඉඩම් | - | - |
| ගොඩනැගිලි | සරල මාර්ග ක්‍රමය | 5% |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - එම - | 10% |
| මෝටර් වාහන | - එම - | 20% |
| ලීබඩු සහ සවිකිරීම් | - එම - | 10% |
| කාර්යාලීය හා අනෙකුත් උපකරණ | - එම - | 20% |
| විද්‍යාගාර ඉගැන්වීමේ උපකරණ | - එම - | 20% |
| පුස්තකාල පොත් සහ සඟරා | - එම - | 20% |
| උපාධි කබා | - එම - | 20% |
| මෘදුකාංග | - එම - | 20% |
| අනෙකුත් ස්ථාවර වත්කම් | - එම - | 20% |

## 05. විශ්ව විද්‍යාල කළමනාකරණ හා පාලක සභා රැස්වීම් පිළිබඳ තොරතුරු

| කළමනාකරණ හා පාලක සභා රැස්වීමේ නම | පවත්වා ඇති රැස්වීම් ප්‍රමාණය | වර්ෂය සඳහා අවම වශයෙන් පැවැත්විය යුතු රැස්වීම් ප්‍රමාණය | වැඩියෙන් / (අඩුවෙන්)පවත්වා ඇති රැස්වීම් ප්‍රමාණය |
|---|---|---|---|
| i. පාලක සභා | 10 | 10 | - |
| ii. මුදල් කමිටු | 09 | 10 | (01) |
| iii. විගණන හා කළමනාකරණ කමිටු | 05 | 04 | 01 |

06. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

විශ්ව විද්‍යාලයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණු අතර, පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් කාර්තු පදනම මත වියදම් කරන ආකාරය පිළිබඳ විස්තරයක් පමණක් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

07. අභ්‍යන්තර විගණනය

විශ්ව විද්‍යාලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මකව තිබුණි.

08. මුදල් කමිටු

විශ්ව විද්‍යාලය විසින් මුදල් කමිටුවක් පිහිටුවා තිබූ අතර, වර්ෂය තුළදී එහි රැස්වීම් 09 ක් පමණක් පවත්වා තිබුණි.

09. ප්‍රසම්පාදන සැලැස්ම

විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

10. මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන සේ වයඹ විශ්ව විද්‍යාලයේ සේවක සංඛ්‍යාව සමන්විත වී තිබුණි.

| අනුමත තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්තය/ (ඌණතාවය) |
|---|---|---|---|
| අධ්‍යයන | | | |
| විධායක | 166 | 132 | (34) |
| සහායක | 25 | 08 | (17) |
| තාවකාලික | 62 | 70 | 08 |
| බාහිර දේශක | - | 16 | 16 |
| | 253 | 226 | 27 |
| අනධ්‍යයන | | | |
| විධායක | 31 | 29 | (02) |
| ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | 155 | 137 | (28) |
| සුළු සේවක | 156 | 134 | (22) |
| කම්කරුවන් බාහිරින් බඳවාගැනීම | - | 32 | 32 |
| | 342 | 332 | 20 |
| වෙනත් | | | |
| පුහුණුවන්නන් | - | 31 | 31 |
| පුස්තකාල පුහුණුවන්නන් | - | - | - |
| | - | 31 | 31 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක සහ සහායක තනතුරුවල පුරප්පාඩු, ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනයට සෘජුවම බලපෑමක් සිදුවී ඇති බැව් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ආ) අධ්‍යයන අංශයේ තාවකාලික නිදර්ශකයන් හා නිබන්ධකයින්ගේ අනුමත සංඛ්‍යාව වූ 62 ඉක්මවා 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී බාහිර දේශකයින් 16 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඒ සඳහා රු.1,267,559 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඈ) අධ්‍යයන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 253 ක් වූ අතර, අනුමත තාවකාලික හා බාහිර දේශකයින් සංඛ්‍යාව ඉක්මවා නිලධාර් 24 දෙනෙකු බඳවා ගැනීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන කාර්ය මණ්ඩලය 226 දක්වා වැඩි වී තිබුණද, විධායක හා සහායක කාර්ය මණ්ඩලය සඳහා නියමිත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීමෙන් සේවකයින් 51 ක පුරප්පාඩු පැවතුනි.

(ඉ) විධායක හා ලිපිකාර හා සමාන්තර සේවාවල පුරප්පාඩු 30 ක් පැවතියද, වර්ෂය මුල හා මැද එය වරින් වර අඩු වැඩි වී තිබුණ අතර, එය දෛනික කටයුතුවලට එතරම් බලපෑමක් සිදුව නොතිබුණි.

(ඊ) සුළු සේවකයින් 22 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, විවිධ හේතු දක්වමින් බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 32 දෙනෙකු 2012 වර්ෂයේදී බඳවාගෙන, ඒ වෙනුවෙන් රු.5,075,302 ක මුදලක් ශ්‍රම සැපයූ ආයතනයකට ගෙවා තිබුණි.

(උ) ලිපිකරු හා සමාන්තර සේවා සහ සුළු සේවකයින්ගේ අනුමත සේවක සංඛ්‍යාව 311 ක් වූ අතර, සත්‍ය වශයෙන් සේවකයින් 271 දෙනෙකු සේවයේ යොදවාගෙන වැටුපට අමතරව ඔවුනට අතිකාල වෙනුවෙන්ද රු.7,682,304 ක මුදලක් ගෙවා තිබුණි.

(ඌ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අමතරව විවිධ තනතුරු සඳහා තාවකාලික පත්වීම් ලබා දී තිබූ අතර, 2012 වර්ෂය තුළ තාවකාලික කාර්ය මණ්ඩල වැටුප් වශයෙන් රු. 31,762,070 ක් ගෙවා තිබුණි.

10. පිළිතුරු නොසැපයූ විගණන විමසුම් සංඛ්‍යාව

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන විමසුම් 23 ක් නිකුත් කර තිබූ අතර, ඉන් විමසුම් 02 ක් වෙනුවෙන් මෙතෙක් පිළිතුරු සපයා නොතිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන විමසුම් අංකය | නිකුත් කළ දිනය | ප්‍රමාද කාලය 2013.05.30 දිනට |
|---|---|---|
| එන්ඩබ්/පීටී/බී/1-2/ව.වි.වි/2012/XIII | 2013.04.04 | මාස 07 ක් පමණ |
| එන්ඩබ්ලිව්/පීටී/බී/1-2/ව.වි.වි./2012/XX | 2013.05.21 | මාස 05 ක් පමණ |

11. වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීම

| ප්‍රසිද්ධ කළයුතු වාර්ෂික වාර්තාවට අදාල වර්ෂය | ප්‍රසිද්ධ කළ වර්ෂය | විගණන නිරීක්ෂණ |
|---|---|---|
| 2009/2010 | ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇති බව ලිපිගොනුවෙන් අනාවරණය වුවත්, ප්‍රසිද්ධ කල වර්ෂය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අංක.PED/2 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තියට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තියට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, විශ්ව විද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| 2011 | මෙතෙක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි. | |

12. ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්ව විද්‍යාලයේ විවිධ අරමුදල් වලින් ලද පොලිය රු. 636,606 ක් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මෙහි ඇතුළත් ගිවිසුම් කඩකිරීම්වලට අදාල තැන්පත් සඳහා ලැබුණු පොලිය රු. 493,369 ක් වූ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 737 හා 1998 අගෝස්තු 18 දිනැති චක්‍රලේඛය ප්‍රකාර මෙම පොලී විශ්ව විද්‍යාල ආදායමට ලබා ගත යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්ව විද්‍යාලය විසින් පවත්වා නිමකරන ලද විවිධ බාහිර පාඨමාලාවල ලාභයෙන් 10% ක් උපකුලපති අරමුදලට බැරකල යුතු බව, අදාල ඇස්තමේන්තුවේ සහ උපලේඛන පොතේ දක්වා තිබුණද, නිමකළ පාඨමාලා 02 කට අදාලව එහි අදියර 08 කින් රු.1,293,610 ක් එලෙස බැර කර නොතිබූ අතර, තවත් පාඨමාලා 03 කින් බැරකල යුතු ප්‍රමාණයවත් ගණනය කර දක්වා නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි පාඨමාලාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන කුලියාපිටිය ලංකා බැංකු ජංගම ගිණුමේ 2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හඳුනා නොගත් තැන්පතු ලෙස තිබූ රු. 213,700 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට කෙරගෙනයන වැඩ ගිණුමේ වූ රු. 141,918 ක ශේෂය පියමඟ පියස ඉදිකිරීම සඳහා 2004 වර්ෂයේදී ගෙවා තිබූ අත්තිකාරමක් වන අතර, ඒ හේතුවෙන් අත්තිකාරම් අඩුවෙන්ද, කෙරගෙන යන වැඩ ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඉ) ගබඩා ඌනතාවය වූ රු. 37,855 ක්ද අත්හැර දමන ලද ව්‍යාපාර ගණකාධිකරණ පාඨමාලාවේ ආරම්භක වියදම් සඳහා වැයකර තිබූ රු. 144,448 ක නිශ්කාර්ය වියදමද ජංගම වත්කම් ලෙස දැක්වීමෙන් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) රසායන ද්‍රව්‍ය තොග ගැලපීම.

--------------------------------

ප්‍රධාන ලෙජරයේ රසායන ද්‍රව්‍ය තොග ගිණුමේ විස්තරය පහත පරිදි විය.

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 2,533,907 |
| (0605) වැය ශීර්ෂයට | 211,014 |
| | ------------- |
| අවසාන ශේෂය | 2,322,893 |
| | ======= |

ආරම්භක සහ අවසාන ශේෂ අතර වෙනස වූ රු. 211,014 ක ප්‍රමාණය 0605 වැය ශීර්ෂයට ජ'නල් සටහන් 457 මගින් හර කර තිබුණි. ඒ අනුව ලෙජර ගිණුම පරීක්ෂා කිරීමෙන් වර්ෂය තුළ ලබා ගත් තොග ප්‍රමාණය හා භාවිතා කිරීම නිසා ඉවත් වූ ප්‍රමාණය හඳුනා ගැනීමට නොහැකි විය.

(උ) IRQUE හා MBA ව්‍යාපෘති සඳහා පිළිවෙලින්, රු. 136,600 හා රු. 1,361,700 වශයෙන් එකතුව රු. 1,498,300 ක මුදලක් විශ්ව විද්‍යාල අරමුදලින් වියදම් කර තිබූ අතර, එම වටිනාකම වයඹ විශ්ව විද්‍යාල අරමුදලට පියවා නොතිබුණි.

(ඌ) Outreach Centre හි ව්‍යාපෘති 07 ක් ඇතුළුව ව්‍යාපෘති 08 කින් රු. 305,205 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

(එ) වියදම්වල අසාමාන්‍ය වැඩිවීම.

--------------------------------

වයඹ විශ්ව විද්‍යාලය විසින් කුලියාපිටිය නගර සභාවෙන් මනු අංක 828 යටතේ ලබා ගන්නා ජල පරිභෝජනය 2012 මාර්තු මස වන විට තුන් ගුණයකින් පමණ වැඩිවී තිබූ අතර, 2012 මාර්තු මාසයට අදාලව රු. 100,737 ක් ගෙවීම් කර තිබුණි. මාසික පාරිභෝජනය හා වියදමේ අසාමාන්‍ය වර්ධනය පහත දැක්වේ.

| වර්ෂය හා මසය | මනු කියවීම | මුදල |
|---|---|---|
| | | රු. |
| 2012 ජනවාරි | 842 | 32,788 |
| 2012 පෙබරවාරි | 1827 | 61,000 |
| 2012 මාර්තු | 3010 | 100,737 |
| 2012 අප්‍රේල් | 7290 | 238,537 |
| 2012 මැයි | 1800 | 261,581 |

13. නොසැසඳු පාලන ගිණුම්

----------------------------

වර්ෂ 2007 සිට 2012 දක්වා තොග ලෙජර් ගිණුම් හා සමීක්ෂණ මණ්ඩල වාර්තා අතර සිදුව තිබූ වෙනස්කම්වල එකතුව වූ රු. 37,855 ක වටිනාකම ගබඩා ගැලපුම් ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණි.

14. ගිණුම්වලින් අත්හැරීම්

----------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) අරමුදල් ආයෝජන යටතේ දක්වා තිබූ පහත සඳහන් ආයෝජනයන් 2009 දෙසැම්බර් 31 දිනට දක්වන ලද ශේෂයම 2012 දෙසැම්බර් 31 දිනටද දක්වා තිබූ අතර, ලැබිය යුතු පොලී ගණනය කර ගිණුම්ගත කර ගිණුම් යාවත්කාලීන කර නොතිබුණි.

| අරමුදල | 2009 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | රු. | රු. |
| අයි.ආර්.එම්. ෆොන්සේකා ශිෂ්‍යත්ව අරමුදල | 50,000 | 50,000 |
| සීලිම්ලයින් ප්‍රයිවට් ලිමිටඩ් ශිෂ්‍යත්ව අරමුදල | 60,000 | 60,000 |
| ලංකා බැංකු ශිෂ්‍යාධාර අරමුදල | 80,000 | 80,000 |

14. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2012 ජනවාරි 01 දිනට වූ 1999 සිට පැවත එන රු. 40,018 ක ශේෂයක් අයකරගත යුතුව තිබුණි.

(ආ) වර්ෂ කීපයක සිට පැවත එන රු. 51,090 ක වැටුප් අත්තිකාරම්ද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 123,426 ක ආපදා ණය ශේෂයක්ද, නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,917 ක්ද සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි.

(ඇ) 1996 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීමට නිකුත් කර තිබූ රු. 868,582 ක සැපයුම් අත්තිකාරම්ද, 2011 වර්ෂයේදී ලබාදී තිබූ රු. 73,270 ක සැපයුම් අත්තිකාරම්ද, වසර 02 සිට 08 දක්වා කාලයක් ඉක්ම වූ රු. 205,220 ක සේවා අත්තිකාරම් සහ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් නොකළ 2009 වර්ෂයේදී පුස්තකාල පොත් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතුව තිබූ රු. 4,130,770 ක්ද සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි.

## 15. ගෙවිය යුතු ගිණුම් සම්බන්ධ වයස් විශ්ලේෂණය

| ණයහිමි වර්ගය | දෙසැම්බර් 31 දිනට ශේෂය | මාස 0-3 | වයස් විශ්ලේෂණය<br>මාස 3-6 | මාස 6-9 | මාස 9-12 | වසර 1 ට වැඩි |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **විවිධ ණයහිමි** | | | | | | |
| රැඳවුම් මුදල් ඉදිකිරීම් | 10,814,365 | 1,951,314 | 1,184,277 | 46,535 | - | 7,632,239 |
| රැඳවුම් මුදල් සැපයුම් | 20,510 | - | - | - | - | 20,510 |
| සැපයුම් ණයහිමි | 2,980,629 | 2,737,932 | - | - | - | 242,697 |
| විවිධ ණයහිමි | 165,611 | 58,888 | 11,700 | 23,350 | 10,300 | 61,373 |
| | 13,981,115 | 4,748,134 | 1,195,977 | 69,885 | 10,300 | 7,956,819 |
| **තැන්පතු** | | | | | | |
| ටෙන්ඩර් තැන්පතු | 188,275 | 129,575 | - | - | - | 58,700 |
| ආරක්ෂක තැන්පතු | 366,283 | 100,000 | 45,000 | 5,000 | 5,000 | 211,283 |
| නොගෙවූ මහපොළ | 1,590,450 | 1,571,700 | - | - | - | 18,750 |
| නොගෙවූ ශිෂ්‍යාධාර | 739,600 | 25,600 | 117,300 | 164,000 | 227,100 | 205,600 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | 2,000 | - | - | - | - | 2,000 |
| ආරක්ෂක තැන්පත් | 4,200 | - | - | - | - | 4,200 |
| | 2,890,808 | 1,826,875 | 162,300 | 169,000 | 232,100 | 500,533 |

16. විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(අ) වටිනාකම රු. 178,481,008 ක් වූ ඉඩම්වලට අදාල සින්නක්කර ඔප්පු, වටිනාකම රු. 677,470,904 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 කට අදාල ස්ථාවර වත්කම් ලේඛණ හා උපලේඛණද, වටිනාකම රු. 2,980,629 ක්වූ සැපයුම් ණයහිමියන් සහ රු. 165,611 ක් වූ විවිධ ණයහිමියන්ට අදාල ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අදාල සේවාව සත්‍ය වශයෙන්ම ලබාගත් බවට සහ ඒ සඳහා ගතකරන ලද යන්ත්‍ර පැය ගණන නිවැරදි බවට සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී ජලනල එලීම සඳහා කාණු කැපීම සහ පොල් පැල සිටුවීම සඳහා වලවල් කැපීම, පොල් මුල් ඉවත්කිරීම ආදී කාර්යයන් සඳහා යොදවාගත් බැකෝ යන්ත්‍රයක් වෙනුවෙන් යන්ත්‍ර පැය 165 ක් සහ 55 ක් සඳහා පිළිවෙලින් රු.327,000 ක් සහ රු.99,000 ක් පුද්ගලයකුට ගෙවා තිබුණි.

17. මූල්‍ය ප්‍රතිඵලවල විචලන විශ්ලේෂණය

| | අයිතම් විස්තරය | පෙර වර්ෂයේ වියදම | සමාලෝචිත වර්ෂයේ වියදම | විචලතාවය | නිරීක්ෂණ |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| (අ) | වැටුප් හා වේතන | 268,105,000 | 314,206,381 | 46,101,381 | පසුගිය වර්ෂයට වඩා 18% කින් වියදම වැඩිවී ඇත. |
| (ආ) | ගමන් වියදම් හා යැපීම් දීමනා | 1,007,000 | 875,427 | 131,573 | පසුගිය වර්ෂයට වඩා 13% කින් වියදම අඩුවී ඇත. |
| (ඇ) | සැපයුම් | 22,635,000 | 19,492,978 | 3,142,022 | පසුගිය වර්ෂයට වඩා 14% කින් වියදම අඩුවී ඇත. |
| (ඈ) | නඩත්තු | 7,613,000 | 8,881,711 | 1,268,711 | පසුගිය වර්ෂයට වඩා 17% කින් වියදම වැඩිවී ඇත. |
| (ඉ) | කොන්ත්‍රාත්තු සේවා | 80,741,000 | 99,703,430 | 18,962,430 | පසුගිය වර්ෂයට වඩා 24% කින් වියදම වැඩිවී ඇත. |
| (ඊ) | අනෙකුත් පුනරාවර්තන වියදම් | 9,591,000 | 10,542,782 | 951,782 | පසුගිය වර්ෂයට වඩා 10% කින් වියදම වැඩිවී ඇත. |
| (උ) | ශිෂ්‍යාධාර | 25,606,000 | 21,186,550 | 4,419,450 | පසුගිය වර්ෂයට වඩා 18% කින් වියදම අඩුවී ඇත. |
| (ඌ) | ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන | 97,919,000 | 109,299,921 | 11,380,921 | පසුගිය වර්ෂයට වඩා 12% කින් වියදම වැඩිවී ඇත. |



18. නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) පනත් | |
| 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII පරිච්ඡේදයේ 99 (ඇ) වගන්තිය | කවර හෝ ප්‍රභවයකින් හෝ උපයා ගනු ලබන සියලුම ආදායම් විශ්ව විද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, එම නියමයෙන් බැහැරව පාඨමාලා 07 ක් සහ ව්‍යාපෘති 05 ක් යටතේ ලද රු.61,421,345 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැරකර නොතිබුණ අතර, ඒවා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය | |
| ix පරිච්ඡේදයේ 2 ඡේදය | ආයතන සංග්‍රහයට පටහැනිව අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි. |
| 2 ඡේදයේ 2.1 හා 2.2 වගන්ති | අතිකාල දීමනා අනුමත කළ හැක්කේ ආයතනය තුළ එම කටයුතු ඉටුකිරීමට අභ්‍යන්තර වැඩ පිළිවෙලක් නොමැති අවස්ථාවක් හා කාර්යාල වේලාව තුළ අවසන් කළ නොහැකි වැඩ සඳහා පමණක් වුවද එයට පටහැනිව කටයුතු කර තිබුණි. |
| 4.5 වගන්තිය | අතිකාල වියදම් පාලනයට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. |
| iii පරිච්ඡේදයේ 1.2.3 ඡේදය | විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ගේ තනතුරු සඳහා පත්කිරීමේ බලධරයා විශ්ව විද්‍යාලයක පාලක මණ්ඩලය වුවත් එයට පටහැනිව ආචාර්ය තනතුරු සඳහා තාවකාලික පදනමින් උපකුලපතිවරයා විසින් බඳවා ගැනීම් සිදුකර තිබුණි. |
| 26.13 වගන්තිය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ හා ව්‍යවහාරික විද්‍යාපීඨයේ පැමිණීමේ ලේඛණය නඩත්තු කිරීමේදී එක් එක් බාහිර කථිකාචාර්යවරයා වෙනුවෙන් වෙන් වෙන්ව පිටුව බැගින් වෙන් කර තිබීමෙන් පැමිණීමේ ලේඛණය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |

| | |
|---|---|
| xix පරිච්ඡේදයේ 5.5 වගන්තිය | විශ්ව විද්‍යාලයට අයත් නිල නිවාස හා බදු පදනම මත ලබාගෙන ඇති නිවාස වලින් හවුලේ පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කුලී අයකිරීම වෙනුවට විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් තීරණය කරන ලද ක්‍රමයකට කුලී ගණනය කර අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 845,482 ක නිවාස කුලී අඩුවෙන් අයකරගෙන තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මු.රෙ. 271 (2) (i) | නොගෙවන ලද චැටුප් දින 14 කින් පසුව අධිගාර කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ වෙනත් ගිණුමකට මාරුකර අවසන් කිරීම හෝ කළ යුතු වුවද, 1995 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා නොගෙවන ලද රු. 478,303 ක් වටිනා චැටුප් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.371 (2) (ආ) වගන්තිය | අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද එම සීමාව ඉක්මවා අවස්ථා 13 කදී රු.528,935 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. මීට අමතරව අග්‍රිම සීමා ඉක්මවා වැඩ ඉංජිනේරුහටද අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (iii) මු.රෙ.396 (ඇ) | වටිනාකම රු.283,759 ක් වූ නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්මවූ චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ.571(2) වගන්තිය | තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්මවන ලද රු. 6,995,133 ක් වටිනා විවිධ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |



| | |
|---|---|
| (v) මු.රෙ.756 | 2012 දෙසැම්බර් 31 දිනට වට්ටෝරු භාණ්ඩ |

සමීක්ෂණය සිදුකර අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | |
|---|---|
| (vi) මු.රෙ.835 (1) | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබානොගෙන ගොඩනැගිලි බද්දට ගෙන ඒ සඳහා බදු මුදල් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.6,324,000 ක් ගෙවා තිබුණි. |
| (vii) 1646 | වාහන 07 කට අදාල 2012 වර්ෂයේ ධාවන සටහන් වලින් කොටසක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| 13/2008 (iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී උපකුලපතිවරයාට හිමි ඉන්ධන සීමාව ඉක්මවා රු.100,128 ක් වටිනා අමතර ඉන්ධන ලබාගෙන තිබුණි. |

(ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අප්‍රේල් 07 දිනැති චක්‍රලේඛ අංක 45

| | |
|---|---|
| 04 (ආ) ඡේදය | වයඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂණ දීමනා වශයෙන් රු. 994,875 ක් ලබාගත් විදේශගත වූ ආචාර්යවරුන් 09 දෙනෙකු එම වසර තුළ කරන ලද අවසාන පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 3.5.1 (ආ) (iii) ඡේදය | (i). සෘජු කොන්ත්‍රාත් ක්‍රමය මත මිලදී ගැනීමේදී පාඨ ග්‍රන්ථ ප්‍රසම්පාදනය කිරීම පොත් ප්‍රකාශකයින්ගෙන් පමණක් ලබා ගත හැකි වුවද රු. 4,130,700 ක් වටිනා පොත් ලබාගත් Quanty Distributors ආයතනය පොත් ප්‍රකාශකයකු නොවන අතර, ප්‍රකාශකයින් විශාල සංඛ්‍යාවකට අයත් පොත් එම ආයතනයෙන් ලබා ගෙන තිබුණි. |



(ii). විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට මිලදී

| | |
|---|---|
| | ගැනීම් නොකිරීම හේතුවෙන් අදාල ස්ථානයට ගෙවිය යුතුව තිබූ රු. 4,130,710 ක මුදල ගෙවීමට නොහැකි වී ඇත. |
| | (iii). මෙම පොත් ලබා ගැනීම 2009 වර්ෂයේ සිදුවී ඇති අතර, නිසි පරිදි මිලදී ගැනීම් සිදු වූයෙන් නම් මෙම පොත් වලින් 80% ක ප්‍රතිශතයක් මේ වන විට ක්ෂය ප්‍රතිපාදන කර තිබිය යුතු විය. |
| (ඌ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ අංක 150 | |
| (i) ඡේදය | (i). වර්ෂ 10 ට වඩා පැරණි වාහන 02 ක් අපහරණය කර නොතිබුණි. |
| | (ii). කුලී වාහන ඉවත් කළ යුතු වූවද වයඹ විශ්ව විද්‍යාලයේ 2012 වර්ෂය තුළ කුලී වාහන සඳහා කුලිය වශයෙන් රු. 416,150 ක් ගෙවා තිබුණි. |
| | (iii). අදාල සාක්ෂි ඉදිරිපත් නොකර වාහන කුලී වශයෙන් රු. 10,500 ක් ගෙවා තිබුණි. |
| 03 ඡේදය | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා චක්‍රලේඛයේ කොන්දේසි ඉක්මවා රු. 250,127 ක් ඉන්ධන සඳහාද රු. 11,369,941 ක් විදුලිය සඳහාද ඉන්ධන හා විදුලිය පරිභෝජනය අරපිරිමැස්මෙන් කිරීමට මූලිකත්වය දීම ජාතික වගකීමක් ලෙස හා ප්‍රතිපාදන මුදල තුළ අදාල වියදම් දැරිය යුතු බව දක්වා තිබුණද ඉන්ධන සඳහා රු. 106,936 ක් හා විදුලිය සඳහා රු. 2,663,001 කින්ද ඉහත චක්‍රලේඛයට පටහැනිව වියදම් කර තිබුණි. |
| (එ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2010 අගෝස්තු 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 445 (3) | පෞද්ගලික ආරක්ෂක සේවාවන් තෝරා ගැනීමේදී එම සේවාවල ප්‍රමිතීන් හා මිල ගණන් පිළිබඳව අවධානය යොමු කළ යුතු වූවද, පෙර වසරවල ආරක්ෂක සේවය සඳහා ගෙවන ලද මිල හා වර්තමාන මිල ගණන් අතර 266% ක වැඩිවීමක් නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| (ඒ) 2011 අප්‍රේල් 19 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 9/2011 | චක්‍රලේඛයට අනුව අදාල වර්ෂයේ පර්යේෂණ දීමනා ගෙවීමට කලින්, පෙර වර්ෂයේ පර්යේෂණ වාර්තා ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව 2011 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 04 දෙනෙකු වෙතද, 2012 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 19 දෙනෙකු වෙතද, පර්යේෂණ දීමනා අඛණ්ඩව ගෙවා තිබුණි. |

19. **ක්‍රියාකාර සැලැස්මට අනුව කටයුතු කිරීම.**

---

(අ) ක්‍රියාකාර සැලැස්මට අනුව ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ රු. 59,500,000 ක් වෙන් කර තිබූ අතර, එම ප්‍රතිපාදනයට අදාල වැඩ විෂයයන් මොනවාද යන්න සැලසුම් කර නොතිබුණු අතර විවිධ වැඩ විෂයයන් 44 ක් සඳහා රු. 54,746,913 ක් වැය කර තිබුණි.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. 139,000,000 ක් වටිනා වැඩ විෂයයන් ඉටු කිරීමට අපේක්ෂා කලද සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ විෂයයන් 09 ක් ඉටුකර තිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැඩ විෂය විස්තරය | | පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන | වෙන් කරන ලද ප්‍රතිපාදන | භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | 2012 වර්ෂයේ සත්‍ය වියදම | ඉතිරිය/ (අතිරික්තය) | | නිරීක්ෂණ |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වටිනාකම | ප්‍රතිශතය | |
| | | රු. | රු. | රු. | රු. | රු. | % | |
| (i). | ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිල්ල පියවර II ඉදිකිරීම | (4.115,886) | 10,000,000 | 9,000,000 | - | 4,884,114 | 54 | අවසන් බිල්පත සහතික කර නොතිබීම. |
| (ii). | පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ පියවර II ඉදිකිරීම | (7,445,370) | 12,210,000 | 12,000,000 | - | 4,554,630 | 38 | අවසන් බිල්පත උපදේශණ ආයතනය විසින් නියමිත වේලාවට සහතික නොකිරීම. |
| (iii). | පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | (2,441,378) | - | - | 871,919 | (3,313,297) | (100) | උපදේශණ සේවා ගාස්තු ගෙවීම නිසා බිල්පත් පියවීමට මුදල් ප්‍රමාණවත් නොවීම. |
| (iv). | මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම | (1,119,582) | 6,000,000 | 6,000,000 | 2,058,052 | 2,822,366 | 47 | කොන්ත්‍රාත්කරු බිල්පත් ඉදිරිපත් නොකිරීම. |
| (v). | මාකඳුර පරිශ්‍රයේ නේවාසිකාගාර පියවර VI හා V ඉදිකිරීම | - | 2,000,000 | 4,000,000 | 161,280 | 3,838,720 | 96 | යෝජිත ඉඩම නොලැබීම. |
| (vi). | කුලියාපිටිය වෛද්‍ය මධ්‍යස්ථානයේ II පියවර ඉදිකිරීම | (13,980) | 5,500,000 | 5,500,000 | 1,808,531 | 3,691,469 | 64 | කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් ඉදිරිපත් නොකිරීම. |
| (vii). | මාකඳුර ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම | 7,705,873 | 2,000,000 | - | - | 7,705,873 | 100 | ඉඩම මිලදී ගැනීම සඳහා අපේක්ෂා කල මුදල් නොලැබීම. |
| (viii). | කාර්ය මණ්ඩල සඳහා නිල නිවාස ඉදිකිරීම | (840,071) | 11,500,000 | 10,000,000 | 3,326,811 | 5,833,118 | 58 | කොන්ත්‍රාත්කරු වැඩ ප්‍රමාද කිරීම. |
| (ix). | වැවිලි කළමනාකරණ පීඨ ගොඩනැගිල්ලේ II පියවර ඉදිකිරීම | 633,099 | 14,000,000 | 14,000,000 | 26,861,991 | (12,228,892) | (45) | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. |

20. නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

(අ) Sandee Researh Grant, Gelt programme, Business Experience Exchange project, shrimp farm, FLICT project යන ව්‍යාපෘති 05 හි පිළිවෙලින් රු.124,463, රු. 46,148, රු.89,296 , රු. 40,000 , රු. 9,275 හි එකතුව රු. 309,182 ක මුදල වර්ෂය තුළ කිසිදු කාර්යයකට යොදවා නොතිබුණි.

(ආ) Outreach මධ්‍යස්ථානයට IRQUE ව්‍යාපෘතිය යටතේ ලද රු. 1,000,000 ක මුදල කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ඇ) තොග සමීක්ෂණ මණ්ඩල විසින් හඳුනා නොගත් වර්ෂ 2003 සිට 2010 දක්වා කාලය තුළ මිලට ගන්නා ලද රු. 677,991 ක් වටිනා තොග විශ්ව විද්‍යාල ගබඩාවල වසර කිහිපයක් තිස්සේ නිකුත් නොකර නිශ්කාර්යව තිබුණි. මාකඳුර ගබඩාවේ ඇති රු. 127,652 ක් වටිනා දොර අගුලු 55 ක් වසර දෙකක් තිස්සේ නිකුත් නොකර තිබියදී, 2012 වසර තුළදී රු. 36,064 ක් වැය කර නඩත්තු කටයුතු සඳහා දොර අගුලු 14 ක් මිලට ගෙන තිබුණි.

21. අනාර්ථික ගණුදෙනු

---

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) කුලියාපිටිය පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් බදු ගැනීමේදී පාලක සභාවේ අවසරය මත, තක්සේරු වටිනාකම ඉක්මවා රු. 559,000 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ලබාගත් නේවාසිකාගාර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම ඉක්මවා රු. 90,000 ක් ගෙවා තිබුණි.

(ඇ) මෙම ගොඩනැගිලි සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මාසික කුලී පදනම මත තක්සේරු වටිනාකම ලබාගෙන එම වටිනාකම අනුව වාර්ෂිකව ගණන් බලා බදු මුදල් ගෙවා තිබුණ අතර, වාර්ෂික බදු කුලී තක්සේරුවක් ලබාගත්තේ නම් තක්සේරු මුදල මීට වඩා අඩු විය හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමේදී ඉදිරිපත් කර තිබූ මිල ගණන් අතරින් වැඩිම මිල ගණන් තෝරා ගෙන තිබුණි.

(ඉ) ව්‍යාපාර ගණකාධිකරණ පාඨමාලාව සඳහා වැය කර තිබූ රු. 144,448 ක මුදල නිශ්කාර්ය වියදම් විය.

(ඊ) කෙරගෙන යන වැඩ ගිණුමේ දක්වා ඇති FBSF Car Park එකෙහි වටිනාකම රු. 546,996 ක් වූ අතර, එම වටිනාකම මිලදීගත් ද්‍රව්‍ය ගබඩාවේ ගොඩ ගසා ඇති අතර, වාහන නැවතුම ඉදිකර නොතිබුණි. එයට අමතරව රු. 845,700 ක් වැය කරමින් FBSF හි Car Park එකක් 2012 වර්ෂයේදී ඉදිකර තිබුණි.

22. **අනුමැතිය රහිත ගෙවීම්.**

(අ) IDRC ව්‍යාපෘතිය යටතේ වයඹ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු වෙත පශ්චාත් ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා මසකට රු. 115,000 බැගින් ගෙවා තිබූ අතර, දීමනා සඳහා අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 11.1 හා 11.2 ඡේදවලට පටහැනිව වයඹ පළාත් සභා ධීවර අමාත්‍යාංශය හා ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියෙන් ව්‍යාපෘති සඳහා අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා රු. 219,500 ක් දීමනා ගෙවා තිබුණි.

23. **අත්හරින ලද ව්‍යාපෘති**

2004 වර්ෂයේදී මාකඳුර පරිශ්‍රයේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ Foot path with the Roof top එක ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු. 141,918 ක අත්තිකාරමක් ගෙවා තිබූ අතර, මේ වන විට එය ඉදිකිරීම අත්හැර දමා තිබුණි.

24. **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ තථ්‍ය වියදම් ඇස්තමේන්තුගත වියදම් සමඟ සසඳා අදාල වියදමද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයයන් | ඇස්තමේන්තුගත වියදම | තත්‍ය වියදම | විචලනය (වැඩිවීම)අඩුවීම |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| වැටුප් හා වේතන | 139,307 | 151,073 | 11,766 |
| විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල | 17,500 | 20,283 | (2,783) |
| විශ්‍රාම දීමනා | 9,937 | 13,090 | (3,153) |
| සේවක භාරකාර අරමුදල | 5,335 | 6,675 | (1,340) |
| වැඩ බැලීමේ දීමනා | 200 | 259 | (59) |
| අධ්‍යයන දීමනා | 29,082 | 32,002 | (2,920) |
| භාෂා ප්‍රවීණතා දීමනාව | 315 | 307 | 8 |
| ජීවන වියදම් දීමනා | 39,539 | 34,601 | 5,478 |
| අනෙකුත් දීමනා | 2,050 | 2,560 | (510) |
| බාහිර දේශන ගාස්තු | 1,685 | 1,267 | 418 |

| | | | |
|---|---|---|---|
| අතිකාල | 7,500 | 7,682 | (182) |
| නිවාඩු දින වැටුප් | 66 | 68 | (2) |
| 5% දීමනාව | 6,958 | 19,112 | (12,154) |
| පාර්තෝෂික දීමනා | 10,000 | 13,199 | (3,199) |
| පර්යේෂණ දීමනා | 13,717 | 12,565 | 1,152 |
| දේශීය (ගමන් වියදම්) | 720 | 565 | 155 |
| විදේශීය ( ගමන් වියදම්) | 355 | 311 | 44 |
| කාර්යාල ලිපිද්‍රව්‍ය | 7,950 | 6,285 | 1,665 |
| ඉන්ධන | 5,000 | 5,106 | (106) |
| නිල ඇදුම් හා කුලී | 1,630 | 1,826 | (196) |
| කාර්යාල හා විදුලි උපකරණ | 1,105 | 1,088 | 17 |
| රසායනික ද්‍රව්‍ය | 4,260 | 2,823 | 1,437 |
| වෛද්‍ය උපකරණ | 260 | 187 | 73 |
| අනෙකුත් සැපයුම් | 2,485 | 2,176 | 309 |
| <u>නඩත්තු වියදම්</u> | | | |
| වාහන | 1,835 | 2,992 | (1,157) |
| යන්ත්‍ර පිරියත | 3,000 | 3,121 | (121) |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 1,600 | 2,087 | (487) |
| ගෘහ භාණ්ඩ | 100 | 128 | (28) |
| අනෙකුත් | 500 | 554 | (54) |
| <u>ඉදිකිරීම් සේවා</u> | | | |
| ප්‍රවාහන ගාස්තු | 2,800 | 2,710 | 90 |
| දුරකථන වියදම් | 9,245 | 7,943 | 1,302 |
| තැපැල් වියදම් | 465 | 294 | 171 |
| විදුලි වියදම් | 22,000 | 24,663 | (2,663) |
| ආරක්ෂක වියදම් | 19,597 | 36,621 | (17,024) |
| ජලය | 825 | 710 | 115 |
| පිරිසිදු කිරීමේ වියදම් | 13,700 | 13,562 | 138 |
| කුලී වාහන ගාස්තු | 4,170 | 5,041 | (871) |
| බදු කුලී | 35 | - | 35 |
| මුද්‍රණ | 2,000 | 2,400 | (400) |
| අනෙකුත් | 6,000 | 5,758 | 242 |
| <u>අනෙකුත් පුනරාවර්තන වියදම්</u> | | | |
| Travel Grants university Teachres | 15 | - | 15 |
| විශේෂ සේවා - වෘත්තීය සම්මේලනය | 2,025 | 931 | 1,094 |
| වැඩමුළු, දේශන | 585 | 257 | 328 |
| අධ්‍යයන පර්යේෂණ | 1,225 | 409 | 816 |
| කාර්ය මණ්ඩල සංවර්ධන | 1,000 | 648 | 352 |
| පශ්චාත් උපාධි පර්යේෂණ | 275 | - | 275 |
| ඉගැන්නුම් උපකරණ | 200 | - | 200 |
| කර්මාන්ත නඩත්තු | 600 | - | 600 |
| ශිෂ්‍ය සංවර්ධන | 550 | 288 | 262 |

| | | | |
|---|---|---|---|
| ශිෂ්‍ය සුභසාධක, සේවක සුභසාධක | 140 | 974 | (834) |
| සංයුක්ත සැලැස්ම | 50 | - | 50 |
| අනෙකුත් ආයතනවලට දීමනා | 60 | 201 | (141) |
| නිවාඩු දුම්රිය බලපත් | 55 | 33 | 22 |
| සංග්‍රහ වියදම් | 310 | - | 310 |
| සාමාජික දීමනා | 200 | 354 | (154) |
| උපාධි ප්‍රදානෝත්සවය | 1,500 | 783 | 717 |
| අනෙකුත් | 735 | 1,430 | (695) |
| බැංකු ගාස්තු | 25 | 23 | 2 |
| විභාග ගාස්තු | 1,280 | 2,176 | (896) |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් | 50 | 428 | (378) |
| පදක්කම් | 70 | - | 70 |
| Expenditure on Extension projects/ postgraduate | 30 | - | 30 |

**නිරීක්ෂණයන්**

--------------

(අ) වාර්ෂික අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ ඒකකයක් ලෙස භාවිතා කර නොතිබුණ බව පහත සඳහන් අවස්ථාවන් ගෙන් නිරීක්ෂණය විය.

(ආ) අයවැය ලේඛන සකස් කිරීමේදී අයිතම 25 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 25 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

(ඈ) වැය විෂයයන් 09 ක මුළු ප්‍රතිපාදිත මුදලම වියදම් කර නොතිබුණි.

24.1 **අයවැයට ඇතුලත් නොකර දරන ලද වියදම්**

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් විෂයයන් සඳහා රු.130,964,967 වියදම් දරා තිබුණ නමුත් 2012 වර්ෂයේ අයවැය ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

Financial Assistance to Student

-------------------------------------

| වැය විෂයය විස්තරය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| 1001 | මහපොල ශිෂ්‍යත්ව - (U.G.C) | 1,741,250 |
| 1002 | BURSARES | 8,727,200 |
| 1004 | මහපොල ශිෂ්‍යත්ව - (භාණ්ඩාගාර අරමුදල්) | 10,718,100 |
| | | 21,186,550 |

ස්ථාවර වත්කම් ක්ෂය

-------------------------

| | | |
|---|---|---|
| 1201 | ගොඩනැගිලි | 37,235,628 |
| 1202 | ගෘහ භාණ්ඩ හා උපකරණ | 5,721,122 |
| 1203 | විදුලි උපකරණ | 1,407,340 |
| 1204 | ජල සැපයුම් | 935,871 |
| 1205 | යන්ත්‍ර හා උපකරණ | 357,886 |
| 1206 | කාර්යාල උපකරණ | 22,966,310 |
| 1207 | පුස්තකාල පොත් | 4,905,329 |
| 1208 | වාහන | 10,522,653 |
| 1209 | විද්‍යාගාර හා විද්‍යා උපකරණ | 25,336,875 |
| 1210 | CLOAKS | 309,003 |
| 1212 | SOFTWARE PACKAGE | 80,400 |
| | | 109,778,417 |

### 24.2 සංයුක්ත සැලැස්ම

විශ්ව විද්‍යාලය විසින් 2010 - 2015 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, එම සැලැස්මට අනුව සමාලෝචිත වසර තුළදී ඉටුකළ යුතුව තිබූ පහත දැක්වෙන අධ්‍යයන කටයුතු වලට අදාල නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි.

| සංයුක්ත සැලැස්මට අනුව ඉලක්ක අංකය | අරමුණු අංකය | ඉටුකර නොතිබූ කාර්යය |
|---|---|---|
| ඉලක්ක 02 | අරමුණු 01 | 1. එක් පීඨයකට එකක් බැගින් දෙපාර්තමේන්තු සංඛ්‍යාව වැඩි කිරීම. |
| | අරමුණු 02 | 1. තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය. |
| | | 2. ඉලෙක්ට්‍රොනික පාඨමාලාවක් හඳුන්වා දීම. - ව්‍යවහාරික විද්‍යා පීඨය. |
| | | 3. කාර්මික කළමනාකරණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය. |
| | | 4. නව උපාධි පාඨමාලා හඳුන්වා දීම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය. |
| ඉලක්ක 03 | අරමුණු 04 | 1. ඉංජිනේරු සහ වෛද්‍ය පීඨයන් ආරම්භ කිරීම. |
| | | 2. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ආරම්භ කිරීම. |
| | | 3. අතිරේක අධ්‍යයන දෙපාර්තමේන්තු ආරම්භ කිරීම. |

24.3 වාහන උපයෝජනය

IDRC ව්‍යාපෘතියේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ කුලී වාහන වෙනුවෙන් රු. 2,653,706 ක් ගෙවා තිබූ අතර, වෙන් කර තිබූ ප්‍රතිපාදනය රු. 1,795,000 ක් වීමෙන් රු. 858,706 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. තවද පාවිච්චි කරනු ලබන වාහන වෙනුවෙන් ධාවන සටහන් හා ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

25. **මෙහෙයුම් සමාලෝචනය**

25.1 **කාර්ය සාධනය**

2012 වර්ෂයේ එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම සහ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය |
|---|---|---|---|---|---|
| 2012 වර්ෂයේ වියදම | රු. | 49,046,407 | 59,621,296 | 65,611,393 | 66,078,130 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | 1042 | 375 | 382 | 314 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 47,086 | 159,990 | 171,757 | 210,440 |

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(අ) 2012 වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ පීඨ තුනක් සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගොස් තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | වයඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරුවී ගිය සංඛ්‍යාව ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | | | | % |
| 1. | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 344 | 17 | 05 |
| 2. | ව්‍යවහාරික විද්‍යා පීඨය | 146 | 100 | 68 |
| 3. | වැවිලි කළමනාකරණ පීඨය | 114 | 46 | 40 |
| 4. | පශුධීවර පෝෂණ විද්‍යා පීඨය | 109 | 47 | 43 |

## 25.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතුව සිටි ආචාර්‍යවරුන් 08 දෙනෙකු විදේශගත වීමේදී, විශ්ව විද්‍යාලය සමඟ එකඟ වූ ගිවිසුම් ප්‍රකාර නියමිත දින යලි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුම් කඩකර තිබුණ අතර, ඒ අනුව ඔවුන්ගෙන් විශ්ව විද්‍යාලයට අයවිය යුතු මුදල් ප්‍රමාණයේ හිඟ මුදල වූ රු. 2,951,092 ක් හා අර්ථ සාධක හා පාර්තෝෂික මුදලින් හිලව් කර ගැනීමට හැකියාව ඇති මුදල රු. 7,256,695 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) තොග පාලනය

අයිතම් 41 කට අදාලව රු. 49,604 ක් වටිනා භාණ්ඩ තොග සමීක්ෂණ මණ්ඩල විසින් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස දක්වා තිබුණි.

(i). මේ අතර රු. 3,802 ක් වටිනා වර්ෂ 10 ට වඩා පැරණි Moter Spair Parts තිබුණි.

(ii). උපලේඛණ පොතේ පිටු අංක 18 දක්වා ඇති මාකඳුර ගබඩාවේ Door Lock union එකක් රු. 2,014.88 බැගින් රු. 50,372 ක් වටිනා දොර ලොග් 25 ක්ද රු. 2,576 බැගින් රු. 77,280 ක් වටිනා දොර ලොග් 30 ක්ද වශයෙන් මුළු දොර ලොග් 55 ක ශේෂයක් පැවති අතර, පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද එම ශේෂයම පැවතී. මේ සඳහා අනවශ්‍ය ලෙස වැය කරන ලද මුදල රු. 127,652 ක් විය. මේ ආයතනයේ දොර ලොග් තිබියදී නඩත්තු අවශ්‍යතා සඳහා 2012 වර්ෂයේදී රු. 36,064 කට දොර ලොග් 14 ක් නැවත මිලට ගෙන තිබුණි.

(iii). කුලියාපිටිය ප්‍රධාන ගබඩාවේ සහ මාකඳුර ගබඩාවේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස තොග සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා මිලට ගත් එහෙත් අවසාන වර්ෂ කිහිපය තුළ ප්‍රයෝජනයට නොගන්නා ලද රු. 677,991 ක් වටිනා භාණ්ඩ වර්ග කීපයක් නිරීක්ෂණය විය. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ගය | ප්‍රමාණය | වටිනාකම<br>රු. | මිලදී ගත් වර්ෂය |
|---|---|---|---|
| 15 x 10 ලියුම් කවර (කුලි) | 14900 | 81,950 | 2009 |
| ෆොටෝ කොපි ටෝනර් (කුලි) | 66 | 150,551 | මෙයින් 55 ක් 2003 සිට 2007 දක්වා මිලට ගෙන ඇත. |
| ෆොටෝ කොපි ටෝනර් (මාකඳුර) | 47 | 302,495 | 2006 හා 2007 වර්ෂවල මිලට ගෙන ඇත. |
| ප්‍රින්ට රිබන් (මාකඳුර) | 28 | 126,263 | 2006 හා 2007 වර්ෂවල මිලට ගෙන ඇත. |
| ෆැක්ස් මැෂින් තීන්ත (මාකඳුර) | 05 | 16,732 | 2010 මිලට ගෙන ඇත. |

(ඇ) ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා සී/ස රක්නාලංකා සමාගම සමඟ වයඹ විශ්ව විද්‍යාලය නව ගිවිසුමක් අත්සන් නොකර 2012 ඔක්තෝබර් 13 දින සිට දෙසැම්බර් 31 දක්වා රු. 7,532,840 ක් ගෙවා තිබුණි.

(ඈ) ඉහත සේවාව ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව අතර එකඟ වූ ගිවිසුමේ ඊ (v) ඡේදය ප්‍රකාර සමාගම විසින් පැය 12 ට වඩා වැඩි සේවා මුර සඳහා ආරක්ෂක නිලධාරීන් සේවයේ නොයෙදවිය යුතු වුවත් අවශ්‍යතාවය මත පමණක් පැය 12 මත පැය 24 නොඉක්මවන ලද පරිදි සේවයේ යෙදවිය යුතු වුවද පැය 24 ක් දක්වා නිතරම සේවයේ යොදවන බව කුලියාපිටිය පරිශ්‍රයේ අවස්ථා 440 ක් සහ මාකඳුර පරිශ්‍රයේ අවස්ථා 219 ක් වශයෙන් නිරන්තර ගෙවීම් සේවයෙන් යොදවා ගන්නා පැය 24 කට වඩා වැඩි බව හා ඊට අමතරව පැය 72 ක කාලයක් ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවන බව නිරීක්ෂණය විය.

(ඉ) විශ්ව විද්‍යාල පුස්තකාලය සඳහා පොත් තෝරා ගැනීම පමණක් පුස්තකාල ප්‍රතිග්‍රහන කමිටුවට අයත් කාර්යයක් වුවද එම සීමාව ඉක්මවා ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව පොත් ලබා ගෙන පරිග්‍රහන ලේඛණයටද ඇතුළත් කර ඉන්වෙන්ට්‍රි සහතිකද නිකුත් කර ගෙවීම් සඳහා සැපයුම් අංශයට ඉදිරිපත් කර තිබුණි.

25.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 2011 ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 04 කදී ලබාදෙන ලද කොන්ත්‍රාත් අත්තිකාරම් රු.16,051,630 ක්ද, 1996 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම් අත්තිකාරම් වශයෙන් අවස්ථා 14 ලබාදෙන ලද රු.868,582 ක් සහ 2003 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 21 කදී ලබාදෙන ලද රු.205,220 ක සේවා අත්තිකාරම්ද 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු. 1,203,313 ක් වටිනා ෆොටෝ කොපි කොළ විශ්ව විද්‍යාලය විසින් ලබා ගෙන තිබූ අතර, ගබඩාවෙන් එම ද්‍රව්‍ය ලබා ගන්නා අංශ විසින් ලේඛණවල සටහන් කිරීමක් හා විධිමත් ලෙස නිකුත් කිරීමක් සිදුකර නොතිබුණු අතර, වයඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් 2009 වර්ෂයේදී හඳුන්වා දී තිබූ ලිපිද්‍රව්‍ය විධිමත්ව පරිහරණය කිරීමේ ක්‍රමවේදයද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වයඹ විශ්ව විද්‍යාලයේ වැඩ ඉංජිනේරුහට ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂයට ආදලව රු. 453,735 ක නඩත්තු ද්‍රව්‍ය මිලදීගෙන තිබූ අතර, සමහර අවස්ථාවන්හිදී එම ද්‍රව්‍ය ඉල්ලීම් නොමැතිව නිකුත් කර තිබුණි.

(ඈ) මාකඳුර පරිශ්‍රයේ ධීවර පශු සම්පත් හා පෝෂණ විද්‍යා පීඨයේ Park Area කොටසට පස් පිරවීමේදී ආයතන සේවකයකුගේ අධීක්ෂණයකින් තොරව පස් පිරවීම සිදුකර තිබූ අතර, වාහනයේ ධාරිතාවය ගමන් වාර ගණනින් වැඩිකර බොරළු සඳහා රු. 891,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී එකිනෙක පීඨයන්හි කථිකාචාර්යවරුන් වෙත පවරා තිබූ දේශණ හා ප්‍රායෝගික පැය ගණන්වලට අනුව ඉටුකළ පැය ගණන් පරීක්ෂා කිරීමේදී කථිකාචාර්යවරුන් 04 දෙනෙකු දේශණ පැය 52 හා ප්‍රායෝගික පරීක්ෂණ පැය 04 ක් ඉටුකර නොතිබුණි.

(ඊ) වර්ෂ 2010 සිට 2012 දක්වා කාලසීමාව තුළ කථිකාචාර්යවරුන් 14 දෙනෙකු වෙත පර්යේෂණ ආධාර ව්‍යාපෘති 17 ක් සඳහා ඒකාබද්ධ අරමුදලින් රු. 3,028,018 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම පර්යේෂණාධාර සඳහා 2010 හා 2011 වර්ෂයන්හි දරන ලද මුළු වියදම රු. 1,057,048 ක් විය. ප්‍රතිපාදිත මුදලින් 2012 වසර සඳහා රු. 923,027 ක් වෙන් කර තිබුණු අතර, දරන ලද වියදම රු. 404,721 ක් වූයෙන් උපයෝජනය කර නොතිබූ ප්‍රතිශතය 56% ක් විය. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු අනාවරණය විය.

(i). අංක SRHDC/PP/01/10-13 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් දරා නොතිබූ බැවින් එම පර්යේෂණය අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එබැවින් එම පර්යේෂණය සඳහා වෙනත් පර්යේෂකයකු තෝරා ගැනීමට තිබූ ඉඩකඩද ඇහිරී තිබුණි.

(ii). අංක SRHDC/PP/01/10-11, 10-14 හා 10-16 යන පර්යේෂණ ව්‍යාපෘති සඳහා දරන ලද මුළු වියදම පිළිවෙලින් ඇස්තමේන්තු අගයෙන් 38%, 14% හා 12% බැගින් වූ හෙයින් එම පර්යේෂණ ව්‍යාපෘති අසාර්ථක වී ඇති බව හෝ අතරමඟ අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය විය. එම ව්‍යාපෘති වෙනුවෙන් ඒ වන විට දරා තිබූ රු. 119,451 ක වියදම නිශ්කාර්ය වියදමක් විය.

(iii). පර්යේෂණාධාරවලට අදාල වාර්තා 2013 පෙබරවාරි අවසානයට පෙර ඉදිරිපත් කළයුතු බවට තීරණය කර තිබුණද, පර්යේෂණාධාර 16 කට අදාල පර්යේෂණ වාර්තා අතරින් එක් වාර්තාවක් 2013 අගෝස්තු 08 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(උ) අංක SRHDC/PP/01/10-13 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් කර නොතිබූ බැවින් එම පර්යේෂණ අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එබැවින් එම පර්යේෂණ සඳහා වෙනත් පර්යේෂකයකු තෝරා ගැනීමට තිබූ ඉඩකඩද ඇහිරී තිබුණි.

(ඌ) අංක SRHDC/PP/01/10 -02,10-11,10-14,10-16 හා 10-07 යන පර්යේෂණ ව්‍යාපෘති සඳහා දරන ලද මුළු වියදම පිළිවෙලින් ඇස්තමේන්තු අගයෙන් 6%, 28%, 12%, හා 7% බැගින් වූ හෙයින් එම පර්යේෂණ ව්‍යාපෘති අසාර්ථක වී ඇති බව හෝ අතරමඟ අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් ඒ වන විට දරා තිබූ රු. 158,151 ක වියදම නිශ්කාර්ය වියදමක් විය.

(එ) පර්යේෂණාධාරවලට අදාල වාර්තා 2013 පෙබරවාරි අවසානයට පෙර ඉදිරිපත් කළයුතු බවට පර්යේෂණාධාර කමිටුව විසින් තීරණය කර තිබුණද, ඒකාබද්ධ අරමුදලින් දරන ලද රු. 1,479,885 කට අදාල පර්යේෂණ වාර්තා විශ්ව විද්‍යාල පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

25.4 **විධිමත් තහවුරු කිරීමක් නොමැති ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී බැකෝ යන්ත්‍රයක් මගින් සේවාවන් ලබාගෙන ඒ සඳහා රු. 632,910 ක පුද්ගලයකුට ගෙවා තිබූ අතර, අදාල සේවාව සඳහා ගතකරන ලද යන්ත්‍ර පැය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 25.5 ඵලදායී නොවන ගනුදෙනු

(අ) ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය පිහිටුවීමට යෝජිත භූමිය තුළ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර තිබියදී එම පරිශ්‍රය සඳහා රු. 425,619 ක් වැය කර ජල සැපයුමක් ලබාගෙන තිබුණි.

(ආ) පෞද්ගලික ශ්‍රම සේවා සපයා ගැනීම සඳහා Global Tech Environmental Service සමාගම ගිවිසුමකට බැඳී තිබූ අතර ගිවිසුමේ 06 ජේදය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ ඉල්ලීමක් නොමැතිව අතිකාල සේවයේ යෙදවීම් වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් ගෙවීම් නොකෙරෙනු ඇත යන්න සඳහන් කර ඇතත් පූර්ව ඉල්ලීමක් නොමැති අතිකාල සඳහා ශ්‍රමිකයන් ලබා ගෙන ඒ සඳහා රු. 347,053 ක් හා ගිවිසුමේ 10 ජේදය ප්‍රකාර අමතර ශ්‍රමිකයන් සැපයීම විශ්ව විද්‍යාලයේ අමතර අවශ්‍යතාවයක් සඳහා දැනුම්දීමක් කළ යුතු වූවද එසේ දැනුම්දීමකින් තොරව අමතර ශ්‍රමිකයින් ලබාගෙන ඒ සඳහා රු. 105,850 ක් ගෙවා තිබුණි.

## 25.6 කාර්ය මණ්ඩල පාලනය

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වයඹ විශ්ව විද්‍යාලය විසින් නිලධාරීන්ගේ වැටුපින් 20% - 90% ක පරාසයක් තුළ අතිකාල අනුමත කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 5,158,960 ක් වැය කර තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අමතරව වයඹ විශ්ව විද්‍යාලය විසින් විවිධ තනතුරු සඳහා තාවකාලික පත්වීම් ලබා දී තිබූ අතර, 2012 වර්ෂය තුළ තාවකාලික කාර්ය මණ්ඩල වැටුප් වශයෙන් රු. 31,762,070 ක් ගෙවා තිබුණි.

## 26. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත කරුණු අනාවරණය විය.

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු මිල ගණන් ඉක්මවා තිබූ අතර, ඉදිරිපත් වූ ලංසු 05 න් 04 ක්ම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩුවීමෙන් අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ බව තහවුරු වී තිබුණි. එම මාර්ග ඉදිකිරීමේදී දෙවන වර මතුපිට තාර යෙදීමෙන් පසු වැලි යෙදීම සාමාන්‍ය පිළිගත් ක්‍රමවේදය වූවත් දෙවන වර තාර යෙදීමෙන් පසුද චිප්ස් යොදා තිබූ අතර, එමගින් අදාල කාර්යය ඉටුකළ බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) මාකඳුර පරිශ්‍රයේ ක්‍රීඩාපිටියේ කාණුව වටා ආරක්ෂිත ග්‍රිල් සවිකිරීම කොන්ත්‍රාත්තුව භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

(i). ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෙකුගෙන්ද මිල ගණන් ලබාගෙන එම කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබඳ සලකා නොතිබුණි.

(ii). ඉටුකල යුතු වැඩ විෂයයන් විශ්ලේෂණය නොකර සියළු වැඩ විෂයයන් සඳහා එක් අයිතමයක් ලෙස ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

(iii). නියමිත ප්‍රමිතියේ L Iron භාවිතා කර නොතිබීමෙන් සම්පූර්ණ ඉදිකිරීමම දුර්වල එකක් විය.

(iv). රු. 933,300 ක පිරිවැයකින් නිම කර තිබූ මෙම කොන්ත්‍රාත්තුවට අදාල යකඩ පෑස්සීම සඳහා විශ්ව විද්‍යාලයෙන් විදුලිය ලබා ගෙන තිබූ අතර, ඒ සඳහා රු. 1,000 ක ගාස්තු අඩුකිරීමක් පමණක් සිදුකර තිබුණි.

(v). ඇස්තමේන්තුව අනුව එකිනෙකට වෙනස් වර්ණයන්ගෙන් මල නිවාරණ තීන්ත වාර දෙකක් ආලේප කර ඒ මත කොළ පැහැති ඉනැමල් තීන්ත ආලේප කළ යුතු වුවද, ග්‍රිල් මත කළු පැහැති ඉනැමල් තීන්ත පමණක් ආලේප කර තිබුණි.

27. සමාජ හා පාරිසරික වගකීම් ඉටුකිරීම

----------------------------------------

බඳවා ගැනීමේ පරිපාටිය අනුව විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දේශක තනතුරු සඳහා වූ මූලික සුදුසුකම පළමු පෙල පන්ති සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් විය යුතු වුවත්, එම පීඨය විසින් පිරිනමන උපාධිය විශේෂ උපාධියක් නොවීමේ හේතුවෙන් වර්ෂ 2007 සිට මේ වන තෙක් මෙම පීඨයෙන් පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක් ලබා පිටවූ උපාධිධාරීන් 39 දෙනෙකුට එම පීඨයේ හෝ වෙනත් විශ්ව විද්‍යාලවලද රැකියා අවස්ථා අහිමි වී තිබුණි.

28. පද්ධති හා පාලන දුර්වලතා

-----------------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) පුස්තකාල පොත් මිළදී ගැනීම
(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඇ) අත්තිකාරම්
(ඈ) බාහිර පාඨමාලා
(ඉ) තොග පාලනය
(ඊ) කාර්ය මණ්ඩල
(උ) අයවැය
(ඌ) ප්‍රසම්පාදන

(එම්. කේ.එල්. පද්මිණී)
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

අධ්‍යයන අංශය මඟින් ලබාදෙන විශේෂවේදී උපාධිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කොට ඇත.

තවද, පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයන අංශය මඟින් ලබාදීමට නියමිත විශේෂවේදී උපාධිය සඳහා අවශ්‍ය නව විෂය නිර්දේශ සැකසීම මේවන විට ආරම්භකර ඇති අතර ඉදිරි අධ්‍යයන වර්ෂයේ සිසුන් සඳහා එය පිරිනැමීමට කටයුතු සූදානම්ව පවතී.

6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) පුස්තකාල පොත් මිළදී ගැනීම
(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඇ) අත්තිකාරම්
(ඈ) බාහිර පාඨමාලා
(ඉ) තොග පාලනය
(ඊ) කාර්ය මණ්ඩල
(උ) අයවැය
(ඌ) ප්‍රසම්පාදන

විගණන වාර්තාව මඟින් අවධානයට ලක් කර ඇති පාලන ක්ෂේත්‍රයන්හි පැවති අඩුපාඩු අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි.

මහාචාර්ය එස්.ජේ.බී.ඒ.ජයසේකර
උපකුලපති

උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
කුලියාපිටිය

164

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

WAYAMBA UNIVERSITY OF SRI LANKA ★ KULIYAPITIYA ★ 07 JAN 2014 VICE CHANCELLORS OFFICE

මගේ අංකය / துலைவா / My No: එන්ඩබ්ලිව්/පීඊ/බී/1-2/ව.පී.පී අ.ගි. විගණනය/ 2013/24

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2013 දෙසැම්බර් 31 දින.

WAYAMBA UNIVERSITY OF SRI LANKA ★ KULIYAPITIYA ★ VC-cc ... 08 JAN 2014 REGISTRAR'S OFFICE

උපකුලපති,

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ විගණන වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

(එම්.එල්.කේ. පද්මිණි)
සහකාර විගණකාධි,
විගණකාධිපති වෙනුවට


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මගේ අංකය : එන්ඩබ්/පීටී/බී/1-2/ට.පී.ටී/
2012/ඇ.ගි/2013/24 2013 දෙසැම්බර් 31 දින

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.

**ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ විගණන වාර්තාව**

---

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර කළමනාකරණ විගණන වාර්තාව.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිත පරිදි සහ අවස්ථානුකූලව ප්‍රමාණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 1.3 විගණන විෂයපථය සහ මතය සඳහා පදනම

මාගේ වගකීම වන්නේ විගණන නිරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් විය. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව (SLPSAS 1) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) පොත් අගය ශුන්‍ය ලෙස පෙන්වා තිබූ නමුත් විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන පිරිවැය රු. 64,954,050 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් අවස්ථාවන් නිරීක්ෂණය විය.

(අ)

(i) විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පොලී ආදායම් ගිණුම්ගත කිරීමේදී මුදල් පදනම මත ගිණුම්ගත කළ යුතු වුවද, බාහිර පාඨමාලාවල අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් විශ්ව විද්‍යාලයට ලැබී තිබූ රු.143,237 ක පොලී මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ii) ගිවිසුම් කඩකිරීම් මත විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩලයෙන් අය කර ගෙන, ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමෙන් ලැබී තිබුණු රු. 493,369 ක් වූ පොලිය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 737 හා 1998 අගෝස්තු 18 දිනැති චක්‍රලේඛය ප්‍රකාර විශ්ව විද්‍යාල වියදම් පියවා ගැනීම සඳහා යොදවාගත නොහැකි වුවද, එම පොලිය විශ්ව විද්‍යාල ආදායමට ගෙන නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් මිලදී ගත් දින සිට අපහරණය කරන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම ප්‍රතිපත්තිය වුවද, සමාලෝචිත වර්ෂය ආරම්භයේ තිබූ වත්කම් වෙනුවෙන් ක්ෂය ගණනය කිරීම වැරදි සහගත විය. ඒ අනුව මෝටර් රථ සඳහා රු. 1,240,482 ක්ද, කාර්යාල උපකරණ සඳහා රු. 494,923 ක්ද, විදුලි හා තාක්ෂණ උපකරණ සඳහා රු. 431,555 ක්ද අඩුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණු අතර මෝටර් රථ හැර අනෙකුත් වත්කම් සඳහා නිසි පරිදි ලේඛණ නඩත්තු කර නොතිබුණි.

## 2.3 2012 හා 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පෙර වර්ෂයේ තත්ත්වයන් සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 දෙසැම්බර් 31 දිනට | 2011 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| | රු.('000) | රු.('000) |
| රජයේ ප්‍රදාන පුනරාවර්තන වියදම් සඳහා | 431,000 | 379,463 |
| රජයේ ප්‍රදාන ශිෂ්‍යාධාර | 8,727 | 10,746 |
| රජයේ ප්‍රදාන මහපොළ | 12,459 | 14,861 |
| පුනරාවර්තන ප්‍රදාන (පුනරුත්ථාපන ස්වරූපයේ) | 247 | 1,214 |
| ආයෝජන පොලී | 220 | 12 |
| සේවක ණය පොලී | 960 | 1,003 |
| දේපළ කුලියට දීම | 551 | 509 |
| පැරණි ගබඩා ද්‍රව්‍ය විකුණුම් | 1,123 | 125 |
| නිශ්පාදන විකුණුම් | 589 | 411 |
| විවිධ ලැබීම් | 3,814 | 4,728 |
| ඇතුළත්වීමේ ගාස්තු | 85 | 729 |
| විභාග ගාස්තු | 23 | 43 |
| පුස්තකාල දඩ | 95 | 54 |
| මුළු මෙහෙයුම් ආදායම | 459,893 | 413,898 |
| <u>මෙහෙයුම් වියදම් (ක්ෂය ඇතුළත්ව)</u> | | |
| පුද්ගල පඩිනඩි | 314,206 | 268,105 |
| ගමන් වියදම් | 875 | 1,007 |
| සැපයුම් පාරිභෝජන ද්‍රව්‍ය | 19,493 | 22,635 |
| අළුත්වැඩියා වියදම් | 8,882 | 7,613 |
| ගිවිසුම්ගත සේවා | 99,703 | 80,741 |
| ක්ෂයවීම | 109,869 | 97,919 |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 10,543 | 9,591 |
| මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් | 21,187 | 25,606 |
| පුනරුත්ථාපන වියදම | 247 | 1,214 |
| මුළු මෙහෙයුම් වියදම | 585,005 | 514,431 |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) | (125,112) | (100,533) |
| පෙර වර්ෂයේ ඉදිරියට එන ශේෂය | (587,314) | (487,049) |
| එකතු කළා :- පෙර වර්ෂ ගැලපුම් | - | 286 |
| අඩු කළා :- පෙර වර්ෂ ගැලපුම් | - | (554) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | (712,426) | (587,314) |

## 2.4 2012 හා 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පෙර වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2012 දෙසැම්බර් 31 දිනට | | 2011 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | රු.('000) | | රු.('000) | |
| දේපළ, පිරියත හා උපකරණ | 978,065 | | 932,210 | |
| කෙරගෙන යන වැඩ | 109,004 | | 39,826 | |
| දිගුකාලීන අයෝජන | 16,842 | | 12,275 | |
| සේවක ණය දිගුකාලීන | 25,550 | 1,129,461 | 25,281 | 1,009,592 |
| ජංගම වත්කම් | | | | |
| ඉන්වෙන්ට්‍රි තොග | 17,517 | | 16,979 | |
| වෙනත් ලැබීම් | 999 | | 189 | |
| සේවක අත්තිකාරම් | 967 | | 608 | |
| ප්‍රාග්ධන අත්තිකාරම් | 59,911 | | 46,565 | |
| සැපයුම් අත්තිකාරම් | 1,140 | | 3,013 | |
| ඉදිරියට ගෙවීම් | 1,341 | | 1,541 | |
| වෙනත් ජංගම වත්කම් | 4,935 | | 3,314 | |
| ඉතිරි කිරීම් තැන්පත් | 342 | | 309 | |
| මුදල් සහ බැංකු | 28,732 | 115,884 | 31,597 | 104,115 |
| මුළු වත්කම් | | 1,245,345 | | 1,113,707 |
| වගකීම් | | | | |
| ජංගම වගකීම් | | | | |
| විවිධ ණය හිමියෝ | 13,981 | | 30,087 | |
| තැන්පත් | 2,891 | | 812 | |
| ගෙවිය යුතු වියදම් | 14,372 | | 15,839 | |
| වෙනත් වියදම් | 49,137 | (80,381) | 62,340 | (109,078) |
| ජංගම නොවන වගකීම් | | | | |
| මූලධන වියදම් | 1,453,863 | | 1,292,665 | |
| මූලධන ගෙවීම් කෙරගෙන යන වැඩ | 109,004 | | 39,826 | |
| වියදම් නොකළ මූලධන ප්‍රදාන | 562 | | 835 | |
| විශේෂ ප්‍රදාන | 200,047 | (1,763,476) | 162,423 | (1,495,749) |
| පරිත්‍යාග අරමුදල | 396 | | 389 | |
| ශිෂ්‍ය සුභ සාධක අරමුදල | - | | - | |
| විශේෂ අරමුදල් | 12,530 | | 6,328 | |
| පර්යේෂණ අරමුදල් | - | | - | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 66,772 | (79,698) | 55,261 | (61,978) |
| මුළු ශුද්ධ වත්කම් | | (678,210) | | (553,098) |
| සමුච්චිත අරමුදල | (712,426) | | (587,314) | |
| වෙන් කිරීම් | 34,216 | | 34,216 | |
| ස්කන්ධය | | (678,210) | | (553,098) |

## 03. විගණන විෂය පථය සීමා කිරීම

| විෂය පථය සීමා කළ අයිතමයන් | වටිනාකම රු. | විෂය පථය සීමා කළ ආකාරය |
|---|---|---|
| i. ඉන්ධන වියදම් | 5,106,936 | මුදල් රෙගුලාසි 1646 අනුව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ කොටසක් විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| ii. වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 2,991,600 | |

## 04. ස්ථාවර වත්කම් ක්ෂයකිරීමේ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට අනුව පහත දැක්වෙන අනුපාතයන්ට ක්ෂය කර තිබුණි.

| වත්කම් වර්ගය | ක්ෂය ක්‍රමය | ක්ෂය අනුපාතය |
|---|---|---|
| ඉඩම් | - | - |
| ගොඩනැගිලි | සරල මාර්ග ක්‍රමය | 5% |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - එම - | 10% |
| මෝටර් වාහන | - එම - | 20% |
| ලීබඩු සහ සවිකිරීම් | - එම - | 10% |
| කාර්යාලීය හා අනෙකුත් උපකරණ | - එම - | 20% |
| විද්‍යාගාර ඉගැන්වීමේ උපකරණ | - එම - | 20% |
| පුස්තකාල පොත් සහ සඟරා | - එම - | 20% |
| උපාධි කබා | - එම - | 20% |
| මෘදුකාංග | - එම - | 20% |
| අනෙකුත් ස්ථාවර වත්කම් | - එම - | 20% |

## 05. විශ්ව විද්‍යාල කළමනාකරණ හා පාලක සභා රැස්වීම් පිළිබඳ තොරතුරු

| කළමනාකරණ හා පාලක සභා රැස්වීමේ නම | පවත්වා ඇති රැස්වීම් ප්‍රමාණය | වර්ෂය සඳහා අවම වශයෙන් පැවැත්විය යුතු රැස්වීම් ප්‍රමාණය | වැඩියෙන් / (අඩුවෙන්)පවත්වා ඇති රැස්වීම් ප්‍රමාණය |
|---|---|---|---|
| i. පාලක සභා | 10 | 10 | - |
| ii. මුදල් කමිටු | 09 | 10 | (01) |
| iii. විගණන හා කළමනාකරණ කමිටු | 05 | 04 | 01 |

## 06. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

විශ්ව විද්‍යාලයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණු අතර, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් කාර්තු පදනම මත වියදම් කරන ආකාරය පිළිබඳ විස්තරයක් පමණක් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

## 07. අභ්‍යන්තර විගණනය

විශ්ව විද්‍යාලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මකව තිබුණි.

## 08. මුදල් කමිටු

විශ්ව විද්‍යාලය විසින් මුදල් කමිටුවක් පිහිටුවා තිබූ අතර, වර්ෂය තුළදී එහි රැස්වීම් 09 ක් පමණක් පවත්වා තිබුණි.

## 09. ප්‍රසම්පාදන සැලැස්ම

විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 10. මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන සේ වයඹ විශ්ව විද්‍යාලයේ සේවක සංඛ්‍යාව සමන්විත වී තිබුණි.

| අනුමත තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්තය/ (ඌණතාවය) |
|---|---|---|---|
| අධ්‍යයන | | | |
| විධායක | 166 | 132 | (34) |
| සහායක | 25 | 08 | (17) |
| තාවකාලික | 62 | 70 | 08 |
| බාහිර දේශක | - | 16 | 16 |
| | 253 | 226 | 27 |
| අනධ්‍යයන | | | |
| විධායක | 31 | 29 | (02) |
| ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | 155 | 137 | (28) |
| සුළු සේවක | 156 | 134 | (22) |
| කම්කරුවන් බාහිරින් බඳවාගැනීම | - | 32 | 32 |
| | 342 | 332 | 20 |
| වෙනත් | | | |
| පුහුණුවන්නන් | - | 31 | 31 |
| පුස්තකාල පුහුණුවන්නන් | - | - | - |
| | - | 31 | 31 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක සහ සහායක තනතුරුවල පුරප්පාඩු, ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනයට සෘජුවම බලපෑමක් සිදුවී ඇති බැව් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ආ) අධ්‍යයන අංශයේ තාවකාලික නිදර්ශකයන් හා නිබන්ධකයින්ගේ අනුමත සංඛ්‍යාව වූ 62 ඉක්මවා 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී බාහිර දේශකයින් 16 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඒ සඳහා රු.1,267,559 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඈ) අධ්‍යයන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 253 ක් වූ අතර, අනුමත තාවකාලික හා බාහිර දේශකයින් සංඛ්‍යාව ඉක්මවා නිලධාර් 24 දෙනෙකු බඳවා ගැනීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන කාර්ය මණ්ඩලය 226 දක්වා වැඩි වී තිබුණද, විධායක හා සහායක කාර්ය මණ්ඩලය සඳහා නියමිත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීමෙන් සේවකයින් 51 ක පුරප්පාඩු පැවතුනි.

(ඉ) විධායක හා ලිපිකාර හා සමාන්තර සේවාවල පුරප්පාඩු 30 ක් පැවතියද, වර්ෂය මුල හා මැද එය වරින් වර අඩු වැඩි වී තිබුණ අතර, එය දෛනික කටයුතුවලට එතරම් බලපෑමක් සිදුව නොතිබුණි.

(ඊ) සුළු සේවකයින් 22 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, විවිධ හේතු දක්වමින් බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 32 දෙනෙකු 2012 වර්ෂයේදී බඳවාගෙන, ඒ වෙනුවෙන් රු.5,075,302 ක මුදලක් ශ්‍රම සැපයූ ආයතනයකට ගෙවා තිබුණි.

(උ) ලිපිකරු හා සමාන්තර සේවා සහ සුළු සේවකයින්ගේ අනුමත සේවක සංඛ්‍යාව 311 ක් වූ අතර, සත්‍ය වශයෙන් සේවකයින් 271 දෙනෙකු සේවයේ යොදවාගෙන වැටුපට අමතරව ඔවුනට අතිකාල වෙනුවෙන්ද රු.7,682,304 ක මුදලක් ගෙවා තිබුණි.

(ඌ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අමතරව විවිධ තනතුරු සඳහා තාවකාලික පත්වීම් ලබා දී තිබූ අතර, 2012 වර්ෂය තුළ තාවකාලික කාර්ය මණ්ඩල වැටුප් වශයෙන් රු. 31,762,070 ක් ගෙවා තිබුණි.

10. පිළිතුරු නොසැපයූ විගණන විමසුම් සංඛ්‍යාව

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන විමසුම් 23 ක් නිකුත් කර තිබූ අතර, ඉන් විමසුම් 02 ක් වෙනුවෙන් මෙතෙක් පිළිතුරු සපයා නොතිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන විමසුම් අංකය | නිකුත් කළ දිනය | ප්‍රමාද කාලය 2013.05.30 දිනට |
|---|---|---|
| එන්ඩබ්/පීටී/බී/1-2/ව.වි.වි/2012/XIII | 2013.04.04 | මාස 07 ක් පමණ |
| එන්ඩබ්ලිව්/පීටී/බී/1-2/ව.වි.වි./2012/XX | 2013.05.21 | මාස 05 ක් පමණ |

11. වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීම

| ප්‍රසිද්ධ කළයුතු වාර්ෂික වාර්තාවට අදාල වර්ෂය | ප්‍රසිද්ධ කළ වර්ෂය | විගණන නිරීක්ෂණ |
|---|---|---|
| 2009/2010 | ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇති බව ලිපිගොනුවෙන් අනාවරණය වුවත්, ප්‍රසිද්ධ කල වර්ෂය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අංක.PED/2 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තියට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තියට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, විශ්ව විද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| 2011 | මෙතෙක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි. | |

12. ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්ව විද්‍යාලයේ විවිධ අරමුදල් වලින් ලද පොලිය රු. 636,606 ක් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මෙහි ඇතුළත් ගිවිසුම් කඩකිරීම්වලට අදාල තැන්පත් සඳහා ලැබුණු පොලිය රු. 493,369 ක් වූ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 737 හා 1998 අගෝස්තු 18 දිනැති චක්‍රලේඛය ප්‍රකාර මෙම පොලී විශ්ව විද්‍යාල ආදායමට ලබා ගත යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්ව විද්‍යාලය විසින් පවත්වා නිමකරන ලද විවිධ බාහිර පාඨමාලාවල ලාභයෙන් 10% ක් උපකුලපති අරමුදලට බැරකල යුතු බව, අදාල ඇස්තමේන්තුවේ සහ උපලේඛන පොතේ දක්වා තිබුණද, නිමකළ පාඨමාලා 02 කට අදාලව එහි අදියට 08 කින් රු.1,293,610 ක් එලෙස බැර කර නොතිබූ අතර, තවත් පාඨමාලා 03 කින් බැරකල යුතු ප්‍රමාණයවත් ගණනය කර දක්වා නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි පාඨමාලාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන කුලියාපිටිය ලංකා බැංකු ජංගම ගිණුමේ 2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හඳුනා නොගත් තැන්පතු ලෙස තිබූ රු. 213,700 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට කෙරීගෙනයන වැඩ ගිණුමේ වූ රු. 141,918 ක ශේෂය පියමඟ පියස ඉදිකිරීම සඳහා 2004 වර්ෂයේදී ගෙවා තිබූ අත්තිකාරමක් වන අතර, ඒ හේතුවෙන් අත්තිකාරම් අඩුවෙන්ද, කෙරීගෙන යන වැඩ ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඉ) ගබඩා ඌනතාවය වූ රු. 37,855 ක්ද අත්හැර දමන ලද ව්‍යාපාර ගණකාධිකරණ පාඨමාලාවේ ආරම්භක වියදම් සඳහා වැයකර තිබූ රු. 144,448 ක නිශ්කාර්ය වියදමද ජංගම වත්කම් ලෙස දැක්වීමෙන් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) රසායන ද්‍රව්‍ය තොග ගැලපීම.

--------------------------------

ප්‍රධාන ලෙජරයේ රසායන ද්‍රව්‍ය තොග ගිණුමේ විස්තරය පහත පරිදි විය.

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 2,533,907 |
| (0605) වැය ශීර්ෂයට | 211,014 |
| | ------------- |
| අවසාන ශේෂය | 2,322,893 |
| | ======= |

ආරම්භක සහ අවසාන ශේෂ අතර වෙනස වූ රු. 211,014 ක ප්‍රමාණය 0605 වැය ශීර්ෂයට ජ'නල් සටහන් 457 මගින් හර කර තිබුණි. ඒ අනුව ලෙජර ගිණුම පරීක්ෂා කිරීමෙන් වර්ෂය තුළ ලබා ගත් තොග ප්‍රමාණය හා භාවිතා කිරීම නිසා ඉවත් වූ ප්‍රමාණය හඳුනා ගැනීමට නොහැකි විය.

(උ) IRQUE හා MBA ව්‍යාපෘති සඳහා පිළිවෙලින්, රු. 136,600 හා රු. 1,361,700 වශයෙන් එකතුව රු. 1,498,300 ක මුදලක් විශ්ව විද්‍යාල අරමුදලින් වියදම් කර තිබූ අතර, එම වටිනාකම වයඹ විශ්ව විද්‍යාල අරමුදලට පියවා නොතිබුණි.

(ඌ) Outreach Centre හි ව්‍යාපෘති 07 ක් ඇතුළුව ව්‍යාපෘති 08 කින් රු. 305,205 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

(එ) වියදම්වල අසාමාන්‍ය වැඩිවීම.

--------------------------------

වයඹ විශ්ව විද්‍යාලය විසින් කුලියාපිටිය නගර සභාවෙන් මනු අංක 828 යටතේ ලබා ගන්නා ජල පරිභෝජනය 2012 මාර්තු මස වන විට තුන් ගුණයකින් පමණ වැඩිවී තිබූ අතර, 2012 මාර්තු මාසයට අදාලව රු. 100,737 ක් ගෙවීම් කර තිබුණි. මාසික පාරිභෝජනය හා වියදමේ අසාමාන්‍ය වර්ධනය පහත දැක්වේ.

| වර්ෂය හා මසය | මනු කියවීම | මුදල |
|---|---|---|
| | | රු. |
| 2012 ජනවාරි | 842 | 32,788 |
| 2012 පෙබරවාරි | 1827 | 61,000 |
| 2012 මාර්තු | 3010 | 100,737 |
| 2012 අප්‍රේල් | 7290 | 238,537 |
| 2012 මැයි | 1800 | 261,581 |

13. නොසැසඳු පාලන ගිණුම්

----------------------------

වර්ෂ 2007 සිට 2012 දක්වා තොග ලෙජර් ගිණුම් හා සමීක්ෂණ මණ්ඩල වාර්තා අතර සිදුව තිබූ වෙනස්කම්වල එකතුව වූ රු. 37,855 ක වටිනාකම ගබඩා ගැලපුම් ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණි.

14. ගිණුම්වලින් අත්හැරීම්

----------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) අරමුදල් ආයෝජන යටතේ දක්වා තිබූ පහත සඳහන් ආයෝජනයන් 2009 දෙසැම්බර් 31 දිනට දක්වන ලද ශේෂයම 2012 දෙසැම්බර් 31 දිනටද දක්වා තිබූ අතර, ලැබිය යුතු පොලී ගණනය කර ගිණුම්ගත කර ගිණුම් යාවත්කාලීන කර නොතිබුණි.

| අරමුදල | 2009 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | රු. | රු. |
| අයි.ආර්.එම්. ෆොන්සේකා ශිෂ්‍යත්ව අරමුදල | 50,000 | 50,000 |
| සීලිම්ලයින් ප්‍රයිවට් ලිමිටඩ් ශිෂ්‍යත්ව අරමුදල | 60,000 | 60,000 |
| ලංකා බැංකු ශිෂ්‍යාධාර අරමුදල | 80,000 | 80,000 |

14. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2012 ජනවාරි 01 දිනට වූ 1999 සිට පැවත එන රු. 40,018 ක ශේෂයක් අයකරගත යුතුව තිබුණි.

(ආ) වර්ෂ කීපයක සිට පැවත එන රු. 51,090 ක වැටුප් අත්තිකාරම්ද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 123,426 ක ආපදා ණය ශේෂයක්ද, නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,917 ක්ද සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි.

(ඇ) 1996 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීමට නිකුත් කර තිබූ රු. 868,582 ක සැපයුම් අත්තිකාරම්ද, 2011 වර්ෂයේදී ලබාදී තිබූ රු. 73,270 ක සැපයුම් අත්තිකාරම්ද, වසර 02 සිට 08 දක්වා කාලයක් ඉක්ම වූ රු. 205,220 ක සේවා අත්තිකාරම් සහ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් නොකළ 2009 වර්ෂයේදී පුස්තකාල පොත් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතුව තිබූ රු. 4,130,770 ක්ද සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි.

## 15. ගෙවිය යුතු ගිණුම් සම්බන්ධ වයස් විශ්ලේෂණය

| | | වයස් විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|---|---|
| ණයහිමි වර්ගය | දෙසැම්බර් 31 දිනට ශේෂය | මාස 0-3 | මාස 3-6 | මාස 6-9 | මාස 9-12 | වසර 1 ට වැඩි |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| <u>විවිධ ණයහිමි</u> | | | | | | |
| රැඳවුම් මුදල් ඉදිකිරීම් | 10,814,365 | 1,951,314 | 1,184,277 | 46,535 | - | 7,632,239 |
| රැඳවුම් මුදල් සැපයුම් | 20,510 | - | - | - | - | 20,510 |
| සැපයුම් ණයහිමි | 2,980,629 | 2,737,932 | - | - | - | 242,697 |
| විවිධ ණයහිමි | 165,611 | 58,888 | 11,700 | 23,350 | 10,300 | 61,373 |
| | 13,981,115 | 4,748,134 | 1,195,977 | 69,885 | 10,300 | 7,956,819 |
| <u>තැන්පතු</u> | | | | | | |
| ටෙන්ඩර් තැන්පතු | 188,275 | 129,575 | - | - | - | 58,700 |
| ආරක්ෂක තැන්පතු | 366,283 | 100,000 | 45,000 | 5,000 | 5,000 | 211,283 |
| නොගෙවූ මහපොල | 1,590,450 | 1,571,700 | - | - | - | 18,750 |
| නොගෙවූ ශිෂ්‍යාධාර | 739,600 | 25,600 | 117,300 | 164,000 | 227,100 | 205,600 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු | 2,000 | - | - | - | - | 2,000 |
| ආරක්ෂක තැන්පත් | 4,200 | - | - | - | - | 4,200 |
| | 2,890,808 | 1,826,875 | 162,300 | 169,000 | 232,100 | 500,533 |

16. විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(අ) වටිනාකම රු. 178,481,008 ක් වූ ඉඩම්වලට අදාල සින්නක්කර ඔප්පු, වටිනාකම රු. 677,470,904 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 කට අදාල ස්ථාවර වත්කම් ලේඛණ හා උපලේඛණද, වටිනාකම රු. 2,980,629 ක්වූ සැපයුම් ණයහිමියන් සහ රු. 165,611 ක් වූ විවිධ ණයහිමියන්ට අදාල ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අදාල සේවාව සත්‍ය වශයෙන්ම ලබාගත් බවට සහ ඒ සඳහා ගතකරන ලද යන්ත්‍ර පැය ගණන නිවැරදි බවට සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී ජලනල එලීම සඳහා කාණු කැපීම සහ පොල් පැල සිටුවීම සඳහා වලවල් කැපීම, පොල් මුල් ඉවත්කිරීම ආදී කාර්යයන් සඳහා යොදවාගත් බැකෝ යන්ත්‍රයක් වෙනුවෙන් යන්ත්‍ර පැය 165 ක් සහ 55 ක් සඳහා පිළිවෙලින් රු.327,000 ක් සහ රු.99,000 ක් පුද්ගලයකුට ගෙවා තිබුණි.

17. මූල්‍ය ප්‍රතිඵලවල විචලන විශ්ලේෂණය

| | අයිතම් විස්තරය | පෙර වර්ෂයේ වියදම | සමාලෝචිත වර්ෂයේ වියදම | විචලතාවය | නිරීක්ෂණ |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| (අ) | වැටුප් හා වේතන | 268,105,000 | 314,206,381 | 46,101,381 | පසුගිය වර්ෂයට වඩා 18% කින් වියදම වැඩිවී ඇත. |
| (ආ) | ගමන් වියදම් හා යැපීම් දීමනා | 1,007,000 | 875,427 | 131,573 | පසුගිය වර්ෂයට වඩා 13% කින් වියදම අඩුවී ඇත. |
| (ඇ) | සැපයුම් | 22,635,000 | 19,492,978 | 3,142,022 | පසුගිය වර්ෂයට වඩා 14% කින් වියදම අඩුවී ඇත. |
| (ඈ) | නඩත්තු | 7,613,000 | 8,881,711 | 1,268,711 | පසුගිය වර්ෂයට වඩා 17% කින් වියදම වැඩිවී ඇත. |
| (ඉ) | කොන්ත්‍රාත්තු සේවා | 80,741,000 | 99,703,430 | 18,962,430 | පසුගිය වර්ෂයට වඩා 24% කින් වියදම වැඩිවී ඇත. |
| (ඊ) | අනෙකුත් පුනරාවර්තන වියදම් | 9,591,000 | 10,542,782 | 951,782 | පසුගිය වර්ෂයට වඩා 10% කින් වියදම වැඩිවී ඇත. |
| (උ) | ශිෂ්‍යාධාර | 25,606,000 | 21,186,550 | 4,419,450 | පසුගිය වර්ෂයට වඩා 18% කින් වියදම අඩුවී ඇත. |
| (ඌ) | ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන | 97,919,000 | 109,299,921 | 11,380,921 | පසුගිය වර්ෂයට වඩා 12% කින් වියදම වැඩිවී ඇත. |



18. නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) පනත් | |
| 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII පරිච්ඡේදයේ 99 (ඇ) වගන්තිය | කවර හෝ ප්‍රභවයකින් හෝ උපයා ගනු ලබන සියලුම ආදායම් විශ්ව විද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, එම නියමයෙන් බැහැරව පාඨමාලා 07 ක් සහ ව්‍යාපෘති 05 ක් යටතේ ලද රු.61,421,345 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැරකර නොතිබුණ අතර, ඒවා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය | |
| ix පරිච්ඡේදයේ 2 ඡේදය | ආයතන සංග්‍රහයට පටහැනිව අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි. |
| 2 ඡේදයේ 2.1 හා 2.2 වගන්ති | අතිකාල දීමනා අනුමත කළ හැක්කේ ආයතනය තුළ එම කටයුතු ඉටුකිරීමට අභ්‍යන්තර වැඩ පිළිවෙලක් නොමැති අවස්ථාවක් හා කාර්යාල වේලාව තුළ අවසන් කළ නොහැකි වැඩ සඳහා පමණක් වුවද එයට පටහැනිව කටයුතු කර තිබුණි. |
| 4.5 වගන්තිය | අතිකාල වියදම් පාලනයට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. |
| iii පරිච්ඡේදයේ 1.2.3 ඡේදය | විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ගේ තනතුරු සඳහා පත්කිරීමේ බලධරයා විශ්ව විද්‍යාලයක පාලක මණ්ඩලය වුවත් එයට පටහැනිව ආචාර්ය තනතුරු සඳහා තාවකාලික පදනමින් උපකුලපතිවරයා විසින් බඳවා ගැනීම් සිදුකර තිබුණි. |
| 26.13 වගන්තිය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ හා ව්‍යවහාරික විද්‍යාපීඨයේ පැමිණීමේ ලේඛණය නඩත්තු කිරීමේදී එක් එක් බාහිර කථිකාචාර්යවරයා වෙනුවෙන් වෙන් වෙන්ව පිටුව බැගින් වෙන් කර තිබීමෙන් පැමිණීමේ ලේඛණය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |

| | |
|---|---|
| xix පරිච්ඡේදයේ 5.5 වගන්තිය | විශ්ව විද්‍යාලයට අයත් නිල නිවාස හා බදු පදනම මත ලබාගෙන ඇති නිවාස වලින් හවුලේ පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කුලී අයකිරීම වෙනුවට විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් තීරණය කරන ලද ක්‍රමයකට කුලී ගණනය කර අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 845,482 ක නිවාස කුලී අඩුවෙන් අයකරගෙන තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මු.රෙ. 271 (2) (i) | නොගෙවන ලද වැටුප් දින 14 කින් පසුව අධිගාර කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ වෙනත් ගිණුමකට මාරුකර අවසන් කිරීම හෝ කළ යුතු වුවද, 1995 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා නොගෙවන ලද රු. 478,303 ක් වටිනා වැටුප් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.371 (2) (ආ) වගන්තිය | අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද එම සීමාව ඉක්මවා අවස්ථා 13 කදී රු.528,935 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. මීට අමතරව අග්‍රිම සීමා ඉක්මවා වැඩ ඉංජිනේරුහටද අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (iii) මු.රෙ.396 (ඇ) | වටිනාකම රු.283,759 ක් වූ නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්මවූ චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ.571(2) වගන්තිය | තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්මවන ලද රු. 6,995,133 ක් වටිනා විවිධ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |



| | |
|---|---|
| (v) මු.රෙ.756 | 2012 දෙසැම්බර් 31 දිනට වට්ටෝරු භාණ්ඩ |

| | |
|---|---|
| | සමීක්ෂණය සිදුකර අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) මු.රෙ.835 (1) | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබානොගෙන ගොඩනැගිලි බද්දට ගෙන ඒ සඳහා බදු මුදල් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.6,324,000 ක් ගෙවා තිබුණි. |
| (vii) 1646 | වාහන 07 කට අදාල 2012 වර්ෂයේ ධාවන සටහන් වලින් කොටසක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| 13/2008 (iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී උපකුලපතිවරයාට හිමි ඉන්ධන සීමාව ඉක්මවා රු.100,128 ක් වටිනා අමතර ඉන්ධන ලබාගෙන තිබුණි. |
| (ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අප්‍රේල් 07 දිනැති චක්‍රලේඛ අංක 45 | |
| 04 (ආ) ඡේදය | වයඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂණ දීමනා වශයෙන් රු. 994,875 ක් ලබාගත් විදේශගත වූ ආචාර්යවරුන් 09 දෙනෙකු එම වසර තුළ කරන ලද අවසාන පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| 3.5.1 (ආ) (iii) ඡේදය | (i). සෘජු කොන්ත්‍රාත් ක්‍රමය මත මිලදී ගැනීමේදී පාඨ ග්‍රන්ථ ප්‍රසම්පාදනය කිරීම පොත් ප්‍රකාශකයින්ගෙන් පමණක් ලබා ගත හැකි වුවද රු. 4,130,700 ක් වටිනා පොත් ලබාගත් Quanty Distributors ආයතනය පොත් ප්‍රකාශකයකු නොවන අතර, ප්‍රකාශකයින් විශාල සංඛ්‍යාවකට අයත් පොත් එම ආයතනයෙන් ලබා ගෙන තිබුණි. |



(ii). විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට මිලදී

ගැනීම් නොකිරීම හේතුවෙන් අදාල ස්ථානයට ගෙවිය යුතුව තිබූ රු. 4,130,710 ක මුදල ගෙවීමට නොහැකි වී ඇත.

(iii). මෙම පොත් ලබා ගැනීම 2009 වර්ෂයේ සිදුවී ඇති අතර, නිසි පරිදි මිලදී ගැනීම් සිදු වූයෙන් නම් මෙම පොත් වලින් 80% ක ප්‍රතිශතයක් මේ වන විට ක්ෂය ප්‍රතිපාදන කර තිබිය යුතු විය.

(ඌ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ අංක 150

-------------------------------------

(i) ඡේදය

(i). වර්ෂ 10 ට වඩා පැරණි වාහන 02 ක් අපහරණය කර නොතිබුණි.

(ii). කුලී වාහන ඉවත් කළ යුතු වුවද වයඹ විශ්ව විද්‍යාලයේ 2012 වර්ෂය තුළ කුලී වාහන සඳහා කුලිය වශයෙන් රු. 416,150 ක් ගෙවා තිබුණි.

(iii). අදාල සාක්ෂි ඉදිරිපත් නොකර වාහන කුලී වශයෙන් රු. 10,500 ක් ගෙවා තිබුණි.

03 ඡේදය

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා චක්‍රලේඛයේ කොන්දේසි ඉක්මවා රු. 250,127 ක් ඉන්ධන සඳහාද රු. 11,369,941 ක් විදුලිය සඳහාද ඉන්ධන හා විදුලිය පරිභෝජනය අරපිරිමැස්මෙන් කිරීමට මූලිකත්වය දීම ජාතික වගකීමක් ලෙස හා ප්‍රතිපාදන මුදල තුළ අදාල වියදම් දැරිය යුතු බව දක්වා තිබුණද ඉන්ධන සඳහා රු. 106,936 ක් හා විදුලිය සඳහා රු. 2,663,001 කින්ද ඉහත චක්‍රලේඛයට පටහැනිව වියදම් කර තිබුණි.

(එ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2010 අගෝස්තු 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 445 (3)

පෞද්ගලික ආරක්ෂක සේවාවන් තෝරා ගැනීමේදී එම සේවාවල ප්‍රමිතීන් හා මිල ගණන් පිළිබඳව අවධානය යොමු කළ යුතු වුවද, පෙර වසරවල ආරක්ෂක සේවය සඳහා ගෙවන ලද මිල හා වර්තමාන මිල ගණන් අතර 266% ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඒ) 2011 අප්‍රේල් 19 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 9/2011

චක්‍රලේඛයට අනුව අදාල වර්ෂයේ පර්යේෂණ දීමනා ගෙවීමට කලින්, පෙර වර්ෂයේ පර්යේෂණ වාර්තා ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව 2011 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 04 දෙනෙකු වෙතද, 2012 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 19 දෙනෙකු වෙතද, පර්යේෂණ දීමනා අඛණ්ඩව ගෙවා තිබුණි.

19. **ක්‍රියාකාර සැලැස්මට අනුව කටයුතු කිරීම.**

(අ) ක්‍රියාකාර සැලැස්මට අනුව ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ රු. 59,500,000 ක් වෙන් කර තිබූ අතර, එම ප්‍රතිපාදනයට අදාල වැඩ විෂයයන් මොනවාද යන්න සැලසුම් කර නොතිබුණු අතර විවිධ වැඩ විෂයයන් 44 ක් සඳහා රු. 54,746,913 ක් වැය කර තිබුණි.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. 139,000,000 ක් වටිනා වැඩ විෂයයන් ඉටු කිරීමට අපේක්ෂා කලද සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ විෂයයන් 09 ක් ඉටුකර තිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැඩ විෂය විස්තරය | | පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ප්‍රතිපාදන | වෙන් කරන ලද ප්‍රතිපාදන | භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | 2012 වර්ෂයේ සත්‍ය වියදම | ඉතිරිය/ (අතිරික්තය) වටිනාකම | ඉතිරිය/ (අතිරික්තය) ප්‍රතිශතය | නිරීක්ෂණ |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | % | |
| (i). | ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිල්ල පියවර II ඉදිකිරීම | (4.115,886) | 10,000,000 | 9,000,000 | - | 4,884,114 | 54 | අවසන් බිල්පත සහතික කර නොතිබීම. |
| (ii). | පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ පියවර II ඉදිකිරීම | (7,445,370) | 12,210,000 | 12,000,000 | - | 4,554,630 | 38 | අවසන් බිල්පත උපදේශණ ආයතනය විසින් නියමිත වේලාවට සහතික නොකිරීම. |
| (iii). | පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | (2,441,378) | - | - | 871,919 | (3,313,297) | (100) | උපදේශණ සේවා ගාස්තු ගෙවීම නිසා බිල්පත් පියවීමට මුදල් ප්‍රමාණවත් නොවීම. |
| (iv). | මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම | (1,119,582) | 6,000,000 | 6,000,000 | 2,058,052 | 2,822,366 | 47 | කොන්ත්‍රාත්කරු බිල්පත් ඉදිරිපත් නොකිරීම. |
| (v). | මාකඳුර පරිශ්‍රයේ නේවාසිකාගාර පියවර VI හා V ඉදිකිරීම | - | 2,000,000 | 4,000,000 | 161,280 | 3,838,720 | 96 | යෝජිත ඉඩම නොලැබීම. |
| (vi). | කුලියාපිටිය වෛද්‍ය මධ්‍යස්ථානයේ II පියවර ඉදිකිරීම | (13,980) | 5,500,000 | 5,500,000 | 1,808,531 | 3,691,469 | 64 | කොන්ත්‍රාත්කරු විසින් බිල්පත් ඉදිරිපත් නොකිරීම. |
| (vii). | මාකඳුර ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම | 7,705,873 | 2,000,000 | - | - | 7,705,873 | 100 | ඉඩම මිලදී ගැනීම සඳහා අපේක්ෂා කල මුදල් නොලැබීම. |
| (viii). | කාර්ය මණ්ඩල සඳහා නිල නිවාස ඉදිකිරීම | (840,071) | 11,500,000 | 10,000,000 | 3,326,811 | 5,833,118 | 58 | කොන්ත්‍රාත්කරු වැඩ ප්‍රමාද කිරීම. |
| (ix). | වැවිලි කළමනාකරණ පීඨ ගොඩනැගිල්ලේ II පියවර ඉදිකිරීම | 633,099 | 14,000,000 | 14,000,000 | 26,861,991 | (12,228,892) | (45) | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. |

20. නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

(අ) Sandee Researh Grant, Gelt programme, Business Experience Exchange project, shrimp farm, FLICT project යන ව්‍යාපෘති 05 හි පිළිවෙලින් රු.124,463, රු. 46,148, රු.89,296 , රු. 40,000 , රු. 9,275 හි එකතුව රු. 309,182 ක මුදල වර්ෂය තුළ කිසිදු කාර්යයකට යොදවා නොතිබුණි.

(ආ) Outreach මධ්‍යස්ථානයට IRQUE ව්‍යාපෘතිය යටතේ ලද රු. 1,000,000 ක මුදල කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ඇ) තොග සමීක්ෂණ මණ්ඩල විසින් හඳුනා නොගත් වර්ෂ 2003 සිට 2010 දක්වා කාලය තුළ මිලට ගන්නා ලද රු. 677,991 ක් වටිනා තොග විශ්ව විද්‍යාල ගබඩාවල වසර කිහිපයක් තිස්සේ නිකුත් නොකර නිශ්කාර්යව තිබුණි. මාකඳුර ගබඩාවේ ඇති රු. 127,652 ක් වටිනා දොර අගුලු 55 ක් වසර දෙකක් තිස්සේ නිකුත් නොකර තිබියදී, 2012 වසර තුළදී රු. 36,064 ක් වැය කර නඩත්තු කටයුතු සඳහා දොර අගුලු 14 ක් මිලට ගෙන තිබුණි.

21. අනාර්ථික ගණුදෙනු

--------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) කුලියාපිටිය පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර 03 ක් බදු ගැනීමේදී පාලක සභාවේ අවසරය මත, තක්සේරු වටිනාකම ඉක්මවා රු. 559,000 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ලබාගත් නේවාසිකාගාර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම ඉක්මවා රු. 90,000 ක් ගෙවා තිබුණි.

(ඇ) මෙම ගොඩනැගිලි සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මාසික කුලී පදනම මත තක්සේරු වටිනාකම ලබාගෙන එම වටිනාකම අනුව වාර්ෂිකව ගණන් බලා බදු මුදල් ගෙවා තිබුණ අතර, වාර්ෂික බදු කුලී තක්සේරුවක් ලබාගත්තේ නම් තක්සේරු මුදල මීට වඩා අඩු විය හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමේදී ඉදිරිපත් කර තිබූ මිල ගණන් අතරින් වැඩිම මිල ගණන් තෝරා ගෙන තිබුණි.

(ඉ) ව්‍යාපාර ගණකාධිකරණ පාඨමාලාව සඳහා වැය කර තිබූ රු. 144,448 ක මුදල නිශ්කාර්ය වියදම් විය.

(ඊ) කෙරිගෙන යන වැඩ ගිණුමේ දක්වා ඇති FBSF Car Park එකෙහි වටිනාකම රු. 546,996 ක් වූ අතර, එම වටිනාකම මිලදීගත් ද්‍රව්‍ය ගබඩාවේ ගොඩ ගසා ඇති අතර, වාහන නැවතුම ඉදිකර නොතිබුණි. එයට අමතරව රු. 845,700 ක් වැය කරමින් FBSF හි Car Park එකක් 2012 වර්ෂයේදී ඉදිකර තිබුණි.

22. **අනුමැතිය රහිත ගෙවීම්.**

(අ) IDRC ව්‍යාපෘතිය යටතේ වයඹ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු වෙත පශ්චාත් ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා මසකට රු. 115,000 බැගින් ගෙවා තිබූ අතර, දීමනා සඳහා අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 11.1 හා 11.2 ඡේදවලට පටහැනිව වයඹ පළාත් සභා ධීවර අමාත්‍යාංශය හා ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියෙන් ව්‍යාපෘති සඳහා අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා රු. 219,500 ක් දීමනා ගෙවා තිබුණි.

23. **අත්හරින ලද ව්‍යාපෘති**

2004 වර්ෂයේදී මාකඳුර පරිශ්‍රයේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ Foot path with the Roof top එක ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු. 141,918 ක අත්තිකාරමක් ගෙවා තිබූ අතර, මේ වන විට එය ඉදිකිරීම අත්හැර දමා තිබුණි.

24. **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ තථ්‍ය වියදම් ඇස්තමේන්තුගත වියදම් සමඟ සසඳා අදාල වියදමද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයයන් | ඇස්තමේන්තුගත වියදම | තථ්‍ය වියදම | විචලනය (වැඩිවීම)අඩුවීම |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| වැටුප් හා වේතන | 139,307 | 151,073 | 11,766 |
| විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල | 17,500 | 20,283 | (2,783) |
| විශ්‍රාම දීමනා | 9,937 | 13,090 | (3,153) |
| සේවක භාරකාර අරමුදල | 5,335 | 6,675 | (1,340) |
| වැඩ බැලීමේ දීමනා | 200 | 259 | (59) |
| අධ්‍යයන දීමනා | 29,082 | 32,002 | (2,920) |
| භාෂා ප්‍රවීණතා දීමනාව | 315 | 307 | 8 |
| ජීවන වියදම් දීමනා | 39,539 | 34,601 | 5,478 |
| අනෙකුත් දීමනා | 2,050 | 2,560 | (510) |
| බාහිර දේශන ගාස්තු | 1,685 | 1,267 | 418 |

| | | | |
|---|---|---|---|
| අතිකාල | 7,500 | 7,682 | (182) |
| නිවාඩු දින වැටුප් | 66 | 68 | (2) |
| 5% දීමනාව | 6,958 | 19,112 | (12,154) |
| පාරිතෝෂික දීමනා | 10,000 | 13,199 | (3,199) |
| පර්යේෂණ දීමනා | 13,717 | 12,565 | 1,152 |
| දේශීය (ගමන් වියදම්) | 720 | 565 | 155 |
| විදේශීය ( ගමන් වියදම්) | 355 | 311 | 44 |
| කාර්යාල ලිපිද්‍රව්‍ය | 7,950 | 6,285 | 1,665 |
| ඉන්ධන | 5,000 | 5,106 | (106) |
| නිල ඇඳුම් හා කුලී | 1,630 | 1,826 | (196) |
| කාර්යාල හා විදුලි උපකරණ | 1,105 | 1,088 | 17 |
| රසායනික ද්‍රව්‍ය | 4,260 | 2,823 | 1,437 |
| වෛද්‍ය උපකරණ | 260 | 187 | 73 |
| අනෙකුත් සැපයුම් | 2,485 | 2,176 | 309 |
| <u>නඩත්තු වියදම්</u> | | | |
| වාහන | 1,835 | 2,992 | (1,157) |
| යන්ත්‍ර පිරියත | 3,000 | 3,121 | (121) |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 1,600 | 2,087 | (487) |
| ගෘහ භාණ්ඩ | 100 | 128 | (28) |
| අනෙකුත් | 500 | 554 | (54) |
| <u>ඉදිකිරීම් සේවා</u> | | | |
| ප්‍රවාහන ගාස්තු | 2,800 | 2,710 | 90 |
| දුරකථන වියදම් | 9,245 | 7,943 | 1,302 |
| තැපැල් වියදම් | 465 | 294 | 171 |
| විදුලි වියදම් | 22,000 | 24,663 | (2,663) |
| ආරක්ෂක වියදම් | 19,597 | 36,621 | (17,024) |
| ජලය | 825 | 710 | 115 |
| පිරිසිදු කිරීමේ වියදම් | 13,700 | 13,562 | 138 |
| කුලී වාහන ගාස්තු | 4,170 | 5,041 | (871) |
| බදු කුලී | 35 | - | 35 |
| මුද්‍රණ | 2,000 | 2,400 | (400) |
| අනෙකුත් | 6,000 | 5,758 | 242 |
| <u>අනෙකුත් පුනරාවර්තන වියදම්</u> | | | |
| Travel Grants university Teachres | 15 | - | 15 |
| විශේෂ සේවා - වෘත්තීය සම්මේලනය | 2,025 | 931 | 1,094 |
| වැඩමුළු, දේශන | 585 | 257 | 328 |
| අධ්‍යයන පර්යේෂණ | 1,225 | 409 | 816 |
| කාර්ය මණ්ඩල සංවර්ධන | 1,000 | 648 | 352 |
| පශ්චාත් උපාධි පර්යේෂණ | 275 | - | 275 |
| ඉගැන්නුම් උපකරණ | 200 | - | 200 |
| කර්මාන්ත නඩත්තු | 600 | - | 600 |
| ශිෂ්‍ය සංවර්ධන | 550 | 288 | 262 |

| | | | |
|---|---|---|---|
| ශිෂ්‍ය සුභසාධක, සේවක සුභසාධක | 140 | 974 | (834) |
| සංයුක්ත සැලැස්ම | 50 | - | 50 |
| අනෙකුත් ආයතනවලට දීමනා | 60 | 201 | (141) |
| නිවාඩු දුම්රිය බලපත් | 55 | 33 | 22 |
| සංග්‍රහ වියදම් | 310 | - | 310 |
| සාමාජික දීමනා | 200 | 354 | (154) |
| උපාධි ප්‍රදානෝත්සවය | 1,500 | 783 | 717 |
| අනෙකුත් | 735 | 1,430 | (695) |
| බැංකු ගාස්තු | 25 | 23 | 2 |
| විභාග ගාස්තු | 1,280 | 2,176 | (896) |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් | 50 | 428 | (378) |
| පදක්කම් | 70 | - | 70 |
| Expenditure on Extension projects/ postgraduate | 30 | - | 30 |

**නිරීක්ෂණයන්**

--------------

(අ) වාර්ෂික අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ ඒකකයක් ලෙස භාවිතා කර නොතිබුණ බව පහත සඳහන් අවස්ථාවන් ගෙන් නිරීක්ෂණය විය.

(ආ) අයවැය ලේඛන සකස් කිරීමේදී අයිතම 25 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 25 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

(ඈ) වැය විෂයයන් 09 ක මුළු ප්‍රතිපාදිත මුදලම වියදම් කර නොතිබුණි.

24.1 **අයවැයට ඇතුලත් නොකර දරන ලද වියදම්**

---------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් විෂයයන් සඳහා රු.130,964,967 වියදම් දරා තිබුණ නමුත් 2012 වර්ෂයේ අයවැය ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

Financial Assistance to Student

-------------------------------------

| වැය විෂයය විස්තරය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| 1001 | මහපොල ශිෂ්‍යත්ව - (U.G.C) | 1,741,250 |
| 1002 | BURSARES | 8,727,200 |
| 1004 | මහපොල ශිෂ්‍යත්ව - (භාණ්ඩාගාර අරමුදල්) | 10,718,100 |
| | | 21,186,550 |

ස්ථාවර වත්කම් ක්ෂය

| | | |
|---|---|---|
| 1201 | ගොඩනැගිලි | 37,235,628 |
| 1202 | ගෘහ භාණ්ඩ හා උපකරණ | 5,721,122 |
| 1203 | විදුලි උපකරණ | 1,407,340 |
| 1204 | ජල සැපයුම් | 935,871 |
| 1205 | යන්ත්‍ර හා උපකරණ | 357,886 |
| 1206 | කාර්යාල උපකරණ | 22,966,310 |
| 1207 | පුස්තකාල පොත් | 4,905,329 |
| 1208 | වාහන | 10,522,653 |
| 1209 | විද්‍යාගාර හා විද්‍යා උපකරණ | 25,336,875 |
| 1210 | CLOAKS | 309,003 |
| 1212 | SOFTWARE PACKAGE | 80,400 |
| | | 109,778,417 |

24.2 **සංයුක්ත සැලැස්ම**

විශ්ව විද්‍යාලය විසින් 2010 - 2015 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, එම සැලැස්මට අනුව සමාලෝචිත වසර තුළදී ඉටුකළ යුතුව තිබූ පහත දැක්වෙන අධ්‍යයන කටයුතු වලට අදාල නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි.

| සංයුක්ත සැලැස්මට අනුව ඉලක්ක අංකය | අරමුණු අංකය | ඉටුකර නොතිබූ කාර්යය |
|---|---|---|
| ඉලක්ක 02 | අරමුණු 01 | 1. එක් පීඨයකට එකක් බැගින් දෙපාර්තමේන්තු සංඛ්‍යාව වැඩි කිරීම. |
| | අරමුණු 02 | 1. තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය.<br>2. ඉලෙක්ට්‍රොනික පාඨමාලාවක් හඳුන්වා දීම. - ව්‍යවහාරික විද්‍යා පීඨය.<br>3. කාර්මික කළමනාකරණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය.<br>4. නව උපාධි පාඨමාලා හඳුන්වා දීම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය. |
| ඉලක්ක 03 | අරමුණු 04 | 1. ඉංජිනේරු සහ වෛද්‍ය පීඨයන් ආරම්භ කිරීම.<br>2. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ආරම්භ කිරීම.<br>3. අතිරේක අධ්‍යයන දෙපාර්තමේන්තු ආරම්භ කිරීම. |

24.3 වාහන උපයෝජනය

IDRC ව්‍යාපෘතියේ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ කුලී වාහන වෙනුවෙන් රු. 2,653,706 ක් ගෙවා තිබූ අතර, වෙන් කර තිබූ ප්‍රතිපාදනය රු. 1,795,000 ක් වීමෙන් රු. 858,706 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. තවද පාවිච්චි කරනු ලබන වාහන වෙනුවෙන් ධාවන සටහන් හා ලොග් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

25. **මෙහෙයුම් සමාලෝචනය**

25.1 **කාර්ය සාධනය**

2012 වර්ෂයේ එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම සහ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය |
|---|---|---|---|---|---|
| 2012 වර්ෂයේ වියදම | රු. | 49,046,407 | 59,621,296 | 65,611,393 | 66,078,130 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | 1042 | 375 | 382 | 314 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 47,086 | 159,990 | 171,757 | 210,440 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2012 වර්ෂය තුල පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ පීඨ තුනක් සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගොස් තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | වයඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරුවී ගිය සංඛ්‍යාව ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | | | | % |
| 1. | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 344 | 17 | 05 |
| 2. | ව්‍යවහාරික විද්‍යා පීඨය | 146 | 100 | 68 |
| 3. | වැවිලි කළමනාකරණ පීඨය | 114 | 46 | 40 |
| 4. | පශුධීවර පෝෂණ විද්‍යා පීඨය | 109 | 47 | 43 |

## 25.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතුව සිටි අචාර්‍යවරුන් 08 දෙනෙකු විදේශගත වීමේදී, විශ්ව විද්‍යාලය සමඟ එකඟ වූ ගිවිසුම් ප්‍රකාර නියමිත දින යලි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුම් කඩකර තිබුණ අතර, ඒ අනුව ඔවුන්ගෙන් විශ්ව විද්‍යාලයට අයවිය යුතු මුදල් ප්‍රමාණයේ හිඟ මුදල වූ රු. 2,951,092 ක් හා අර්ථ සාධක හා පාර්තෝෂික මුදලින් හිලව් කර ගැනීමට හැකියාව ඇති මුදල රු. 7,256,695 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) තොග පාලනය

අයිතම් 41 කට අදාලව රු. 49,604 ක් වටිනා භාණ්ඩ තොග සමීක්ෂණ මණ්ඩල විසින් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස දක්වා තිබුණි.

(i). මේ අතර රු. 3,802 ක් වටිනා වර්ෂ 10 ට වඩා පැරණි Moter Spair Parts තිබුණි.

(ii). උපලේඛණ පොතේ පිටු අංක 18 දක්වා ඇති මාකදුර ගබඩාවේ Door Lock union එකක් රු. 2,014.88 බැගින් රු. 50,372 ක් වටිනා දොර ලොග් 25 ක්ද රු. 2,576 බැගින් රු. 77,280 ක් වටිනා දොර ලොග් 30 ක්ද වශයෙන් මුළු දොර ලොග් 55 ක ශේෂයක් පැවති අතර, පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද එම ශේෂයම පැවතී. මේ සඳහා අනවශ්‍ය ලෙස වැය කරන ලද මුදල රු. 127,652 ක් විය. මේ ආයතනයේ දොර ලොග් තිබියදී නඩත්තු අවශ්‍යතා සඳහා 2012 වර්ෂයේදී රු. 36,064 කට දොර ලොග් 14 ක් නැවත මිලට ගෙන තිබුණි.

(iii). කුලියාපිටිය ප්‍රධාන ගබඩාවේ සහ මාකදුර ගබඩාවේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස තොග සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා මිලට ගත් එහෙත් අවසාන වර්ෂ කිහිපය තුළ ප්‍රයෝජනයට නොගන්නා ලද රු. 677,991 ක් වටිනා භාණ්ඩ වර්ග කීපයක් නිරීක්ෂණය විය. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ගය | ප්‍රමාණය | වටිනාකම<br>රු. | මිලදී ගත් වර්ෂය |
|---|---|---|---|
| 15 x 10 ලියුම් කවර (කුලි) | 14900 | 81,950 | 2009 |
| ෆොටෝ කොපි ටෝනර් (කුලි) | 66 | 150,551 | මෙයින් 55 ක් 2003 සිට 2007 දක්වා මිලට ගෙන ඇත. |
| ෆොටෝ කොපි ටෝනර් (මාකදුර) | 47 | 302,495 | 2006 හා 2007 වර්ෂවල මිලට ගෙන ඇත. |
| ප්‍රින්ට රිබන් (මාකදුර) | 28 | 126,263 | 2006 හා 2007 වර්ෂවල මිලට ගෙන ඇත. |
| ෆැක්ස් මැෂින් තීන්ත (මාකදුර) | 05 | 16,732 | 2010 මිලට ගෙන ඇත. |

(ඇ) ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා සී/ස රත්නාලංකා සමාගම සමඟ වයඹ විශ්ව විද්‍යාලය නව ගිවිසුමක් අත්සන් නොකර 2012 ඔක්තෝබර් 13 දින සිට දෙසැම්බර් 31 දක්වා රු. 7,532,840 ක් ගෙවා තිබුණි.

(ඈ) ඉහත සේවාව ලබා ගැනීම සඳහා දෙපාර්ශවය අතර එකඟ වූ ගිවිසුමේ ඊ (v) ඡේදය ප්‍රකාර සමාගම විසින් පැය 12 ට වඩා වැඩි සේවා මුර සඳහා ආරක්ෂක නිලධාරීන් සේවයේ නොයෙදවිය යුතු වුවත් අවශ්‍යතාවය මත පමණක් පැය 12 මත පැය 24 නොයික්මවන ලද පරිදි සේවයේ යෙදවිය යුතු වුවද පැය 24 ක් දක්වා නිතරම සේවයේ යොදවන බව කුලියාපිටිය පරිශ්‍රයේ අවස්ථා 440 ක් සහ මාකඳුර පරිශ්‍රයේ අවස්ථා 219 ක් වශයෙන් නිරන්තර ගෙවීම් සේවයෙන් යොදවා ගන්නා පැය 24 කට වඩා වැඩි බව හා ඊට අමතරව පැය 72 ක කාලයක් ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවන බව නිරීක්ෂණය විය.

(ඉ) විශ්ව විද්‍යාල පුස්තකාලය සඳහා පොත් තෝරා ගැනීම පමණක් පුස්තකාල ප්‍රතිග්‍රහන කමිටුවට අයත් කාර්යයක් වුවද එම සීමාව ඉක්මවා ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව පොත් ලබා ගෙන පරිග්‍රහන ලේඛණයටද ඇතුළත් කර ඉන්වෙන්ට්‍රි සහතිකද නිකුත් කර ගෙවීම් සඳහා සැපයුම් අංශයට ඉදිරිපත් කර තිබුණි.

25.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 2011 ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 04 කදී ලබාදෙන ලද කොන්ත්‍රාත් අත්තිකාරම් රු.16,051,630 ක්ද, 1996 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම් අත්තිකාරම් වශයෙන් අවස්ථා 14 ලබාදෙන ලද රු.868,582 ක් සහ 2003 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 21 කදී ලබාදෙන ලද රු.205,220 ක සේවා අත්තිකාරම්ද 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු. 1,203,313 ක් වටිනා ෆොටෝ කොපි කොළ විශ්ව විද්‍යාලය විසින් ලබා ගෙන තිබූ අතර, ගබඩාවෙන් එම ද්‍රව්‍ය ලබා ගන්නා අංශ විසින් ලේඛණවල සටහන් කිරීමක් හා විධිමත් ලෙස නිකුත් කිරීමක් සිදුකර නොතිබුණු අතර, වයඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් 2009 වර්ෂයේදී හඳුන්වා දී තිබූ ලිපිද්‍රව්‍ය විධිමත්ව පරිහරණය කිරීමේ ක්‍රමවේදයද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වයඹ විශ්ව විද්‍යාලයේ වැඩ ඉංජිනේරුහට ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂයට ආදලව රු. 453,735 ක නඩත්තු ද්‍රව්‍ය මිලදීගෙන තිබූ අතර, සමහර අවස්ථාවන්හිදී එම ද්‍රව්‍ය ඉල්ලීම් නොමැතිව නිකුත් කර තිබුණි.

(ඈ) මාකඳුර පරිශ්‍රයේ ධීවර පශු සම්පත් හා පෝෂණ විද්‍යා පීඨයේ Park Area කොටසට පස් පිරවීමේදී ආයතන සේවකයකුගේ අධීක්ෂණයකින් තොරව පස් පිරවීම සිදුකර තිබූ අතර, වාහනයේ ධාරිතාවය ගමන් වාර ගණනින් වැඩිකර බොරළු සඳහා රු. 891,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී එකිනෙක පීඨයන්හි කථිකාචාර්යවරුන් වෙත පවරා තිබූ දේශණ හා ප්‍රායෝගික පැය ගණන්වලට අනුව ඉටුකළ පැය ගණන් පරීක්ෂා කිරීමේදී කථිකාචාර්යවරුන් 04 දෙනෙකු දේශණ පැය 52 හා ප්‍රායෝගික පරීක්ෂණ පැය 04 ක් ඉටුකර නොතිබුණි.

(ඊ) වර්ෂ 2010 සිට 2012 දක්වා කාලසීමාව තුළ කථිකාචාර්යවරුන් 14 දෙනෙකු වෙත පර්යේෂණ ආධාර ව්‍යාපෘති 17 ක් සඳහා ඒකාබද්ධ අරමුදලින් රු. 3,028,018 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම පර්යේෂණාධාර සඳහා 2010 හා 2011 වර්ෂයන්හි දරන ලද මුළු වියදම රු. 1,057,048 ක් විය. ප්‍රතිපාදිත මුදලින් 2012 වසර සඳහා රු. 923,027 ක් වෙන් කර තිබුණු අතර, දරන ලද වියදම රු. 404,721 ක් වූයෙන් උපයෝජනය කර නොතිබූ ප්‍රතිශතය 56% ක් විය. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු අනාවරණය විය.

(i). අංක SRHDC/PP/01/10-13 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් දරා නොතිබූ බැවින් එම පර්යේෂණය අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එබැවින් එම පර්යේෂණය සඳහා වෙනත් පර්යේෂකයකු තෝරා ගැනීමට තිබූ ඉඩකඩද ඇහිරී තිබුණි.

(ii). අංක SRHDC/PP/01/10-11, 10-14 හා 10-16 යන පර්යේෂණ ව්‍යාපෘති සඳහා දරන ලද මුළු වියදම පිළිවෙලින් ඇස්තමේන්තු අගයෙන් 38%, 14% හා 12% බැගින් වූ හෙයින් එම පර්යේෂණ ව්‍යාපෘති අසාර්ථක වී ඇති බව හෝ අතරමග අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය විය. එම ව්‍යාපෘති වෙනුවෙන් ඒ වන විට දරා තිබූ රු. 119,451 ක වියදම නිෂ්කාර්ය වියදමක් විය.

(iii). පර්යේෂණාධාරවලට අදාල වාර්තා 2013 පෙබරවාරි අවසානයට පෙර ඉදිරිපත් කළයුතු බවට තීරණය කර තිබුණද, පර්යේෂණාධාර 16 කට අදාල පර්යේෂණ වාර්තා අතරින් එක් වාර්තාවක් 2013 අගෝස්තු 08 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(උ) අංක SRHDC/PP/01/10-13 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් කර නොතිබූ බැවින් එම පර්යේෂණ අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එබැවින් එම පර්යේෂණ සඳහා වෙනත් පර්යේෂකයකු තෝරා ගැනීමට තිබූ ඉඩකඩද ඇහිරී තිබුණි.

(ඌ) අංක SRHDC/PP/01/10 -02,10-11,10-14,10-16 හා 10-07 යන පර්යේෂණ ව්‍යාපෘති සඳහා දරන ලද මුළු වියදම පිළිවෙලින් ඇස්තමේන්තු අගයෙන් 6%, 28%, 12%, හා 7% බැගින් වූ හෙයින් එම පර්යේෂණ ව්‍යාපෘති අසාර්ථක වී ඇති බව හෝ අතරමග අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් ඒ වන විට දරා තිබූ රු. 158,151 ක වියදම නිෂ්කාර්ය වියදමක් විය.

(එ) පර්යේෂණාධාරවලට අදාල වාර්තා 2013 පෙබරවාරි අවසානයට පෙර ඉදිරිපත් කළයුතු බවට පර්යේෂණාධාර කමිටුව විසින් තීරණය කර තිබුණද, ඒකාබද්ධ අරමුදලින් දරන ලද රු. 1,479,885 කට අදාල පර්යේෂණ වාර්තා විශ්ව විද්‍යාල පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

25.4 **විධිමත් තහවුරු කිරීමක් නොමැති ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී බැකෝ යන්ත්‍රයක් මගින් සේවාවන් ලබාගෙන ඒ සඳහා රු. 632,910 ක පුද්ගලයකුට ගෙවා තිබූ අතර, අදාල සේවාව සඳහා ගතකරන ලද යන්ත්‍ර පැය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

25.5 ඵලදායී නොවන ගනුදෙනු

(අ) ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය පිහිටුවීමට යෝජිත භූමිය තුළ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර තිබියදී එම පරිශ්‍රය සඳහා රු. 425,619 ක් වැය කර ජල සැපයුමක් ලබාගෙන තිබුණි.

(ආ) පෞද්ගලික ශ්‍රම සේවා සපයා ගැනීම සඳහා Global Tech Environmental Service සමාගම ගිවිසුමකට බැඳී තිබූ අතර ගිවිසුමේ 06 ජේදය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ ඉල්ලීමක් නොමැතිව අතිකාල සේවයේ යෙදවීම් වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් ගෙවීම් නොකෙරෙනු ඇත යන්න සඳහන් කර ඇතත් පූර්ව ඉල්ලීමක් නොමැති අතිකාල සඳහා ශ්‍රමිකයන් ලබා ගෙන ඒ සඳහා රු. 347,053 ක් හා ගිවිසුමේ 10 ජේදය ප්‍රකාර අමතර ශ්‍රමිකයන් සැපයීම විශ්ව විද්‍යාලයේ අමතර අවශ්‍යතාවයක් සඳහා දැනුම්දීමක් කළ යුතු වුවද එසේ දැනුම්දීමකින් තොරව අමතර ශ්‍රමිකයින් ලබාගෙන ඒ සඳහා රු. 105,850 ක් ගෙවා තිබුණි.

25.6 කාර්ය මණ්ඩල පාලනය

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වයඹ විශ්ව විද්‍යාලය විසින් නිලධාරින්ගේ වැටුපින් 20% - 90% ක පරාසයක් තුළ අතිකාල අනුමත කර තිබූ අතර ඒ වෙනුවෙන් රු. 5,158,960 ක් වැය කර තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අමතරව වයඹ විශ්ව විද්‍යාලය විසින් විවිධ තනතුරු සඳහා තාවකාලික පත්වීම් ලබා දී තිබූ අතර, 2012 වර්ෂය තුළ තාවකාලික කාර්ය මණ්ඩල වැටුප් වශයෙන් රු. 31,762,070 ක් ගෙවා තිබුණි.

26. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත කරුණු අනාවරණය විය.

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු මිල ගණන් ඉක්මවා තිබූ අතර, ඉදිරිපත් වූ ලංසු 05 න් 04 ක්ම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩුවීමෙන් අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ බව තහවුරු වී තිබුණි. එම මාර්ග ඉදිකිරීමේදී දෙවන වර මතුපිට තාර යෙදීමෙන් පසු වැලි යෙදීම සාමාන්‍ය පිළිගත් ක්‍රමවේදය වුවත් දෙවන වර තාර යෙදීමෙන් පසුද චිප්ස් යොදා තිබූ අතර, එමගින් අදාල කාර්යය ඉටුකළ බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) මාකඳුර පරිශ්‍රයේ ක්‍රීඩාපිටියේ කාණුව වටා ආරක්ෂිත ග්‍රිල් සවිකිරීම කොන්ත්‍රාත්තුව භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

(i). ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෙකුගෙන්ද මිල ගණන් ලබාගෙන එම කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබඳ සලකා නොතිබුණි.

(ii). ඉටුකල යුතු වැඩ විෂයයන් විශ්ලේෂණය නොකර සියළු වැඩ විෂයයන් සඳහා එක් අයිතමයක් ලෙස ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

(iii). නියමිත ප්‍රමිතියේ L Iron භාවිතා කර නොතිබීමෙන් සම්පූර්ණ ඉදිකිරීමම දුර්වල එකක් විය.

(iv). රු. 933,300 ක පිරිවැයකින් නිම කර තිබූ මෙම කොන්ත්‍රාත්තුවට අදාල යකඩ පැස්සීම සඳහා විශ්ව විද්‍යාලයෙන් විදුලිය ලබා ගෙන තිබූ අතර, ඒ සඳහා රු. 1,000 ක ගාස්තු අඩුකිරීමක් පමණක් සිදුකර තිබුණි.

(v). ඇස්තමේන්තුව අනුව එකිනෙකට වෙනස් වර්ණයන්ගෙන් මල නිවාරණ තීන්ත වාර දෙකක් ආලේප කර ඒ මත කොළ පැහැති ඉනැමල් තීන්ත ආලේප කළ යුතු වුවද, ග්‍රිල් මත කළු පැහැති ඉනැමල් තීන්ත පමණක් ආලේප කර තිබුණි.

27. සමාජ හා පාරිසරික වගකීම් ඉටුකිරීම

-----------------------------------------

බඳවා ගැනීමේ පරිපාටිය අනුව විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දේශක තනතුරු සඳහා වූ මූලික සුදුසුකම පළමු පෙල පන්ති සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් විය යුතු වුවත්, එම පීඨය විසින් පිරිනමන උපාධිය විශේෂ උපාධියක් නොවීමේ හේතුවෙන් වර්ෂ 2007 සිට මේ වන තෙක් මෙම පීඨයෙන් පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක් ලබා පිටවූ උපාධිධාරීන් 39 දෙනෙකුට එම පීඨයේ හෝ වෙනත් විශ්ව විද්‍යාලවලද රැකියා අවස්ථා අහිමි වී තිබුණි.

28. පද්ධති හා පාලන දුර්වලතා

-----------------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) පුස්තකාල පොත් මිළදී ගැනීම
(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඇ) අත්තිකාරම්
(ඈ) බාහිර පාඨමාලා
(ඉ) තොග පාලනය
(ඊ) කාර්ය මණ්ඩල
(උ) අයවැය
(ඌ) ප්‍රසම්පාදන

(එම්. කේ.එල්. පද්මිණි)
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව (SLPSAS 1) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.**

(ආ) පොත් අගය ශුන්‍ය ලෙස පෙන්වා තිබූ නමුත් විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන පිරිවැය රු. 64,954,050 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**විශ්වවිද්‍යාලය සතු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිම කර ඇති අතර විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ භාණ්ඩ වර්ගීකරණය කිරීමේ කටයුතු (Coding System) මේ දිනවල සාමාන්‍ය පාලන අංශය විසින් සිදු කරනු ලැබේ. මෙය අවසන් වූ වහාම අදාල දත්ත විශ්වවිද්‍යාලයීය පරිගණක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට ඉදිරිපත් කර විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.**

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)

(i) විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පොලී ආදායම් ගිණුම්ගත කිරීමේදී මුදල් පදනම මත ගිණුම්ගත කළ යුතු වූවද, බාහිර පාඨමාලාවල අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් විශ්ව විද්‍යාලයට ලැබී තිබූ රු.143,237 ක පොලී මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

බාහිර පාඨමාලා අතිරික්තයන් ආයෝජනය කිරීමෙන් ලැබී තිබූ පොලිය විශේෂිත කාර්යයන් වෙනුවෙන් ලද මුදල් ආයෝජනය මඟින් ලද පොලී වන බැවින් අදාල බාහිර පාඨමාලාවේ ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.

(ii) ගිවිසුම් කඩකිරීම් මත විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩලයෙන් අය කර ගෙන, ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීමෙන් ලැබී තිබුණු රු. 493,369 ක් වූ පොලිය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 737 හා 1998 අගෝස්තු 18 දිනැති චක්‍රලේඛය ප්‍රකාර විශ්ව විද්‍යාල වියදම් පියවා ගැනීම සඳහා යොදවාගත නොහැකි වූවද, එම පොලිය විශ්ව විද්‍යාල ආදායමට ගෙන නොතිබුණි.

ගිවිසුම් කඩ කිරීම මත අය කර ගත් මුදල, විශේෂිත කාර්යයන් වෙනුවෙන් වූ අරමුදල් ආයෝජනය මඟින් ලද පොලී වන බැවින් ආයෝජන හා අරමුදල් යටතේ ගිණුම්ගත කර ඇත. තවද ආයතන චක්‍රලේඛ 09/2013 අනුව මෙම මුදල් භාවිතයට නොගන්නා ලෙස ද සඳහන් වේ.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 354 හි පොලී විශ්වවිද්‍යාල ආදායමට ලබා ගත යුතු බව දන්වා නොමැති හෙයින් අරමුදල් හා ආයෝජන යටතේ ගිණුම්ගත කර ඇත.

(ආ) ස්ථාවර වත්කම් මිලදී ගත් දින සිට අපහරණය කරන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම ප්‍රතිපත්තිය වූවද, සමාලෝචිත වර්ෂය ආරම්භයේ තිබූ වත්කම් වෙනුවෙන් ක්ෂය ගණනය කිරීම වැරදි සහගත විය. ඒ අනුව මෝටර් රථ සඳහා රු. 1,240,482 ක්ද, කාර්යාල උපකරණ සඳහා රු. 494,923 ක්ද, විදුලි හා තාක්ෂණ උපකරණ සඳහා රු. 431,555 ක්ද අඩුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණු අතර මෝටර් රථ හැර අනෙකුත් වත්කම් සඳහා නිසි පරිදි ලේඛණ නඩත්තු කර නොතිබුණි.

ක්ෂය ගණනය කිරීම පිළිබඳව කරුණු සොයා බලා 2013 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය සතු ඉඩම්වල වත්මන් වෙළඳ අගය නිර්ණය කිරීමේ කටයුතු සහ අනෙකුත් වත්කම්වල පිරිවැයෙන් අඩු කරනු ලැබූ අගය හීන වීම මත ලැබෙන අගය මත විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නිම කර ඇති අතර විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ භාණ්ඩ වර්ගීකරණය කිරීමේ කටයුතු (Coding System) මේ දිනවල සාමාන්‍ය පාලන අංශය විසින් සිදු කරනු ලැබේ. මෙය අවසන් වූ වහාම අදාල දත්ත විශ්වවිද්‍යාලයීය පරිගණක තොරතුරු

තාක්ෂණ මධ්‍යස්ථානයට ඉදිරිපත් කර විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්ව විද්‍යාලය විසින් පවත්වා නිමකරන ලද විවිධ බාහිර පාඨමාලාවල ලාභයෙන් 10% ක් උපකුලපති අරමුදලට බැරකල යුතු බව, අදාල ඇස්තමේන්තුවේ සහ උපලේඛන පොතේ දක්වා තිබුණද, නිමකළ පාඨමාලා 02 කට අදාලව එහි අදියර 08 කින් රු.1,293,610 ක් එලෙස බැර කර නොතිබූ අතර, තවත් පාඨමාලා 03 කින් බැරකල යුතු ප්‍රමාණයවත් ගණනය කර දක්වා නොතිබුණි.

**පරිගණක පාඨමාලාව - කුලියාපිටියට අදාලව අදියර 03 කින් රු. 104,175,40 ක මුදලක් PB 419 දරණ වවුචරයෙන් 2013.12.26 දින උපකුලපති අරමුදලට බැර කර ඇති අතර MBA පාඨමාලාවට අදාලව අදියර I සිට මේ දක්වා වූ අදියරයන්වල සියළුම අපේක්ෂකයින් අධ්‍යයන කටයුතු අවසන් කර නොමැති බැවින් එම අදියරයන්ට අදාලව අවසන් ගිණුම් පිළියෙල කර නොමැත. එබැවින් අරමුදල්වලට අදාලව මුදල් මාරු කර නොමැත.**

(ආ) පශ්චාත් උපාධි පාඨමාලාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන කුලියාපිටිය ලංකා බැංකු ජංගම ගිණුමේ 2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හඳුනා නොගත් තැන්පතු ලෙස තිබූ රු. 213,700 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**පශ්චාත් උපාධි පාඨමාලා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ගිණුමේ දක්වා ඇති 2011 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා හඳුනා නොගත් තැන්පතු සියල්ල 2013.12.31 වන විට හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.**

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට කෙරිගෙනයන වැඩ ගිණුමේ වූ රු. 141,918 ක ශේෂය පියමහ පියස ඉදිකිරීම සඳහා 2004 වර්ෂයේදී ගෙවා තිබූ අත්තිකාරමක් වන අතර, ඒ හේතුවෙන් අත්තිකාරම් අඩුවෙන්ද, කෙරිගෙන යන වැඩ ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි.

**මෙම කොන්ත්‍රාත් කාර්යය වෙනුවෙන් ගෙවන ලද මුදල අත්තිකාරම් ගිණුමට මාරු කර 2013.12.31 දින වන විට පියවීමට ද කටයුතු කර ඇත.**

(ඇ) ගබඩා ඌනතාවය වූ රු. 37,855 ක්ද, අත්හැර දමන ලද ව්‍යාපාර ගණකාධිකරණ පාඨමාලාවේ ආරම්භක වියදම් සඳහා වැයකර තිබූ රු. 144,448 ක නිශ්කාර්ය වියදමද ජංගම වත්කම් ලෙස දැක්වීමෙන් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

**භෞතික තොග සමීක්ෂණ මණ්ඩලය වර්ෂ අවසානයේ ගබඩා තොග සමීක්ෂණයෙන් පසු දෙනු ලබන ගබඩා තොග පිරිවැයත් ප්‍රධාන ලෙජරයේ ගබඩා තොග ගිණුමත් නොසැසඳෙන විට එම මුදල ගබඩා ඌනතාවය හෝ අතිරික්තය ලෙස හඳුනා ගනී. ඉහත දක්වා ඇති රු. 37,855/- ක මුදල 2007 වර්ෂයේ සිට එසේ ගැලපුම් කරන ලද ශේෂයක් වේ.**

**ව්‍යාපාර ගණකාධිකරණ පාඨමාලාවේ ආරම්භක වියදම වශයෙන් වැයවූ මුදල සම්බන්ධයෙන් අදාළ පීඨයෙන් ලද තොරතුරු පදනම් කරගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.**

(ඉ) IRQUE හා MBA ව්‍යාපෘති සඳහා පිළිවෙලින්, රු. 136,600 හා රු. 1,361,700 වශයෙන් එකතුව රු. 1,498,300 ක මුදලක් විශ්ව විද්‍යාල අරමුදලින් වියදම් කර තිබූ අතර, එම වටිනාකම වයඹ විශ්ව විද්‍යාල අරමුදලට පියවා නොතිබුණි.

**MBA ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් මුදල් වියදම් කර නොමැති අතර ස්වයං පාඨමාලා වලින් ලද මුදලින් මෙම වියදම දරා ඇත. IRQUE ව්‍යාපෘතිය පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.**

(ඊ) Outreach Centre හි ව්‍යාපෘති 07 ක් ඇතුළුව ව්‍යාපෘති 08 කින් අයවිය යුතු රු. 305,205 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

**Outreach Center හි ව්‍යාපෘති අතරින් සියළුම ගෙවීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති වලින් පමණක් විශ්වවිද්‍යාල අරමුදලට 2012 වර්ෂයේ දී මුදල් බැර කරන ලදී.**

**මේ සඳහා 2012 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී වවුචර් සකස් කරන ලද අතර චෙක්පත් මගින් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීම 2013.01.09 දින සිදුකරන ලදී. තොරතුරු පහත දැක්වේ.**

| ව්‍යාපෘතිය | වවුචර් අංකය | මුදල |
|---|---|---|
| **1. Operation & issues in Agribusiness & Fisheries sector** | **0-1** | **Rs. 3,627.00** |
| **2. Operations issues in SME Food & Beverage Sector** | **0-2** | **Rs. 1,475.00** |
| **3. Short Courses & Community Nutrion** | **0-3** | **Rs. 3,250.00** |
| **4. Glycemic Index Analaysis of milk based formula** | **0-4** | **Rs. 2,214.56** |
| **5. Anti Malaria Project** | **0-5** | **Rs. 19,334.00** |

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 ජනවාරි 01 දිනට වූ 1999 සිට පැවත එන රු. 40,018 ක ශේෂයක් අයකරගත යුතුව තිබුණි.

**2012.01.01 දිනට අය විය යුතු විවිධ ණයගැති ශේෂය රු. 72,312.08 ක් වන අතර එම මුදලින් W.A උපනන්ද මහතාගෙන් රු. 38,413.32 ක් මේ වනවිට අය කරගෙන ඇත.**

(ආ) වර්ෂ කීපයක සිට පැවත එන රු. 51,090 ක වැටුප් අත්තිකාරම්ද නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 123,426 ක ආපදා ණය ශේෂයක්ද, නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,917 ක්ද සමාලෝචිත වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි.

**<u>වැටුප් අත්තිකාරම් රු. 51,090/-</u>**

**මෙම මුදලින් රු. 3,000.00 ක් මේ වනවිට පියවා ඇත. රු. 38,800.00 ක් සම්බන්ධයෙන් කරුණු සොයා බලා 60 වන මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර මුදල් කමිටු තීරණය අනුව අදාළ විශ්වවිද්‍යාලවලින් විමසීම් කරන ලද අතර ලැබෙන පිළිතුරු අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.**

**<u>ආපදා ණය රු. 123,426/-</u>**

**ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.**

**<u>කාර්ය මණ්ඩල ණය රු. 4,917/-</u>**

**ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.**

(ඇ) 1996 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීමට නිකුත් කර තිබූ රු. 868,582 ක සැපයුම් අත්තිකාරම්ද, 2011 වර්ෂයේදී ලබාදී තිබූ රු. 73,270 ක සැපයුම් අත්තිකාරම්ද, වසර 02 සිට 08 දක්වා කාලයක් ඉක්ම වූ රු. 205,220 ක සේවා අත්තිකාරම් සහ මූල්‍ය ප්‍රකාශන වලින් හෙලිදරව් නොකළ 2009 වර්ෂයේදී පුස්තකාල පොත් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතුව තිබූ රු. 4,130,770 ක්ද සමාලෝචිත වර්ෂය තුළදීද නිරවුල් කර නොතිබුණි.

**සැපයුම් අත්තිකාරම් (1996 සිට 2011.12.31 දක්වා - පුස්තකාල පොත් හා සඟරා) - රු. 868,582/-**

**මෙම අත්තිකාරම් වලින් රු. 101,769.00 ක් වටිනා අත්තිකාරම් මේ වන විට පියවා ඇත. පුස්තකාලය මගින් අදාල පොත්/ වාර සඟරා ලද බවට තොරතුරු ලද පසු අත්තිකාරම් පියවීමට කටයුතු කරනු ලැබේ.**

**සැපයුම් අත්තිකාරම් (2011) - රු. 73,270/-**

**2013.08.14 දින ජ'නල් අංක C 86 මගින් පියවා ඇත.**

**සේවා අත්තිකාරම් - රු. 205,220/-**

**මේ සඳහා දිගින් දිගටම නිරවුල් කරන ලෙස දන්වමින් සිහි කැඳවීම් යවා ඇත.**

**2009 වර්ෂයේ දී පුස්තකාල පොත් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු මුදල - රු. 4,130,770/-**

**Quency ආයතනයෙන් ලබා ගත් පොත් සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වූ ගැටළු සහගත තත්වය නිරාකරණය කිරීම සඳහා පාලක සභාව විසින් පත් කළ අනු කමිටු තීරණය ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත. පාලක සභා තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.**

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

178,481,008

(අ) වටිනාකම රු. ~~178,481~~ ක් වූ ඉඩම්වලට අදාල සින්නක්කර ඔප්පු, වටිනාකම රු. 677,470,904 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 කට අදාල ස්ථාවර වත්කම් ලේඛණ හා උපලේඛණද, වටිනාකම රු. 2,330,050 ක් වූ නොගෙවූ ශිෂ්‍යාධාර හා මහපොලවලට අදාල ලේඛණද, වටිනාකම රු. 10,834,875 ක් වූ රඳවා ගත් මුදල්, රු. 2,980,629 ක්වූ සැපයුම් ණයහිමියන් සහ රු. 165,611 ක් වූ විවිධ ණයහිමියන්ට අදාල ශේෂ සනාථ කිරීම්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**ඉඩම්**

**විශ්වවිද්‍යාලයට පවරාදීමට නියමිත මාකඳුර පරිශ්‍රයේ ඉඩමෙහි මිණුම් කටයුතු බිම් සවිය වැඩසටහන යටතේ සිදු කර ඇති අතර සිතියම ලද වහාම එය ගැසට් පත්‍රයේ පළ කර විශ්වවිද්‍යාලයට පවරා දීමට කටයුතු කරන බව පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත. තවද පන්නල ප්‍රාදේශීය ලේකම් හමුවී මෙම ඉඩම හැකි ඉක්මනින් අත්පත් කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.**

**වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රය සඳහා අත්පත් කර ගැනීමට නියමිත ඉඩම් සඳහා වන්දි මුදල් හා පොළී මේ වන විට ගෙවා අවසන් කර ඇත. ඒ අනුව මෙම ඉඩම් අත්පත් කර ගැනීමට අදාලව 38 ආඥාව නිකුත් කරන ලෙස ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති බව කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් විසින් ලිඛිතව අප වෙත දන්වා ඇත. (ඇමුණුම 01)**

**ස්ථාවර වත්කම් විෂයයන් 07 ක්**

**විශ්වවිද්‍යාලය සතු ඉඩම්වල වත්මන් වෙළඳ අගය නිර්ණය කිරීමේ කටයුතු සහ අනෙකුත් වත්කම්වල පිරිවැයෙන් අඩු කරනු ලැබූ අගය හීන වීම මත ලැබෙන අගය මත විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු මේ වන විට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නිම කර ඇති අතර විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ භාණ්ඩ වර්ගීකරණය කිරීමේ කටයුතු (Coding System) මේ දිනවල සාමාන්‍ය පාලන අංශය විසින් සිදු කරනු ලැබේ. මෙය අවසන් වූ වහාම අදාල දත්ත විශ්වවිද්‍යාලයීය පරිගණක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට ඉදිරිපත් කර විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.**

**<u>නොගෙවූ ශිෂ්‍යාධාර, නොගෙවූ මහපොළ</u>**

**2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද උපලේඛණ පොතෙහි විස්තරාත්මක උපලේඛණ ඇතුළත් වේ.**

**<u>රඳවා ගැනීම්, සැපයුම් ණයහිමියෝ, විවිධ ණයහිමියෝ</u>**

**2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද උපලේඛණ පොතෙහි විස්තරාත්මක උපලේඛණ ඇතුලත් වන අතර 2013 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.**

(ආ) අදාල සේවාව සත්‍ය වශයෙන්ම ලබාගත් බවට සහ ඒ සඳහා ගතකරන ලද යන්ත්‍ර පැය ගණන නිවැරදි බවට සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී ජලනල එලීම සඳහා කාණු කැපීම සහ පොල් පැල සිටුවීම සඳහා වලවල් කැපීම, පොල් මුල් ඉවත්කිරීම ආදී කාර්යයන් සඳහා යොදවාගත් බැකෝ යන්ත්‍රයක් වෙනුවෙන් යන්ත්‍ර පැය 165 ක් සහ 55 ක් සඳහා පිළිවෙලින් රු.327,000 ක් සහ රු.99,000 ක් පුද්ගලයකුට ගෙවා තිබුණි.

**මෙකී කාර්යන් වෙනුවෙන් වැය කරන ලද යන්ත්‍ර පැය ගණන් නිවැරදි බව වැඩ ඉංජිනේරු විසින් සහතික කර ඇත. (ඇමුණුම 02, 03)**

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කර තිබූ විගණන විමසුම් 08 ක් වෙනුවෙන් පිළිතුරු සපයා නොතිබුණි.

**2012 වර්ෂය සඳහා වයඹ විශ්වවිද්‍යාලය වෙත ලැබුණු සහකාර විගණකාධිපතිගේ විගණන විමසුම් 24 න් 23 ක් සඳහා මේ වන විට පිළිතුරු සපයා ඇත.**

2.2.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) පනත් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII පරිච්ඡේදයේ 99 (ඇ) වගන්තිය | කවර හෝ ප්‍රභවයකින් හෝ උපයා ගනු ලබන සියලුම ආදායම් විශ්ව විද්‍යාල අරමුදලට බැරවිය යුතු වුවත්, එම නියමයෙන් බැහැරව පාඨමාලා 07 ක් සහ ව්‍යාපෘති 05 ක් යටතේ ලද රු.61,421,345 ක් විශ්ව විද්‍යාල අරමුදලට බැරකර නොතිබුණ අතර, ඒවා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. |

**විශේෂිත අරමුණු වෙනුවෙන් රැස්කරන අරමුදල් වෙනම ගිණුමක තබා ගැනීමට හැකි බව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 101 වගන්තියේ දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කර ඇත. පාඨමාලා වලින් ලද ආදායම් වෙන් වෙන්ව අවසන් ගිණුම් ප්‍රකාශනයේ දක්වා ඇත. වෙන වෙනම ගිණුම් පවත්වා ගත්ත ද සමස්තයක් වශයෙන් ගත් කල එම මුදල ද විශ්වවිද්‍යාල අරමුදල්වල ඇතුලත් වේ.**

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (ආ) විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය iii පරිච්ඡේදයේ 1.2.3 වගන්තිය | විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ගේ තනතුරු සඳහා පත්කිරීමේ බලධරයා විශ්ව විද්‍යාලයක පාලක මණ්ඩලය වූවත් එයට පටහැනිව ආචාර්ය තනතුරු සඳහා තාවකාලික පදනමින් උපකුලපතිවරයා විසින් බඳවා ගැනීම් සිදුකර තිබුණි. |

**විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I පරිච්ඡේදයේ උප ඡේද 11.7 (ආ) (2) V හා III පරිච්ඡේදයේ උප ඡේද 24.2 හි සඳහන් වී ඇති උපදෙස් අනුව කටයුතු කලහැකි බව වැඩිදුරටත් දන්වමි. (ඇමුණුම 04)**

| | |
|---|---|
| 26.13 වගන්තිය | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ හා ව්‍යවහාරික විද්‍යාපීඨයේ පැමිණීමේ ලේඛණය නඩත්තු කිරමේදී එක් එක් බාහිර කථිකාචාර්යවරයා වෙනුවෙන් වෙන් වෙන්ව පිටුව බැගින් වෙන් කර තිබීමෙන් පැමිණීමේ ලේඛණය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි. |

<u>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය</u>

**මෙම පීඨයේ බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් පීඨ කාර්යාලය මගින් විධිමත් පැමිණීමේ ලේඛණයන් පවත්වාගෙන යනු ලබයි. බාහිර කථිකාචාර්යවරයාගේ සේවය ලබාගන්නා අදාල දෙපාර්තමේන්තුව මගින් එම ලේඛණයේ නිසි පරිදි අදාල බාහිර කථිකාචාර්යවරයාගේ පැමිණීම සහ පිටවීම සටහන් කරගන්නා අතර ඒ අනුව ඔවුන්ගේ ගෙවීම් කටයුතු සිදු කෙරේ. මෙහි පැමිණීම හා පිටවීම විධිමත්ව සටහන් කරවීමට අදාල අංශ ප්‍රධානවරුන් දැනුවත් කර ඇත.**

<u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

**මෙම පීඨයේ බාහිර කථිකාචාර්යවරුන් සඳහා අධ්‍යයනාංශවල පැමිණීමේ ලේඛණයන් පවත්වාගෙන යයි.**

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

-----------------------------------

| | |
|---|---|
| xix පරිච්ඡේදයේ 5.5 වගන්තිය | විශ්ව විද්‍යාලයට අයත් නිල නිවාස හා බදු පදනම මත ලබාගෙන ඇති නිවාස වලින් හවුලේ පදිංචිව සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කුලී අයකිරීම වෙනුවට විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල නේවාසික කමිටුව විසින් තීරණය කරන ලද ක්‍රමයකට කුලී ගණනය කර අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 845,482 ක නිවාස කුලී අඩුවෙන් අයකරගෙන තිබුණි. |

**2013.10.30 දින පැවති නේවාසිකාගාර කමිටු නිර්දේශය මත 2013.11.27 දින පැවති පාලක සභා අනුමැතිය මත 2014.01.01 දින සිට නේවාසික ගාස්තු 10% කින් ඉහළ දැමීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.**

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

| | |
|---|---|
| (i) මු.රෙ. 271 (2) (i) | නොගෙවන ලද වැටුප් දින 14 කින් පසුව අධිහාර කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ වෙනත් ගිණුමකට මාරුකර අවසන් කිරීම හෝ කළ යුතු වුවද, 1995 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා නොගෙවන ලද රු. 478,303 ක් වටිනා වැටුප් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |

**මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා ඉදිරියේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.**

| | |
|---|---|
| (ii) මු.රෙ.396 (ඇ) | වටිනාකම රු.283,759 ක් වූ නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්මවූ චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

**මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.**

| | |
|---|---|
| (iii)මු.රෙ.571(2) | තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්මවන ලද රු. 6,995,133 ක් වටිනා විවිධ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

**මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.**

| | |
|---|---|
| (iv) මු.රෙ.756 | 2012 දෙසැම්බර් 31 දිනට වට්ටෝරු භාණ්ඩ සමීක්ෂණය සිදුකර අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2012 වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇති අතර අදාළ වාර්තා 2013.09.04 දින විගණනයට ඉදිරිපත් කර ඇත.**

(v) මු.රෙ.835 (1) — අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබානොගෙන ගොඩනැගිලි බද්දට ගෙන ඒ සඳහා බදු මුදල් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.6,324,000 ක් ගෙවා තිබුණි.

අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩල සඳහා ලබා ගන්නා ලද සියලු ගොඩනැගිලි සඳහා මේ වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම 05)

එක් එක් අධ්‍යයන වර්ෂයේ නේවාසිකාගාර අවශ්‍යතාව අභ්‍යන්තර නේවාසිකාගාර මගින් සම්පූර්ණ කළ නොහැකි වූ විට ඒ සඳහා බාහිර නිවාස හෝ ගොඩනැගිලි බදු පදනම මත ලබා ගැනීමට කටයුතු කෙරේ. අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යා යුතු බැවින් කඩිනමින් නේවාසිකාගාර පහසුකම් ලබා දිය යුතු වේ. එබැවින් ඒ සඳහා විශ්වවිද්‍යාල පනත මගින් පාලක සභාව වෙත සලසා ඇති බලතල අනුව කටයුතු කරනු ලබන අතර **2011/2012** වර්ෂයට අදාල ලියකියවිලි අමාත්‍යාංශ අනුමැතියට ඉදිරිපත් කර ඇතත් මේ වන තුරුත් අනුමැතිය අප වෙත ලැබී නොමැති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ද මේ සම්බන්ධව ලිපියක් **2012-07-18** දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යවා ඇත. (ඇමුණුම 06)

(vi) මු.රෙ. 1646 — වාහන 07 කට අදාල 2012 වර්ෂයේ ධාවන සටහන් වලින් කොටසක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2012** වර්ෂයට අදාල සියළු ධාවන සටහන් මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අප්‍රේල් 07 දිනැති චක්‍රලේඛ අංක 45
--------------------------------------
04 (ආ) ඡේදය — වයඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂණ දීමනා වශයෙන් රු. 994,875 ක් ලබාගත් විදේශගත වූ ආචාර්යවරුන් 09 දෙනෙකු එම වසර තුළ කරන ලද අවසාන පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

අදාළ ආචාර්යවරුන් 09 දෙනා පර්යේෂණ උපාධි සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 990 ට අනුව පර්යේෂණ දීමනා ගෙවා ඇත. (ඇමුණුම 07)

| | |
|---|---|
| (ඊ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2010 අගෝස්තු 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 445 (3) | පෞද්ගලික ආරක්ෂක සේවාවන් තෝරා ගැනීමේදී එම සේවාවල ප්‍රමිතීන් හා මිල ගණන් පිළිබඳව අවධානය යොමු කළ යුතු වුවද, පෙර වසරවල ආරක්ෂක සේවය සඳහා ගෙවන ලද මිල හා වර්තමාන මිල ගණන් අතර 266% ක වැඩිවීමක් නිරීක්ෂණය විය. |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **445** හා ප්‍රසම්පාදන උපදේශ අභිබවා යමින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය ආරක්ෂක සේවාව රක්නා ආරක්ෂක ලංකා සමාගමට පවරන ලද්දේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක **HE/AD/Security** දරණ **2011-08-29** දිනැති ලිපියට අනුව කටයුතු කිරීමට සිදු වීම නිසාය. ඒ අනුව විමසුමේ දක්වා ඇති පරිදි පෙර වර්ෂ සඳහා ආරක්ෂක සේවය වෙනුවෙන් ගෙවන ලද මිලට සාපේක්ෂව **2012** වර්ෂයේ ආරක්ෂක වියදම් ඉහළ ගොස් ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි.

| | |
|---|---|
| (උ) 2011 අප්‍රේල් 19 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 9/2011 | චක්‍රලේඛයට අනුව අදාල වර්ෂයේ පර්යේෂණ දීමනා ගෙවීමට කලින්, පෙර වර්ෂයේ පර්යේෂණ වාර්තා ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව 2011 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 04 දෙනෙකු වෙතද, 2012 වර්ෂයට අදාලව කථිකාචාර්යවරුන් 19 දෙනෙකු වෙතද, පර්යේෂණ දීමනා අඛණ්ඩව ගෙවා තිබුණි. |

උසස් අධ්‍යාපන චක්‍රලේඛ අංක **1/2011** අනුව මෙම ආචාර්යවරුන් හට පර්යේෂණ දීමනා ගෙවා ඇත. (ඇමුණුම 08)

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 556,112,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 506,817,000 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු. 452,433,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 125,112,000 ක් දක්වා අඩු වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණ රු. 406,284,000 ක ප්‍රදාන ගැලපීමෙන් පසුව එම වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 100,533,000 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු. 24,579,000 ක පිරිහීමක් සිදුවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට පෞද්ගලික පඩිනඩි හා දීමනා රු. 46,101,381 කින් වැඩිවීම ශිෂ්‍යසුභසාධන සේවා සඳහා වූ වියදම රු. 18,962,430 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| | පීඨය | විස්තරය | | ඉකුත් වර්ෂය | සමාලෝචිත වර්ෂය |
|---|---|---|---|---|---|
| (i) | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | වියදම | රු. | 44,648,076 | 49,046,407 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 1,079 | 1042 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | **41,379** | **47,086** |
| (ii) | ව්‍යවහාරික විද්‍යා පීඨය | වියදම | රු. | 50,288,773 | 59,621,296 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 358 | 375 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | **140,471** | **159,990** |
| (iii) | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | වියදම | රු. | 59,222,043 | 65,611,393 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 396 | 382 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | **149,550** | **171,757** |
| (iv) | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | වියදම | රු. | 59,739,834 | 66,078,130 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 323 | 314 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | **184,953** | **210,440** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

කෘෂිකර්ම හා වැවිලි කළ. පීඨයේ

(අ) 2012 වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය හා ~~ව්‍යවහාරික විද්‍යා පීඨයේ~~ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණි.

- පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය
  - නව පාඨමාලා විෂය සංකලනයන් අන්තර්ගතව පීඨය තුල පාඨමාලා දෙකක් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු වීම.
  - පීඨය තුල අංග සම්පූර්ණ සත්ව ගොවිපලක් (පශු සම්පත්/කරදිය හා මිරදිය මත්ස්‍ය) නොමැති වීම නිසා ඉතා විශාල වශයෙන් ක්ෂේත්‍ර චාරිකා හා ක්ෂේත්‍ර ඉගැන්වීම් කටයුතු සිදුකල යුතු වීම හා එවැනි ක්ෂේත්‍ර චාරිකා ඉතා ඈත ප්‍රදේශවල දී සිදු කිරීමට ඇති බැවින් ඒ සඳහා වන ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් සියළු අවශ්‍යතාවයන් සඳහා අවස්ථානුකූලව මූල්‍ය ප්‍රතිපාදන විශාල වශයෙන් වෙන් කරවීමට සිදු වීම.

  - රසායනාගාර මට්ටමේ ප්‍රායෝගික පුහුණුව සඳහා වන අධ්‍යයන කටයුතු වලට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිල අධික බැවින් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන යෙදවීම.

  - අනෙකුත් පීඨවල මෙන් නොව මෙම පීඨයේ උපාධි පාඨමාලා දෙකෙහිම සියළුම විභාගයන්හි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වන ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සම්පූර්ණයෙන්ම පීඨය තුල සිදුකරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය වන ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ තීන්ත හා අනෙකුත් උපකරණ සහ නඩත්තු කටයුතු සඳහා සැලකිය යුතු පිරිවැයක් වෙන් කිරීමට සිදු වීම.

  - **LFN IX10 – Social Harmony & Conflict Resolution** විෂය මෙම පිඨයේ විෂය මාලාවට **2009** වර්ෂයේ සිට ඇතුලත් කර ක්‍රියාත්මක වේ. මෙම විෂය පසුකාලීනව උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිෂන් සභාව මගින් කරන ලද නිර්දේශයන්ට ද අනුකූල වේ. එසේම මෙම විෂය එක් අධ්‍යයන වර්ෂයක් පුරාවට ක්‍රියාත්මක වන අතර ඒ සඳහා සිසුන් සෑජුවම දායක වේ. ඒ අනුව එම විෂය අනුබද්ධ ක්‍රියාකාරකම් සඳහා සැලකිය යුතු මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට සිදුවන අතර එය ද ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ යාමට තවත් හේතුවක් වේ.

- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

2012 වර්ෂයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරන පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ අගයක් ගැනීමට හේතුන් පහත සඳහන් පරිදි වේ.

**01.** විද්‍යාගාර පරීක්ෂණ සඳහා භාවිතා කරන ලද රසායනික ද්‍රව්‍ය ඉකුත් වර්ෂයට වඩා වැඩි අගයක් ගැනීම.

**02.** ඉන්ධන මිල ඉහල යාම නිසා ක්ෂේත්‍ර චාරිකා සඳහා ඉකුත් වර්ෂයට වඩා ඉන්ධන වියදම ඉහළ අගයක් ගැනීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ යාම.

03. විභාග පැවැත්වීම ප්‍රශ්න පත්‍ර සමීක්ෂණය වැනි කටයුතු සඳහා වියදම ඉහළ යාම.

04. අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් පසුගිය වර්ෂය තුල විශාල වශයෙන් වැයවීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ යාම.

05. එමෙන්ම මෙම පීඨයේ නව පීඨ ගොඩනැගිල්ල විවෘත කිරීම හා එයට වැඩි වශයෙන් අවශ්‍ය ගෘහ භාණ්ඩ, ශිෂ්‍ය උපකරණ හා අන්තර්ජාල පහසුකම් ලබාදීම නිසා ද පසුගිය වසරට සාපේක්ෂව වියදම් වැඩි වී ඇත.

06. පෙර වර්ෂයට වඩා ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම නිසා ද ඒකශිෂ්‍ය පිරිවැය වැඩි වී ඇත.

07. ඒක ශිෂ්‍ය පිරිවැය වැඩි වීම මෙම පීඨයෙහි පමණක් නොව අනෙකුත් පීඨවල ද ඉකුත් වසරට සාපේක්ෂව වැඩිවීමක් පෙන්වන අතර එය ව්‍යාපාර අධ්‍යයන පීඨයෙහි මිලියන 05 ක් ද, ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි මිලියන 09 ක් ද, පශු සම්පත් පීඨයෙහි මිලියන 07 ක් ද, කෘෂිකර්ම පීඨයෙහි මිලියන 06 ක් ද වශයෙන් වියදම් වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙය සාමාන්‍ය උද්ධමන අනුපාතය අනුව වැඩි වී ඇත.

(ආ) විශ්ව විද්‍යාලයේ පීඨ තුනක් සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගොස් තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | පීඨය | වයඹ විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | වෙනත් විශ්ව විද්‍යාලවලට මාරුවී ගිය සංඛ්‍යාව ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | | | | % |
| (i). | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 344 | 17 | 05 |
| (ii). | ව්‍යවහාරික විද්‍යා පීඨය | 146 | 100 | 68 |
| (iii). | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 114 | 46 | 40 |
| (iv). | පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය | 109 | 47 | 43 |

➢ <u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2010.04.06 දින යොමු කරන ලද ලිපියට අනුව 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 150 දෙනෙකු බඳවා ගැනීමට 78 වන පීඨමණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී.

ඒ අනුව ශිෂ්‍යයන් බඳවා ගැනීම පහත පරිදි සිදු කරන ලදී.

| බඳවා ගැනීම | ශිෂ්‍ය සංඛ්‍යාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව සඳහන් කර එවන ලද ලිපියේ දිනය |
|---|---|---|---|
| මුල්ම ලියාපදිංචිය | **148** | **80** | **2011.07.20** |
| පළමු අදියර | **139** | **82** | **2011.09.05** |
| දෙවන අදියර | **108** | **54** | **2011.09.26** |
| තෙවන අදියර | **30** | **11** | **2011.10.25** |
| සිව්වන අදියර | **17** | **09** | **2011.11.11** |
| අභ්‍යන්තර ස්ථාන මාරුවීම් | **06** | **04** | **2011.11.11** |

මේ අනුව **2010/2011** අධ්‍යයන වර්ෂය සඳහා ඉහත අදියරයන් යටතේ ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා ශිෂ්‍යයන් **240** ක් පමණ ලියාපදිංචි වුවද, ඒ සෑම අදියරයක් යටතේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉහළ ප්‍රතිඵල මත පදනම්ව උසස් පාඨමාලා හැදෑරීම සඳහා වෙනත් විශ්වවිද්‍යාල වෙත ශිෂ්‍යයන් මාරු කර යවන ලද අතර ශිෂ්‍යයන්ගේ ස්ව කැමැත්තෙන්, විවිධ හේතු සාධක මත පදනම්ව ශිෂ්‍ය ලියාපදිංචිය අහෝසි කර ගන්නා ලද අවස්ථා ද පෙන්වා දිය හැක.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ශිෂ්‍ය අත්පොතට අනුව වෙනත් විශ්වවිද්‍යාල සඳහා පාඨමාලාව උසස් කර යැවීමේදී ශිෂ්‍යයා විසින් එය අනිවාර්යයෙන්ම බාර ගත යුතු බව සඳහන් වේ. මේ අනුව සමස්තයක් ලෙස **99** ක පමණ ශිෂ්‍ය ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් උසස් පාඨමාලා සඳහා මාරු කර යැවීම හා ශිෂ්‍යයන් විසින් සිය කැමැත්තෙන් ශිෂ්‍ය ලියාපදිංචිය අහෝසි කරගෙන ඇති බව වැඩිදුරටත් පෙන්වා දිය හැක.

එමෙන්ම, විද්‍යා පීඨ හා ව්‍යවහාරික විද්‍යා පීඨවල ශිෂ්‍ය පුරප්පාඩු පිරවීමේ ගැටළු වලට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවන බව විද්‍යා පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු රැස්වීම් වලදී **(Standing Committee on Sciences)** පීඨාධිපතිවරු අවධාරණය කරති. මෙමගින් උද්ගතවන ගැටළු වඩාත් කාර්යක්ෂම ලෙස විසඳිය හැක්කේ නවක සිසුන් සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර නියමිත ප්‍රමාණයට බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් පසුවය.

එමෙන්ම, නවක සිසුන් සඳහා වූ **2010/2011** අධ්‍යයන වර්ෂය ආරම්භ කරනු ලැබුවේ **2011.11.14** දින වන අතර අප පීඨයේ අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් වන අතරම අධ්‍යයන කටයුතු වලට පූර්ව ගාමීව (අනිවාර්ය) කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව (මාස **02** ක) නිම කරනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන්

පුරප්පාඩු පිරවීම සඳහා ශිෂ්‍ය නාම ලේඛණ ලැබීමට සති **03** ක් හෝ **04** ක් ගතවන බැවින් ද, අධ්‍යයන කටයුතු ආරම්භ වීමත් සමඟම අඛණ්ඩ ඇගයීම් **(Continuous Assessments)** සිදුකිරීමට සිසුන්ට සිදුවන බැවින් ද නියමිත දිනට පසුව ලැබෙන ලේඛණ අනුව ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කල නොහැකි වේ.

තවද, පීඨය සඳහා වරින්වර සිසුන් බඳවා ගැනීමේදී අධ්‍යයන කටයුතු පමා කිරීමට සිදුවන අතර එහිදී අනෙකුත් ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු කාල සීමාවට බලපාන හෙයින් පීඨමණ්ඩලය මඟින් සිසුන් බඳවා ගැනීම **2011.11.14** දින සිට නතර කිරීමට තීරණය කරන ලදී.

එහෙත් කැළණිය, රුහුණු, සබරගමුව, යාපනය සහ ඌව වෙල්ලස්ස යන විශ්වවිද්‍යාල වලට උසස් කරන ලද සිසුන් 31 දෙනෙකු පමණ ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අධ්‍යයන කටයුතු සිදු කිරීමට කැමැත්ත ප්‍රකාශ කිරීම සුවිශේෂී සිදු වීමක් ලෙස දැක්විය හැක. මේ අනුව **2010/2011** අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව **2012.12.31** වන විට **141** ක් වේ.

- <u>පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය</u>

ශිෂ්‍යයන් ලියාපදිංචිය අහෝසි කර වෙනත් විශ්වවිද්‍යාලවලට යන්නේ හුදෙක්ම උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය පමණක්ම සලකා නොවන අතර වසර ගණනාවක සිට වෛද්‍ය, දන්ත වෛද්‍ය, සම සෞඛ්‍ය විද්‍යා සහ කෘෂි තාක්ෂණ කළමනාකරණය ආදී උපාධි පාඨමාලාවලට වැඩි ඉල්ලුමක් පවතින හෙයිනි. ඒ අනුව ආරම්භයේදී අපගේ උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සිසුන් හට, පසුව ඉහත දැක්වූ උපාධි පාඨමාලාවට ඇතුළුවීමට අවස්ථාව ලබාදීමත්, ඒ බව සෘජුවම සිසුන් වෙත දැනුම් දීමත් ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ.

ඉහත කී කරුණට අමතරව ස්ථිර වාසස්ථානයට ඇති දුර ද පේරාදෙණිය, කොළඹ, කැළණිය වැනි ස්ථාපිත විශ්වවිද්‍යාල සඳහා ඇති ජනප්‍රියතාවය ද බලපාන තවත් කරුණු බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

- <u>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය</u>

මෙම පීඨයේ 2012 වර්ෂය සඳහා බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව 110 කි. එනමුත් මේ වනවිට සිසුන් 114 දෙනෙකු අධ්‍යාපනය ලබයි.දැනට පවතින ක්‍රමය මත සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේ දී ඔවුන්ට හැකි සෑම වරණයක් සඳහාම අයදුම් කරනු ලබයි. ඒ අනුව ඔවුන් තෝරා ගන්නා පාඨමාලාවට වඩා උසස් පාඨමාලාවක පුරප්පාඩු ඇති වූ විට ඔවුන් ඒ සඳහා යොමු කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් සිදු කරනු ලබයි.මෙය සෑම වර්ෂයකම ක්‍රියාත්මක වන සාමාන්‍ය පිළිවෙතයි.එසේම අයදුම් කරන ලද ආකාරය අනුව

සෑම ශිෂ්‍යයකුම තමාට ලැබෙන උසස් උපාධි පාඨමාලාවක් හැදෑරීමට යොමුවීම සාමාන්‍ය සිදුවීමකි.මෙය කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයට පමණක් සිදුවන තත්වයක් නොව සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතිය තුලම පීඨවල සිදුවන සිදුවීමකි. ඒ කෙසේ වුවද පීඨයට පහසුකම් ඇති ප්‍රමාණයට සිසුන් බඳවා ගැනීමට පීඨය කටයුතු කර ඇත.

4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ සේවයේ නියුතුව සිටි අචාර්යවරුන් 08 දෙනෙකු විදේශගත වීමේදී, විශ්ව විද්‍යාලය සමඟ එකඟ වූ ගිවිසුම් ප්‍රකාර නියමිත දින යලි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුම් කඩකර තිබුණ අතර, ඒ අනුව ඔවුන්ගෙන් විශ්ව විද්‍යාලයට අයවිය යුතු මුදලින්, අර්ථ සාධක හා පාර්තෝෂික අරමුදලින් හිලව් කර ගැනීමට හැකියාව තිබූ මුදල රු. 7,256,695 ක් සහ තවදුරටත් අයවිය යුතු මුදල් ප්‍රමාණයේ හිඟ මුදල වූ රු.2,951,092 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

පහත සඳහන් පරිදි ජේ. ඒ. ඩී. ආර්. එන් අප්පුහාමි මයා, කේ. එල් රොඩ්‍රිගෝ මයා, ඩබ්. එම්. එම්. ඊ. පී වික්‍රමසිංහ මයා හා එන්. ජී. එස්. සී. රත්නසිරි මියගේ පාර්තෝෂිත මුදල් වශයෙන් රු. **580,334.00** විශ්වවිද්‍යාලය අයක රගෙන ඇත. ඊට අමතරව එන්. ජී. එස්. සී. රත්නසිරි මිය විසින් රු. **775,000.00** ක මුදලක් විශ්වවිද්‍යාලයට ගෙවා ඇති බැවින් තවදුරටත් හිලව්කර ගැනීමට හැකියාව ඇති මුදල රු. **6,676,361.43** ක් වන අතර, අයකර ගත යුතුව ඇති හිඟ මුදල් ප්‍රමාණය රු: **2,176,092.36** ක් දක්වා අඩුවී ඇත.

| | නම | අයවිය යුතු මුදල | දැනට ගෙවන ලද මුදල | අර්ථසාධක හා පාර්තෝෂිත මුදලින් හිලව් කිරීමට හැකියාව ඇති මුදල | දැනටමත් හිලව් කරගෙන ඇති පාර්තෝෂිත මුදල | තවදුරටත් අර්ථ සාධක හා පාර්තෝෂිත මුදලින් හිලව් කරගතයුතු මුදල | තවදුරටත් හිඟ හිටි මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 | එච් පී වී රූපසිංහ මයා | 2,226,080.00 | 483,309.50 | 939,324.63 | - | 939,324.63 | 803,445.87 |
| 2 | එන් ජී එස් සී රත්නසිරි මිය | 4,025,398.00 | 1,937,000.00 | 955,018.78 | 163,750.00 | 791,268.78 | 1,133,379.22 |
| 3 | ඩබ් එම් ඊ පී වික්‍රමසිංහමයා | 2,386,193.22 | 574,013.39 | 1,812,179.83 | 263,700.00 | 154,8479.83 | - |
| 4 | කේ එල්රුද්‍රිගු මයා | 1,069,158.87 | 142,684.41 | 9,26,474.46 | 54,784.00 | 871,690.46 | - |
| 5 | ජේ ඒ ඩී ආර් එන් අප්පුහාමි මයා | 2,161,564.56 | 1,461,783.11 | 6,99,781.45 | 98,100.00 | 601,681.45 | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6 | යු ටී කේ හේරත් මිය | 1,576,396.15 | 1,025,571.80 | 5,50,824.35 | - | 550,824.35 | - |
| 7 | පී එම් එල් එච් කේ මාරඹේ මිය | 1,686,602.83 | 1,020,877.91 | 6,65,724.92 | - | 665,724.92 | - |
| 8 | ආර් එම් ඩබ් එස් රත්නායක මයා | 946,634.00 | - | 7,07,367.01 | - | 707,367.01 | 239,267.27 |
| | එකතුව | 16,078,027.63 | 6,645,240.12 | 7,256,695.43 | 580,334.00 | 6,676,361.43 | 2,176,092.36 |

(ආ) විශ්ව විද්‍යාලයට ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා අදාල සමාගම සමඟ එකඟ වූ ගිවිසුම ප්‍රකාරව සමාගම විසින් පැය 12 ට වැඩි සේවා මුර සඳහා ආරක්ෂක නිලධාරීන් සේවයේ නොයෙදවිය යුතු වුවද, කුලියාපිටිය පරිශ්‍රයේ අවස්ථා 440 කදී හා මාකඳුර පරිශ්‍රයේ අවස්ථා 219 කදී පැය 24 සේවා මුර සඳහා නිලධාරීන් සේවයේ යොදවා ගෙන තිබූ අතර, පැය 72 ක සේවා මුර සඳහාද නිලධාරීන් යොදවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**සේවා ගිවිසුමේ අංක 04 හි (ඉ) කොටසේ අනු අංක 05 ට අනුව සමාගම විසින් ගුණාත්මක සේවාවක් ලබා ගැනීම උදෙසා පැය 12 ක් පමණක් සේවයේ යොදවන මෙන් ආයතනය දැනුවත් කර ඇත. (ඇමුණුම 09) නමුත් අත්‍යවශ්‍ය සේවා පදනම් කරගෙන ඉහත ආකාරයට සේවයේ යොදවන ලද බැවි සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සේවය දන්වා ඇත. (ඇමුණුම 10)**

(ඇ) IDRC ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය තුළ කුලී වාහන වෙනුවෙන් රු. 2,653,706 ක් ගෙවා තිබූ අතර, වෙන් කර තිබූ ප්‍රතිපාදනය රු. 1,795,000 ක් වීමෙන් රු. 858,706 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. පාවිච්චි කරනු ලබන වාහන වෙනුවෙන් දෛනික ධාවන සටහන් පවත්වාගෙන ගොස් නොතිබුණි.

**ව්‍යාපෘති කාලච්ජේදය තුල කුලී වාහන සඳහා ගෙවීම් වැඩි වී ඇති බව සත්‍යයකි. ඒ සඳහා අදාල සියළුම ගමන් සඳහා වාහන අනුමත කිරීමේ පෝරම පුරවා ව්‍යාපෘති සමායෝජක විසින් අනුමත කර ඇත. පරීක්ෂාව සඳහා ව්‍යාපෘති අනුමත පෝරම අප සතුව පවතී. කෙසේ වුවත් IDRC ව්‍යාපෘතියේ II අදියර සඳහා නියමිත ධාවන සටහන් පොතක් පවත්වාගෙන යනු ලැබේ.**

**ධාවන වියදම් වැඩිවීමට හේතු කිහිපයකි.**

**01. අනපේක්ෂිත ලෙස ව්‍යාපෘති කටයුතු සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයට කීපවරක් යාමට සිදු වීම. (ගිවිසුම් කටයුතු සඳහා)**

**02.** කලින් සැලසුම් කල පරිදි වැව්වල මසුන් තැන්පත් කිරීමේ කටයුතු සඳහා අනපේක්ෂිත ලෙස කීපවරක් වයඹ පලාතේ වැව්වලට යාමට සිදුවීම. (නියමිත වේලාවට වැසි නොලැබීම හා අපේක්ෂිත කාලවල වැඩිපුර වැසි ඇතිවීම නිසා මසුන් තැන්පත් කිරීමට නොහැකි වීම

(ඇ) විශ්ව විද්‍යාල පුස්තකාලය සඳහා පොත් තෝරා ගැනීම පමණක් පුස්තකාල පරිග්‍රහන කමිටුවට අයත් කාර්යයක් වූවද, එම බලතල ඉක්මවා පරිග්‍රහන කමිටුව විසින් ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව පොත් ලබා ගෙන පරිග්‍රහන ලේඛණයටද ඇතුළත් කර ඉන්වෙන්ට්‍රි සහතිකද නිකුත් කර ගෙවීම් සඳහා සැපයුම් අංශයට ඉදිරිපත් කර තිබුණි.

හේතුවෙන්)

2010 වර්ෂයට පෙර සිට පුස්තකාලයට පොත් ප්‍රතිග්‍රහණය කිරීමේ ක්‍රමය වූයේ පුස්තකාල ප්‍රතිග්‍රහණ කමිටුව (පොත් මිල දී ගැනීම සම්බන්ධ තීරණ ගැනීමේ කමිටුව – **Library Acqisition Committee)** විශ්වවිද්‍යාල පොත් මිල දී ගැනීමේ ටෙන්ඩර් මණ්ඩලය (**Tender Board)** ලෙස කටයුතු කිරීමයි. ඒ අනුව පුස්තකාල ප්‍රතිග්‍රහණ කමිටු අනුමැතියෙන් ලබා ගන්නා ලද පොත් පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කර අදාල බිල්පත්වල පරිග්‍රහණ අංක සටහන් කර ඉන්වෙන්ට්‍රි සේවා සහතික සමඟ ගෙවීම සඳහා මූල්‍ය අංශයට යොමු කරනු ලැබේ. එසේ යවන ලද සියලු මිලදී ගැනීම්වල බිල්පත් සඳහා මුදල් මේ වන තෙක් නිවැරදිව ගෙවා ඇති බැවින් පුස්තකාල පොත් ප්‍රතිග්‍රහණ කමිටු බලතල ප්‍රසම්පාදන කමිටුව ද පිළිගෙන කටයුතු කිරීම මෙතෙක් සිදුවී ඇති බව පැහැදිලි වේ. 2003 සිට වසරක් පාසා මෙය විගණන අංශය විසින් ද නිරීක්ෂණය කර තිබුණි. එහෙත්, 2010 වසරේදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම ක්‍රමය නිවැරදිතම ක්‍රමය නොවන බව පෙන්වා දීමෙන් අනතුරුව 2010 වසර අගභාගයේ සිට ඔවුන් විසින් පෙන්වා දුන් ක්‍රමයට අනුව පුස්තකාල පොත් හා සඟරා ප්‍රතිග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක කරනු ලැබේ. එම ක්‍රියාපිලිවෙල පිළිවෙලින් පහත දක්වා ඇති අතර එකී කළමනාකරණ අකාර්යක්ෂමතාවය ඔබ දැක්වූ පරිදි නිවැරදි කර ඇත.

1. අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් නිර්දේශිත පොත් ලැයිස්තු දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා පීඨාධිපතිවරුන්ගේ නිර්දේශය හා අනුමැතිය ඇතිව පුස්තකාලයට ලබා ගැනීම.
2. අදාල පොත් ලැයිස්තුව පුස්තකාල සූචිය සමඟ පරීක්ෂා කිරීම.
3. ඉල්ලා ඇති පිටපත් ප්‍රමාණය තහවුරු කර ගැනීම.
4. මිල කැඳවීම. (ආයතන තුනකින් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් දේශීය හා විදේශීය වශයෙන්)
5. මිල ගණන් විවෘත කිරීම. (පුස්තකාල කමිටු තීරණය අනුව මේ සඳහා ජ්‍යෙ. ස. පුස්තකාලයාධිපති(ප්‍රතිග්‍රහණ), සහකාර පුස්තකාලයාධිකාරි (පාඨක සේවා), සහකාර මූල්‍යාධිකාරි සහ සහකාර ලේඛකාධිකාරි (පුස්තකාල සේවා) සහභාගි වේ.)
6. පොත් ප්‍රතිග්‍රහණය සඳහා වූ තාක්ෂණික විශ්ලේෂණ කමිටුව (**Technical Evaluvation Committee – TEC)** මඟින් මිල සංසන්දන ලැයිස්තු සහතික කිරීම. (**TEC** සඳහා

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/ප්‍රධාන පුස්තකාලය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/මාකඳුර, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී/සැපයුම්, සහකාර පුස්තකාලයාධිපති/පාඨක සේවා ඇතුළත්ය.)

7. TEC නිර්දේශය පුස්තකාලයාධිපතිගේ නිර්දේශයෙන් පුස්තකාල කමිටුවට ඉදිරිපත් කිරීම.
8. අවශ්‍ය පොත් සඳහා පුස්තකාල කමිටුවේ නිර්දේශය හා අනුමැතිය ලබාගැනීම.
9. පොත් මිලදී ගැනීමට අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම.
10. අනුමැතිය ලබාගැනීමෙන් පසු පොත් ඇණවුම් කිරීම.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 1996 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා සැපයුම් අත්තිකාරම් වශයෙන් අවස්ථා 14 කදී ලබාදෙන ලද රු.868,582 ක් සහ 2003 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 21 කදී ලබාදෙන ලද රු.205,220 ක සේවා අත්තිකාරම්ද 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

<u>සැපයුම් අත්තිකාරම් (ප්‍රාග්ධන) රු. 868,582.00</u>

මෙම අත්තිකාරම් වලින් රු. 101,769.00 ක් වටිනා අත්තිකාරම් මේ වන විට පියවා ඇත. පුස්තකාලය මගින් අදාල පොත්/ වාර සඟරා ලද බවට තොරතුරු ලද පසු අත්තිකාරම් පියවීමට කටයුතු කරනු ලැබේ.

<u>සේවා අත්තිකාරම් රු. 205,220.00</u>

මේ සඳහා දිගින් දිගටම නිරවුල් කරන ලෙස දන්වමින් සිහි කැඳවීම් යවා ඇත.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු. 1,203,313 ක් වටිනා ඡායා පිටපත් කොල මිලදී ගෙන තිබූ අතර, ගබඩාවෙන් එම ද්‍රව්‍ය ලබා ගන්නා ලද අංශ විසින් ලේඛණවල සටහන් කිරීමක් හා වියදීමක් ලෙස නිකුත් කිරීමක්ද සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාර විසින් 2009 වර්ෂයේදී හඳුන්වා දී තිබුණු ලිපිද්‍රව්‍ය වියදීමත්ව පරිහරණය කිරීමේ ක්‍රමවේදය කෙරෙහි එම අංශ අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

බොහොමයක් අංශ ලේඛකාධිකාරී විසින් 2009 වර්ෂයේදී හඳුන්වා දී තිබූ ලිපිද්‍රව්‍ය විධිමත්ව පරිහරණය කිරීමේ අභ්‍යන්තර චක්‍රලේඛය අනුව කටයුතු කර ඇති අතර එලෙස නොකරන අංශ ප්‍රධානීන් වෙත චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පිළිපදින ලෙස දැනුවත් කර ඇත.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී එකිනෙක පීඨයන්හි කථිකාචාර්යවරුන් වෙත පවරා තිබූ දේශණ හා ප්‍රායෝගික පැය ගණන්වලට අනුව ඉටුකළ පැය ගණන් පරීක්ෂා කිරීමේදී කථිකාචාර්යවරුන් 04 දෙනෙකු විසින් දේශණ පැය 52ක් හා ප්‍රායෝගික පරීක්ෂණ පැය 04 ක් ඉටුකර නොතිබුණි.

<u>මහාචාර්ය එම්.එන්. ඩී. ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය</u>

වැව්ලි කළමනාකරණ අධ්‍යයනාංශයේ මාහාචාර්ය එම්. එන්. ඩී. ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් පවත්වන ලද දේශන පැය 11 ක් ආවරණය නොකිරීම සම්බන්ධයෙන් කරුණු පහත පරිදි වේ.මහාචාර්ය එම්.එන්. ඩී. ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීඨයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ඉවහල් වන **Quality & Innovation Grants** ව්‍යාපෘතියේ යෝජනාවලිය සැකසීම සඳහා ඒ වන විට සක්‍රීයව දායක වී සිටීම නිසා දේශන කාලසීමාවන් ආවරණය කිරීමට යම්තාක් දුරට ඉඩකඩ නොමැති වි ඇත.ඒ කෙසේ වුවද නිවාඩු දින වලදී පවා එතුමිය සිය දේශන ආවරණය කිරීමට සිය දායකත්වය නොඅඩුව ලබා දී ඇත. තවද, ශිෂ්‍යයින්ට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය මූලික කොට ගෙන අදාළ ශීර්ෂ යටතේ තොරතුරු එක් රැස් කර ගැනීමට අවශ්‍ය උපදෙස් එතුමිය විසින් ලබා දීමට ද අවශ්‍ය කටයුතු සිදු කර ඇත.මේ නිසා පැය 11 ක දේශන කාලය අතපසු වුවද සිය විෂය නිර්දේශය ආවරණය කිරීමට අවශ්‍ය සියළු කටයුතු මාහාචාර්ය එම්. එන්. ඩී. ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් සිදු කර ඇත.

ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිඳු නොවීමට පහත පියවර ගෙන ඇත.

අධ්‍යයනාංශය යටතේ දේශන සිදු කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලයට තම දේශන සටහන් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් හඳුන්වා දී ඇත. මීට අමතරව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මාසිකව පවත්වනු ලබන දෙපාර්තමේන්තු රැස්වීම් වලදී මේ සම්බන්ධව සාකච්ඡා කර නිවැරදිව දේශන පැය ගණන් සටහන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. එමෙන්ම**Academic Work Norms** පීඨ රැස්වීම් වලදී එක් එක් දෙපාර්තමේන්තුවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට අදාළව සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත.

<u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>

විමසුමේ සඳහන් මෙම පීඨයෙහි කථිකාචාර්යවරුන් දෙදෙනා විසින් නියමිත දේශන පැය ගණන් ආවරණය නොකිරීමට හේතු (ඇමුණුම 11) හි දැක්වේ.

<u>වී. පී. එන්. ප්‍රසාදි මිය</u>

මෙම කථිකාචාර්යවරිය විසින් 2012 වර්ෂයේදී විෂයමාලා 05 කට අදාලව පවත්වන ලද දේශන හා ප්‍රායෝගික පරීක්ෂණ පිලිබඳ වාර්තා දෙපාර්තමේන්තු කාර්යාලයේ ඇති අතර ඒ අනුව ඔබ විසින් දක්වා ඇති දේශන හා ප්‍රායෝගික පැය ගණන් අතර වෙනසක් ඇති බව කරුණාවෙන් දන්වනු කැමැත්තෙමි.

එම වාර්තාවලට අනුව ඇය හට පවරා ඇති දේශන පැය ගණන් සම්පූර්ණ කර ඇති අතර ක්ෂේත්‍ර ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පැය 04 ක වෙනසක් පවතී.

| | පවරා තිබූ පැය ගණන | ඉටු කල පැය ගණන | ඉටු නොකල පැය ගණන |
|---|---|---|---|
| දේශන | 82 | 82 | - |
| ප්‍රායෝගික | 110 | 106 | 04 |

ඒ අනුව ඉහත සඳහන් පැය 04 ක ප්‍රායෝගික කාලයේ වෙනස ඇති වූයේ ක්ෂේත්‍ර චාරිකාවක් එක් ආයතනයක් මඟින් සමාසික අවසන් සති කීපය තුල කෙටි දැනුම්දීමකින් අවලංගු කිරීම හේතුවෙනි. මෙම අවලංගු කිරීම නිසා ශිෂ්‍යයින්ට ඇති වූ බලපෑම අවම කිරීම සඳහා එම මාතෘකාවට අදාලව ස්වඅධ්‍යයන කටයුත්තක් (ග්‍රන්ථ හා අන්තර්ජාල භාවිතයෙන්) පවරා එම ඇගයීම සිදුකරන ලදී. නමුත් මෙම ඇගයීම විද්‍යාගාරයක් තුල සිදු නොවූ බැවින් මේ සඳහා ගත කළ කාලය ලේඛනගත නොකරන ලදී.

(ඇ) වර්ෂ 2010 සිට 2012 දක්වා කාලසීමාව තුළ කථිකාචාර්යවරුන් 14 දෙනෙකු වෙත පර්යේෂණ ආධාර ව්‍යාපෘති 17 ක් සඳහා ඒකාබද්ධ අරමුදලින් රු. 3,028,018 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම පර්යේෂණාධාර සඳහා 2010 හා 2011 වර්ෂයන්හි දරන ලද මුළු වියදම රු. 1,057,048 ක් විය. ප්‍රතිපාදිත මුදලින් 2012 වසර සඳහා රු. 923,027 ක් වෙන් කර තිබුණු අතර, දරන ලද වියදම රු. 404,721 ක් වුයෙන් උපයෝජනය කර නොතිබූ ප්‍රතිශතය 56% ක් විය. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු අනාවරණය විය.

මෙම පර්යේෂණ 2010 සිට 2012 දක්වා වන කාලසීමාව සඳහා විය. මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය කිරීමේදී 2012 වසර තුල පැවති මාස 05 ක් පමණ වූ අධ්‍යයන කාර්යමණ්ඩලයේ වැඩවර්ජනය බලපා ඇති බැව් දන්වමි.

(i). අංක SRHDC/PP/01/10-13 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා කිසිදු වියදමක් දරා නොතිබූ බැවින් එම පර්යේෂණය අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය වූ අතර, එබැවින් එම පර්යේෂණය සඳහා වෙනත් පර්යේෂකයකු තෝරා ගැනීමට තිබූ ඉඩකඩද ඇහිර තිබුණි.

**SRHDC/PP/01/10-13 පර්යේෂණ ව්‍යාපෘතිය**

**අචාර්ය සී. වී. එල්. ජයසිංහ මිය**

**මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා අදාල කථිකාචාර්යවරිය විසින් 2009 වසරේ ඉල්ලුම් කරන ලද අතර අනුමැතිය 2010 වසරේ 08 වන මාසයේ ලැබී තිබුණි. නමුත් ඇය විසින් 2010.10.01 දින සිට 2011.06.01 දින දක්වා මාස 08 ක සප්තවාර්ෂික නිවාඩු ලබාගත් හෙයින් එම කාලසීමාව තුළ මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. තවද, මෙම පර්යේෂණ**

(ii). අංක SRHDC/PP/01/10-11, 10-14 හා 10-16 යන පර්යේෂණ ව්‍යාපෘති සඳහා දරන ලද මුළු වියදම පිළිවෙලින් ඇස්තමේන්තු අගයෙන් 38%, 14% හා 12% බැගින් වූ හෙයින් එම පර්යේෂණ ව්‍යාපෘති අසාර්ථක වී ඇති බව හෝ අතරමඟ අත්හැර දමා තිබූ බව නිරීක්ෂණය විය. එම ව්‍යාපෘති වෙනුවෙන් ඒ වන විට දරා තිබූ රු. 119,451 ක වියදම නිශ්ඵල වියදමක් විය.

**කටයුතු එම කාල සීමාව තුල කරගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩී. එන්. ලියනගේ මහතාට පවරන ලද නමුත් ඔහුට ද එය ආරම්භ කිරීමට නොහැකි වී ඇත.**

**SRHDC/PP/01/10-11 පර්යේෂණ ව්‍යාපෘතිය**

**මෙම පර්යේෂණය සඳහා වෙන් කරන ලද මුදල රු 183,500.00 වන අතර දරන ලද මුළු වියදම රු 133,000.00 ක් වේ. මෙය වෙන් කරන ලද මුදලේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 72% ක් වේ. මේ වනවිට මෙම පර්යේෂණය අවසන් කර අදාළ පර්යේෂණ වාර්තා පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**

**SRHDC/PP/01/10-14 පර්යේෂණ ව්‍යාපෘතිය**

**මම පර්යේෂණ ව්‍යාපෘතිය සාර්ථකව නිමකර අදාළ පර්යේෂණ වාර්තා පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**

**SRHDC/PP/01/10-16 පර්යේෂණ ව්‍යාපෘතිය**

**මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ඇති බවට දන්වා ඇත. (ඇමුණුම 12)**

(iii). පර්යේෂණාධාරවලට අදාල වාර්තා 2013 පෙබරවාරි අවසානයට පෙර ඉදිරිපත් කළයුතු බවට තීරණය කර තිබුණද, පර්යේෂණාධාර 16 කට අදාල පර්යේෂණ වාර්තා අතරින් එක් වාර්තාවක් 2013 අගෝස්තු 08 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**අදාල පර්යේෂණ වාර්තාව ඉදිරියේ දී පාලක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.**

4.4 අරමුදල් ඌණ උපයෝජනය

පහත සඳහන් ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ මුදල් සමාලෝචිත වර්ෂය තුළ අදාල කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(i). Sandee Researh Grant, Gelt programme, Business Experience Exchange project, Shrimp farm, FLICT project යන ව්‍යාපෘති 05 ක් සඳහා වෙන් කර තිබූ එකතුව රු. 309,182 ක මුදල.

**SANDEE, BEEP, FLICT**

**ඉහත ව්‍යාපෘති සඳහා මුදල් ශේෂයන් පැවතියද එම ව්‍යාපෘති භාර ආචාර්යවරුන් ගෙවීම් කටයුතු සඳහා 2012 වර්ෂයේදී වවුචර්පත් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් 2012 වර්ෂය තුලදී එම ව්‍යාපෘතිවල මුදල් වැයවීමක් සිදු නොවුනි.**

**GELT**

**අදාල ව්‍යාපෘති භාර නිලධාරියා දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.**

**Shrimp Farm**

**මෙම ව්‍යාපෘතිය නමින් මුදල් වැය නොකරන ලද ව්‍යාපෘතියක් මූල්‍ය ප්‍රකාශනවල දක්නට නොමැත.**

(ii). Outreach මධ්‍යස්ථානයට IRQUE ව්‍යාපෘතිය යටතේ ලද රු. 1,000,000 ක මුදල.

**Outreach මධ්‍යස්ථානය සඳහා IRQUE ව්‍යාපෘතිය යටතේ රු. 1,000,000.00 ක මුදල ගනු ලැබුයේ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ව්‍යාපෘති ව්‍යාපාරයක් ලෙස සමාජගත කිරීමට දෙන පහසු ණය යෝජනා ක්‍රමයක් ලෙසය. අවස්ථා කිහිපයක්ම මෙම වැඩපිළිවෙල පිළිබඳ දැනුවත් කිරීම් කලද කිසිවෙක් ණය මුදල ඉල්ලා නැත. මෙයට හේතුව ලෙස දකින්නේ ණය මුදල් ලබා ගැනීමේ දී හා ආපසු ගෙවීමේ දී ඉදිරිපත් කර ඇති කොන්දේසි වලට සිසුන් හා ආචාර්යවරුන් එකඟ නොවීමයි.**

**ඉහත මුදල් වෙනත් කටයුත්තක් සඳහා භාවිතා කළ නොහැකි බැවින් එම මුදල් සිසුන්ට ණය මුදලක් ලෙස ලබා දීම සඳහා පවත්නා කොන්දේසි සුදුසු පරිදි වෙනස් කිරීමට බාහිර සම්බන්ධතා මධ්‍යස්ථාන පාලක කමිටුව 2013.11.13 දින රැස්වී තීරණය කරන ලදී. සංශෝධනය කරන ලද**

කොන්දේසි පීඩ සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව නැවත සිසුන් දැනුවත් කර

4.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

තොග සමීක්ෂණ මණ්ඩල විසින් හඳුනා නොගත් වර්ෂ 2003 සිට 2010 දක්වා කාලය තුළ මිලට ගන්නා ලද රු. 677,991 ක් වටිනා තොග විශ්ව විද්‍යාල ගබඩාවල වසර කිහිපයක් තිස්සේ නිකුත් නොකර නිශ්කාර්යව තිබුණි. මාකඳුර ගබඩාවේ ඇති රු. 127,652 ක් වටිනා දොර අගුලු 55 ක් වසර දෙකක් තිස්සේ නිකුත් නොකර තිබියදී, 2012 වසර තුළදී රු. 36,064 ක් වැය කර නඩත්තු කටයුතු සඳහා දොර අගුලු 14 ක් මිලට ගෙන තිබුණි.

ණය මුදල් ලබා දීමට අපේක්ෂා කරන බව දන්වමි.

ගබඩාවල ඇති පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ඉවත්කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

මාකඳුර ගබඩාවේ පැවති දොර ලොක් සවිකිරීමෙන් අදාල අවශ්‍යතාවය සපුරාගත නොහැකි වූ බැවින් නැවත දොර ලොක් 14 ක් මිලදී ගැනීමට සිදු විය.

4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------------

පහත කරුණු අනාවරණය විය.

(අ) වයඹ විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුව, වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු මිල ගණන් ඉක්මවා තිබූ අතර, ඉදිරිපත් වූ ලංසු 05 න් 04 ක්ම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩුවීමෙන් අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ බව තහවුරු වී තිබුණි. එම මාර්ග ඉදිකිරීමේදී දෙවන වර මතුපිට තාර යෙදීමෙන් පසු වැලි යෙදීම සාමාන්‍ය පිළිගත් ක්‍රමවේදය වූවත් දෙවන වර තාර යෙදීමෙන් පසුද චිප්ස් යොදා තිබූ අතර, එමගින් අදාල කාර්යය ඉටුකළ බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රය තුළ අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව, සංසන්දනය කළ යුතු වන්නේ කොන්ත්‍රාත්කරුවන්ගේ කොන්ත්‍රාත් වටිනාකම් සමඟ නොව වයඹ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ මිල ගණන් හෝ HSR (Highway Schedule Rate) නම් සම්මත මිල ගණන් සෑදෙන ආකාරය දක්වා ඇති කෘතිය සමඟය. මෙම කොන්ත්‍රාත්තුවට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුව, සම්මත HSR අගයන් අනුසාරයෙන් සකස් කර ඇති අතර අධි ඇස්තමේන්තු සකස් කර නොමැති බවත්, ඉංජිනේරු

ඇස්තමේන්තුවෙහි අයිතම අංක 01, 02, 06, 10 සඳහා HSR අගයට වඩා අඩු මිල ගණන් යොදාගෙන ඇති බවත් කාරුණිකව දන්වමි.
තවද, ඇස්තමේන්තු සැකසීමේ දී වැඩ ඉංජිනේරුවරයා විසින් 35% ක ප්‍රමාණයක් ලාභාංශ (Profit & Overhead) ඇතුලත් කර ඇති නමුත් කොන්ත්‍රාත්කරුවන් ඉතා සුළු ලාභාංශයක් ඇතුලත් වන පරිදි තරගකාරී ලෙස මිල ගණන් දක්වා ඇත.

ප්‍රමාණ පත්‍රයේ සඳහන් පරිදි මෙම මාර්ගය දෙවරක් චිප්ස් යොදා මතුපිට සකසා ඇත. එය ද නිවැරදි ක්‍රමයකි.

(ආ) මාකදුර පරිශ්‍රයේ ක්‍රීඩාපිටියේ කාණුව වටා ආරක්ෂිත ග්‍රිල් සවිකිරීම කොන්ත්‍රාත්තුව භෞතිකව පරීක්ෂා කිරීමේදී පහත කරුණු අනාවරණය විය.

(i). ලියාංදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෙකුගෙන්ද මිල ගණන් ලබාගෙන එම කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව ඒ පිළිබඳ සලකා නොතිබුණි.

2011 වර්ෂයේ ලියාපදිංචි වී තිබුණේ කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු පමණි.ඉන් සක්‍රීය මට්ටමේ පැවතියේ කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු පමණි. එබැවින් ඊට කලින් වසරවල (2008-2010) ලියාපදිංචි වී මෙම විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කාර්යයන් සාර්ථකව අවසන් කර තිබූ කොන්ත්‍රාත් ආයතනයක් වූ CN ක්‍රියේෂන් ආයතනයෙන් ද මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදී.අපේක්ෂිත මට්ටමට මිල ගණන් නොලැබෙන විට සුදුසුකම් ඇති වෙනත් ආයතන වලින් ද මිල ගණන් කැඳවීමට සිදු වේ. ඒ බව මිල ගණන් කැඳවන ලිපියේ ද සඳහන් කර ඇත. (ඇමුණුම 13) කෙසේවෙතත් මින් ඉදිරියේ දී ඒ ආකාරයෙන් ද කටයුතු නොකරන බව දන්වමි.

(ii). ඉටුකල යුතු වැඩ විෂයයන් විශ්ලේෂණය නොකර සියළු වැඩ විෂයයන් සඳහා එක් අයිතමයක් ලෙස ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

මෙය සැපයිය යුතු එක් අයිතමයක් බැවින් එසේ ඇස්තමේන්තු පිළියෙල කරන ලද අතර එසේ කිරීම ද එක් ක්‍රමයකි.

(iii). නියමිත ප්‍රමිතියේ L Iron භාවිතා කර නොතිබීමෙන් සම්පූර්ණ ඉදිකිරීමම දුර්වල එකක් විය.

(iv). රු. 933,300 ක පිරිවැයකින් නිම කර තිබූ මෙම කොන්ත්‍රාත්තුවට අදාල යකඩ පැස්සීම සඳහා විශ්ව විද්‍යාලයෙන් විදුලිය ලබා ගෙන තිබූ අතර, ඒ සඳහා රු. 1,000 ක ගාස්තු අඩුකිරීමක් පමණක් සිදුකර තිබුණි.

**මේ සඳහා ගෙවීම් කිරීමේ දී අදාල ලෙස මුදල් අඩු කර ගෙවන ලදී. යම් යම් ස්ථානවල ඉතා සුළු වශයෙන් යකඩවල ගණකම අඩු වූ පමණින් මෙය දුර්වල ඉදිකිරීමක් නොවේ.**

**මෙහි 80% ක පමණ පෑස්සුම් කටයුතු පිටතින් කරගෙනවිත් තිබූ අතර විශ්වවිද්‍යාලයේ දී කරන ලද්දේ ඒවා සුදුසු පරිදි සම්බන්ධ කිරීම වැනි ඉතිරිව තිබූ කාර්යයන් බැවින් අයකරන ලද මෙම මුදල ප්‍රමාණවත් බව දන්වමි.**

(v). ඇස්තමේන්තුව අනුව එකිනෙකට වෙනස් වර්ණයන්ගෙන් මල නිවාරණ තීන්ත වාර දෙකක් ආලේප කර ඒ මත කොළ පැහැති ඉනැමල් තීන්ත ආලේප කළ යුතු වූවද, ග්‍රිල් මත කළු පැහැති ඉනැමල් තීන්ත පමණක් ආලේප කර තිබුණි.

**මෙහිදී අනාවරණය වූ මළ බැඳුනු ස්ථානවල වැඩ අධිකාරීවරයාගේ අධීක්ෂණය අනුව නැවත කොන්ත්‍රාත්කරු ලවා තීන්ත ආලේප කරවන ලදී.**

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

4.7.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්ව විද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | | තථ්‍ය | | පුරප්පාඩු/(අතිරික්ත) | |
|---|---|---|---|---|---|---|
| | අධ්‍යයන | අනධ්‍යයන | අධ්‍යයන | අනධ්‍යයන | අධ්‍යයන | අනධ්‍යයන |
| විධායක | 166 | 31 | 132 | 29 | 34 | 02 |
| ද්විතීයික | 87 | 155 | 78 | 137 | 09 | 18 |
| ප්‍රාථමික | - | 156 | - | 134 | - | 22 |
| වෙනත් | - | - | 16 | 32 | (16) | (32) |
| | 253 | 342 | 226 | 332 | 27 | 10 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක සහ සහයක තනතුරුවල පුරප්පාඩු, ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනයට සෘජුවම බලපෑමක් සිදුවී ඇති බැව් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

2012 වර්ෂය සඳහා වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා **2012.10.14** හා **2013.03.17** දින පලකළ පුවත්පත් දැන්වීම් වලට අනුව 2013 වර්ෂයේදී කථිකාචාර්යවරුන් 19 දෙනෙකු බඳවාගෙන ඇත. ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා මේ වනවිට පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා අවශ්‍ය කටයුතු කරමින් පවතී.

2012 වර්ෂය සඳහා වූ අධ්‍යයන සහායක තනතුරු පුරප්පාඩු 17 න් එක් තනතුරක් මේ වන විට පුරවා ඇත. ඉංග්‍රීසි උපදේශක හා පරිගණක උපදේශක තනතුරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 842 මඟින් බඳවා ගැනීම් සිදු කිරීම අත්හිටුවා ඇත. (ඇමුණුම 14) එබැවින් එම පුරප්පාඩු පිරවීමට නොහැකි අතර ඉංග්‍රීසි උපදේශකවරු හා පරිගණක උපදේශකවරු 09 දෙනෙකු ආධුනික කථිකාචාර්යවරු ලෙස පත් කර ඇත.

ඉතිරි පුරප්පාඩු 07 සඳහා තාවකාලික පදනම මත පරිගණක උපදේශකවරු 02 දෙනෙක්ද ඉංග්‍රීසි උපදේශකවරු 05 දෙනෙක් ද බඳවාගෙන ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනයට බලපෑමක් නොවන ලෙස ඉගැන්වීම් කටයුතු නිසිපරිදි සිදුකර ඇත.

(ආ) අධ්‍යයන අංශයේ තාවකාලික නිදර්ශකයන් හා නිබන්ධකයින්ගේ අනුමත සංඛ්‍යාව වූ 62 ඉක්මවා 08 දෙනෙකු බඳවාගෙන තිබුණි.

මෙම විශ්වවිද්‍යාලයට අනුමත තාවකාලික නිබන්ධක, ප්‍රදර්ශක හා සහකාර කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාව 62 කි. 2012.12.31 වන විට කර තිබූ සම්පූර්ණ තාවකාලික පත්වීම් ප්‍රමාණය 64 කි. වැඩිපුර තාවකාලික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙකු බඳවාගෙන ඇත්තේ එම අංශවල තිබූ ස්ථිර තනතුරු පුරප්පාඩු 02 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙනය.

(ඇ) සුළු සේවකයින් 22 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, විවිධ හේතු දක්වමින් බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 32 දෙනෙකු 2012 වර්ෂයේදී බඳවාගෙන, ඒ වෙනුවෙන් රු.5,075,302 ක මුදලක් ශ්‍රම සැපයූ ආයතනයකට ගෙවා තිබුණි.

2008.09.08 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ ලිපියට අනුව 2009 වර්ෂයට අදාල නව සේවක පුරප්පාඩු සඳහා රාජ්‍ය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා තෙක් සනීපාරක්ෂක නඩත්තු හා පිරිසිදු කිරීමේ කටයුතු සඳහා බාහිරින් ශ්‍රමිකයින් බඳවා ගත හැකි බව දන්වා ඇත. (ඇමුණුම 15) වර්ධන අවදියේ පවතින විශ්වවිද්‍යාලයක් ලෙස එහි පීඨ අධ්‍යයනාංශ අධ්‍යයන ඒකක හා පරිපාලන ඒකක අළුතින් එකතු වීම හා පුළුල් වීමත් සමඟ දෛනික ශ්‍රම අවශ්‍යතා ද වර්ධනය වී ඇත.

2008 වර්ෂයෙන් පසුව 2009, 2010, 2011 වර්ෂවල කරන ලද සේවක ඉල්ලීම් වලින් කොටසක් 2012 වර්ෂයේදී ලබා දී ඇත. ඒ අනුව අදාල බඳවා ගැනීම් අවසන් වන තෙක් පැවති පුරප්පාඩු සඳහා 2012 වර්ෂයේදී බාහිර ශ්‍රම සැපයුම් ආයතනයකින් දෛනික ශ්‍රම අවශ්‍යතා සපුරා ගන්නා ලදී.

මේ වන විට **2012** හා **2013** වර්ෂ සඳහා වූ සේවක ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ලැබීම මත බාහිර ශ්‍රම සැපයුම යටතේ ලබාගත් සේවකයින් ඉවත් කරන ලදී. එහෙත් දැයට කිරුළ හා නඩත්තු අංශයේ අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා පමණක් කම්කරුවන් **12** ක් දැනට බාහිර ශ්‍රම සැපයුම යටතේ සේවයේ යොදවා ඇත.

(ඇ) ලිපිකරු හා සමාන්තර සේවා සහ සුළු සේවකයින්ගේ අනුමත සේවක සංඛ්‍යාව 311 ක් වූ අතර, සත්‍ය වශයෙන් සේවකයින් 271 දෙනෙකු සේවයේ යොදවාගෙන වැටුපට අමතරව ඔවුනට අතිකාල වෙනුවෙන්ද රු.7,682,304 ක මුදලක් ගෙවා තිබුණි.

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ **ix** පරිච්ඡේදයේ 02 ජේදයේ 2.1 හා 2.2 හි සඳහන් පරිදි නිශ්චිත වශයෙන් නියම කළ සාමාන්‍ය වැඩකටයුතුවලින් පරිබාහිර වූත්, හදිසිවූත්, එමෙන්ම සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකිවූත් රාජකාරි කටයුතු කරවා ගැනීම සඳහා අංශ ප්‍රධානියාගේ නිර්දේශය මත අදාල පරිදි ලේඛකාධිකාරී හෝ උපකුලපති හෝ පාලක සභා අනුමැතිය ලබාගෙන අදාල සේවකයින් අතිකාල සේවයේ යොදවා ඇත.

(ඉ) අනුමත කාර්ය මණ්ඩල තනතුරුවලට අමතරව විවිධ තනතුරු සඳහා තාවකාලික පත්වීම් ලබා දී තිබූ අතර, 2012 වර්ෂය තුළ තාවකාලික කාර්ය මණ්ඩල වැටුප් වශයෙන් රු. 31,762,070 ක් ගෙවා තිබුණි.

තාවකාලික නිබන්ධක, තාවකාලික ප්‍රදර්ශක හා තාවකාලික කථිකාචාර්යවරු 62 ක් අනුමත තාවකාලික කාර්යමණ්ඩල තනතුරුවලට පත්කර ඇති අතර වැඩිපුර තාවකාලික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු 02 දෙනෙක් පත්කර ඇත්තේ ස්ථිර කාර්යමණ්ඩල පුරප්පාඩුවල ප්‍රතිපාදන උපයෝගී කරගෙනය.
මීට අමතරව සමාජ වගකීමක් ලෙස ආධුනිකත්ව මණ්ඩල/කාර්මික විද්‍යාල මඟින් අනුයුක්ත කරන ලද ප්‍රායෝගික පුහුණුවන්නන්ගේ සේවය ද ලබාගෙන ඇත.

එබැවින්, 2012 වර්ෂයේ වැටුප් වශයෙන් ගෙවා ඇති මෙම මුදලෙහි අනුමත තාවකාලික කාර්යමණ්ඩල තනතුරු සඳහා ගෙවන ලද වැටුප සහ ප්‍රායෝගික පුහුණුවන්නන් වෙනුවෙන් ගෙවන ලද දීමනාව ද ඇතුලත් වේ.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

### 5.1 සංයුක්ත සැලැස්ම

විශ්ව විද්‍යාලය විසින් 2010 - 2015 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, එම සැලැස්මට අනුව සමාලෝචිත වසර තුළදී ඉටුකළ යුතුව තිබූ පහත දැක්වෙන අධ්‍යයන කටයුතු වලට අදාල නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි.

| සංයුක්ත සැලැස්මට අනුව ඉලක්ක අංකය | අරමුණු අංකය | ඉටුකර නොතිබූ කාර්යය |
|---|---|---|
| ඉලක්ක 02 | අරමුණු 01 | 1. එක් පීඨයකට එකක් බැගින් දෙපාර්තමේන්තු සංඛ්‍යාව වැඩි කිරීම. |
| | අරමුණු 02 | 1. තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය.<br>2. ඉලෙක්ට්‍රොනික පාඨමාලාවක් හඳුන්වා දීම. - ව්‍යවහාරික විද්‍යා පීඨය.<br>3. කාර්මික කළමනාකරණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය.<br>4. නව උපාධි පාඨමාලා හඳුන්වා දීම - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය. |
| ඉලක්ක 03 | අරමුණු 04 | 1. ඉංජිනේරු සහ වෛද්‍ය පීඨයන් ආරම්භ කිරීම.<br>2. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ආරම්භ කිරීම.<br>3. අතිරේක අධ්‍යයන දෙපාර්තමේන්තු ආරම්භ කිරීම. |

**2013 - 2017 දක්වා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කොට පාලක සභා අනුමැතිය ද ලබා ගෙන ඇත.**

5.2 ක්‍රියාකාර සැලැස්ම.

----------------------

විශ්ව විද්‍යාලයේ අරමුණු ඉටුකරගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණු අතර, පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් කාර්තු පදනම මත වියදම් කරන ආකාරය පිළිබඳ විස්තරයක් පමණක් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

2012 වර්ෂය සඳහා සකස් කරන ලද පුනරුත්ථාපන වැඩසටහනක් අනුව අදාල කාර්යයන් සිදු කර ඇත. (ඇමුණුම 16)

(අ) (i)

මෙම මුදල් ඉල්ලා ඇත්තේ එම ව්‍යාපෘතියේ අවසන් බිල්පත් සමථයකට පත් කිරීම සඳහාය. එහෙත් අවසන් බිල්පතේ ශුද්ධ විචලන වටිනාකම 10% සීමාව ඉක්මවා තිබූ බැවින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමට 2011-10-14 දින ලිපියක් (ඇමුණුම 17) යොමු කර තිබුණ ද, මේ වන විටත් අදාල අනුමැතිය ලබාගත නොහැකි වීමෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය වාර්තා වී ඇත.

(ii)

උපදේශන ආයතනය විසින් මෙම ව්‍යාපෘතියේ අවසන් බිල්පත මේ දක්වා විශ්වවිද්‍යාලය වෙත ලබා නොදීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය වාර්තා වී ඇත.

(iii)

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා වූ බිල්පත් සමථයකට පත් කර තිබුණ ද, අවසන් බිල්පත් වටිනාකමට සාපේක්ෂව ගෙවීමට ඉතිරිව තිබූ උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා මෙම මුදල වැය කර තිබුණි.

(iv)

අවසන් බිල්පත් ගෙවීම් සහතිකය මේ දක්වා විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිය වාර්තා වී ඇත.

(v)

නේවාසිකාගාර අදියර V, VI 2012 වර්ෂයේ දී ඉදිකිරීමට සැලසුම් කර ප්‍රතිපාදන ඉල්ලා සිටිය ද, කැබිනට් අනුමැතිය ලද යෝජිත ඉඩම නොලැබීමෙන් එම ඉදිකිරීම් ප්‍රමාද කිරීමට සිදු විය. ඒ

අනුව ප්‍රතිපාදන ඉතිරිය වාර්තා වී ඇත.එම ව්‍යාපෘතිය **2013** වර්ෂයේ දී ආරම්භ කර දැනට ඉදිකෙරෙමින් පවතී.

**(vi)**

මෙම ව්‍යාපෘතිය **2013-01-04** වන විට සියළු වැඩ අවසන් කර විශ්වවිද්‍යාලය වෙත බාර දී තිබුණ ද, කොන්ත්‍රාත්කරු අවසන් බිල්පත් මෙතෙක් ඉදිරිපත් නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිය වාර්තා වී ඇත.

**(vii)**

ව්‍යාපෘතිය සඳහා අදාල ඉඩම් මිලදී ගැනීමට ආරම්භයේ දී රුපියල් මිලියන 10 ක මුදලක් ඉල්ලා සිටි අතර එම ඉඩම් ඉතා අඩු මුදලකට ලබා ගැනීමට හැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරියක් වාර්තා වී ඇත. ඉතිරි ප්‍රතිපාදන භාවිතා කරමින් මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂය අවසානයේ සිට ක්‍රියාත්මක වූ අතර 2013 දී වැඩ අවසන් කර භාර දී ඇත.

**(viii)**

කුලියාපිටිය කාර්ය මණ්ඩල නිල නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් අනපේක්ෂිත ලෙස ප්‍රමාද වීම නිසා මුලින් මුදාහල අත්තිකාරම් මුදල හැර අනෙකුත් ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම්වල ප්‍රගතිය ඉතා අවම මට්ටමක පැවති බැවින් කොන්ත්‍රාත්කරුට අවවාද කර කඩිනම්ව අවසන් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව 2013 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතියෙන් **90%** ක පමණ වැඩ අවසන් කර ඇත.

**(ix)**

වැවිලි කළමනාකරණ පීඨ ගොඩනැගිල්ලේ **I** හා **II** පියවර ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන **6** ක් හා රු. මිලියන **8** ක් ලෙස මිලියන **14** ක මුදලක් නිදහස් කර ඇත. 2012 වර්ෂය වෙනුවෙන්පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ 27 පිටුවේ 3 **(iii)** හි මෙම මුදල දක්වා ඇති අතර අතපසුවීමකින් අදියර **II** ලෙස සටහන් කර නොමැත.

5.3 අයවැය ලේඛණමය පාලනය

--------------------------------

අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී වැය විෂයයන් 25 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර, වැය විෂයයන් 25 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමද, වැය විෂයයන් 09 ක මුළු ප්‍රතිපාදිත මුදලම ඉතිරි කිරීමද සිදුකර තිබූ අතර, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

ඇස්තමේන්තු සකසනුයේ පෙර වර්ෂවල සත්‍ය වියදම් ඉදිරි වර්ෂයේ සැලසුම් හා විවධ උපකල්පන පදනම් කර ගනිමිනි. එම නිසා විචලනයන් ඇති වීම ස්වභාවිකය. සාර්වආර්ථික තත්වයන්ගේ විචලතාවයන් හා අනපේක්ෂිත වෙනස් වීම් විචලතාවයන්ට හේතු වන අතර එබඳු විචලතාවයන් අවම කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---

අංක PED/2 හා ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තියට හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තියට අනුව, ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුව තිබූ, 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 අගෝස්තු 19 දින වන විටත් සභාගත කළ බවට සාක්ෂි නොවීය.

2011 වාර්ෂික වාර්තාවේ පිටපත් 2013.08.15 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

5.5 නොවිසඳි ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ

---

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 (ආ) (iii) ජේදය ප්‍රකාර සෘජු කොන්ත්‍රාත් ක්‍රමය මත මිලදී ගැනීමේදී පාඨ ග්‍රන්ථ ප්‍රසම්පාදනය කිරීම පොත් ප්‍රකාශකයින්ගෙන් පමණක් සිදුකළ හැකි වූවද, 2009 වර්ෂයේදී විශ්ව විද්‍යාලය විසින් රු. 4,130,700 ක් වටිනා පොත්, පොත් ප්‍රකාශකයකු නොවන පෞද්ගලික ආයතනයකින්, ප්‍රකාශකයින් විශාල සංඛ්‍යාවකට අයත් පොත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලබා ගෙන තිබුණි. අදාල මුදල් මෙම වාර්තාවේ දින තෙක් ගෙවිය නොහැකිව තිබූ අතර, ඒ වෙනුවෙන් නිකුත් කර තිබූ විගණන විමසුමටද මෙතෙක් පිළිගත හැකි පිළිතුරු සපයා නොතිබුණි.

2008 වසරේ ජූලි 29 හා 30 යන දිනයන්හි පවත්වන ලද පොත් ප්‍රදර්ශනයකින් අදාල පොත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (විශේෂ ප්‍රසම්පාදන) 9.4.1 යටතේ දක්වා ඇති පරිදි (විශේෂ ප්‍රසම්පාදන) ප්‍රකාශකයන්ගෙන් හා නියෝජිතයන්ගෙන් ලබාගෙන ඇත. මේ සඳහා පොත් ප්‍රකාශකයින් හා නියෝජිතයන් 11 දෙනෙකු කැඳවා ඇති අතර ඒ අතරින් මේ සඳහා සහභාගී වූ තිදෙනෙකුගෙන් පසු ගෙවීම් ක්‍රමය යටතේ කරන ලද පොත් මිලදී ගැනීමකි. දැනට මෙම පොත් ප්‍රදර්ශනයේදී ලබාගත් පොත් සඳහා අනෙක් ආයතන දෙකට (**M.D Gunasena – Rs. 80.078.25** සහ **Expographic - Rs. 301,459.29**) මුදල් මේ වන විටත් ගෙවා ඇත. එක් ආයතනයකට පමණක් (**Quency Distributors**) මුදල් ගෙවා නොමැති අතර එම ආයතනය පොත් ප්‍රකාශකයින්ගේ නියෝජිතයෙක් බවට තහවුරු කෙරෙන ලියවිලි ද ඉදිරිපත් කර ඇත. ඊට අමතරව එම ලියවිලිවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා පුස්තකාලයාධිපති විසින් ගෙන්වා ගන්නා ලද ඊ මේල් ලිපිවල පිටපත් ද සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇත.

2008 වසරේදී මාකඳුර පුස්තකාලයේ දී පවත්වන ලද පොත් ප්‍රදර්ශනයෙන් පුස්තකාලයට පොත් ලබා ගැනීමට කටයුතු සැලැස්වීම සඳහා පහත පියවර ගෙන තිබුණි.

1. උපකුලපතිතුමාගේ අවසරය ලබාගැනීම.
2. අධ්‍යයන කාර්යය මණ්ඩලය, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, පරිපාලන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා දැනුම් දීම.
3. විශ්වවිද්‍යාලයීය මාකඳුර පරිශ්‍රයේ ආරක්ෂක අංශය දැනුවත් කිරීම.
4. මෙම පොත් ප්‍රදර්ශනය සඳහා පහත සඳහන් පොත් ප්‍රකාශකයින්, නියෝජිතයන් හා බෙදාහරින්නන්ගේ ආයතන 11 කට ආරාධනා කිරීම.
    i. එක්ස්පෝග්‍රැපික් **(Expographic)**
    ii. චාර්ල්ස් සුභසිංහ **(Charles Subasingha)**
    iii. කුවින්සි පොත් බෙදාහරින්නෝ **(Quency Distributors)**
    iv. විජිත යාපා **(Vijitha Yapa)**
    v. ලේක් හවුස් **(Lake House)**
    vi. ගුණසේන පොත් සමාගම **(Gunasena)**
    vii. දයාවංශ ජයකොඩි **(Dayawansa Jayakody)**
    viii. ගොඩගේ **(Godage)**
    ix. සරසවි පොත්හල **(Sarasavi Bookshop)**
    x. පිටුබෑන් **(Pitraban)**
    xi. ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය **(NLDSB)**
5. ඒ අනුව ගුණසේන සමාගම (ප්‍රකාශක) සහ බලයලත් නියෝජිත හා බෙදාහරින ආයතන වන **Expographic** හා **Quency** ආයතන සහභාගී විය. මෙම පොත් ප්‍රදර්ශනයට ආයතන තුනක් සහභාගී වීම මත ආයතන තුනකින් මිල ගණන් කැඳවීම හා සමාන ක්‍රියාවලියක් මෙහිදී සිදුකර ඇත.
6. අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් පුස්තකාලය සඳහා පොත් තේරීම.
7. තෝරන ලද පොත් සඳහා අංශ ප්‍රධාන අනුමැතිය ලබා ගැනීම.
8. පුස්තකාල ප්‍රතිග්‍රහණ කමිටු අනුමැතිය ලබාගැනීම. (පුස්තකාල ප්‍රතිග්‍රහණ කමිටුවේ සාමාජිකයන් වන්නේ පුස්තකාලයාධිපති, ජ්‍යෙ.ස. පුස්තකාලයාධිකාරී (ප්‍රධාන පුස්තකාලය)/ප්‍රතිග්‍රහණ, ජ්‍යෙ.ස. පුස්තකාලයාධිකාරී-මාකඳුර, පීඨ නියෝජිතයන් 4, මූල්‍යාධිකාරී හා ලේඛකාධිකාරී වේ.) මෙදින මූල්‍යාධිකාරී හා ලේඛකාධිකාරී ග්‍රන්ථ ප්‍රතිග්‍රහණ කමිටුවට සහභාගී වී නොමැත.
9. ඒ අනුව අනුමැතියෙන් ලබා ගන්නා ලද පොත් පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කර බිල්පත්වලට පරිග්‍රහණ අංක යොදා ඉන්වෙන්ට්‍රි සේවා සහතික සමඟ ගෙවීම් සඳහා සුපුරුදු පරිදි මුදල් අංශය වෙත යැවීම.

2003 සිට 2010 වර්ෂය වනතුරු පැවති ක්‍රමයට අනුව ප්‍රතිග්‍රහණ කමිටු අනුමැතියෙන් පසු පුස්තකාලයට පොත් ලබාගෙන ගෙවීම් සඳහා මුදල් අංශයට අදාල බිල්පත් හා වවුචර් යවා ඇත. ඉන්පසුව මුදල් අංශය මඟින් ගෙවීම් සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කරනු ලැබේ. මින් පෙර 2003 සිට 2009 දක්වා එවැනි කිසිඳු ගෙවීමක් අනුමත නොවී ආපසු ලැබී නොතිබුණි. එහෙයින් අයිතමයන් ප්‍රතිග්‍රහණ අංක යෙදීමෙන් අනතුරුව ගෙවීම් සඳහා යැවීම, ගෙවීම් සඳහා සම්මත ක්‍රමය වී තිබුණි.

මෙම පොත් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.4.1 ඡේදයේ ප්‍රකාර විශේෂ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ප්‍රකාශකයන්ගෙන් ද ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් ද මෙම ප්‍රදර්ශනයේ දී පොත් ලබාගෙන ඇත. විශ්වවිද්‍යාලයේ සුවිශේෂී අවශ්‍යතාවය එනම් අධ්‍යයන පාඨමාලා සඳහා පාඨ ග්‍රන්ථ අවශ්‍යතාවය මත පුස්තකාලයට මෙම පොත් ලබාගෙන ඇත. මෙම පොත් පුස්තකාලයට ලබාගැනීමට පෙර තිබූ අන්තර් පුස්තකාල පිරුළු සේවා මඟින් පොත් ගෙන්වා ගැනීම වැනි දුෂ්කර කාර්යයන් නවතා දැමීමට හැකි වූ අතර ශිෂ්‍ය උද්ඝෝෂණවලදී පුස්තකාලයේ පොත් නැති බවට තිබූ සටන් පාඨ නැවත කීමට ඉඩක් නොතැබීමට ද හැකි විය. පොත් නොමැති වීමෙන් අඩාල වූ දේශන නැවත පැවැත්විය හැකි වාතාවරණයක් උදාවිය. මෙයින් ලබාගන්නා ලද සියලු පොත් පුස්තකාලයේ ඇති අතර 2008 වර්ෂයේ අග භාගයේ සිටම මෙම පොත් පාඨකයින් විසින් පරිහරණය කරනු ලැබේ.

5.6 සමාජ හා පාර්සර්ක වගකීම් ඉටුකිරීම

---------------------------------------

බඳවා ගැනීමේ පර්පාටිය අනුව විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දේශක තනතුරු සඳහා වූ මූලික සුදුසුකම පළමු පෙල පන්ති සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් විය යුතු වූවත්, එම පීඨය විසින් පිරිනමන උපාධිය විශේෂ උපාධියක් නොවීමේ හේතුවෙන් වර්ෂ 2007 සිට මේ වන තෙක් මෙම පීඨයෙන් පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක් ලබා පිටවූ උපාධිධාරීන් 39 දෙනෙකුට එම පීඨයේ හෝ වෙනත් විශ්ව විද්‍යාලවලද රැකියා අවස්ථා අහිමි වී තිබුණි.

2007 වර්ෂයේ ව්‍යවහාරික විද්‍යා පීඨයෙන් උපාධි ලැබූ උපාධිධාරීන් සඳහා අදාළ උපාධි පාඨමාලා ඇති කිරීම සිදු කලේ 2007 වර්ෂයට වසර 03 කට පමණ පෙර බැවින් ඒ වන විට ද ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අධ්‍යයනාංශ 03 ක (ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය හැර) විශේෂවේදී උපාධි පිරිනැමීම සඳහා අවශ්‍ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු නියමිත ප්‍රමාණයට නොසිටීම/හිඟකම හේතු කොටගෙන එම උපාධි පාඨමාලා ඇති කිරීමේ කටයුතු සිදු නොවූ බව පෙන්වා දිය හැක.

එහෙත්, 2006 වර්ෂයේ මැයි සිට 2008 වර්ෂයේ අගෝස්තු දක්වා කාලය තුල ඉහත විශේෂවේදී පාඨමාලා ඇති කිරීම සඳහා වන උපාධි පාඨමාලා සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පීඨ මණ්ඩල රැස්වීම්වල දී ප්‍රධාන අංගයක් ලෙස පුළුල්ව සාකච්ඡාවට බඳුන් කළ අතර එම පාඨමාලා ඇති කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු උනන්දු කිරීමේ ක්‍රියාවලිය අත්‍යවශ්‍යයෙන්ම සිදුකළ බවද වැඩි දුරටත් පෙන්වා දිය හැක. **(ඇමුණුම 18)**

තවද, ඉහත විශේෂවේදී උපාධි පිරිනැමීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඒ ඒ අධ්‍යයනාංශ සෘජුව කටයුතු කල යුතු අතර පැහැදිලි ලෙසම අධ්‍යයනාංශ 03 සඳහාම අවශ්‍ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු නොමැතිවීම හේතු කොට ගෙන ඉහත කාල පරාසය තුළ මෙම කාර්යය ප්‍රමාද වූ බව පැහැදිලිව දැක ගත හැකිය.

එහෙත්, මෙම කාල වකවානුවට පෙර සිටම (2007 වර්ෂය) පීඨය විසින් සිව් වසරක බද්ධ/ප්‍රධාන උපාධි පාඨමාලාව (සය මාසික කර්මාන්ත පුහුණුව සමඟින්) පිරිනමන අතර එහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආධුනික කථිකාචාර්යවරුන් බඳවා ගැනීම නොව උපාධිය ලැබීමෙන් පසු ප්‍රතිඵලදායී ලෙස අනාගත රැකියා අවස්ථා ජනිත කිරීමේ කාර්යයයි.

තවද, 2007 වර්ෂයේ සිට මේ වන තෙක් පිරිනමන ලද උපාධි ඉහත දක්වා ඇති පරිදි බද්ධ/ප්‍රධාන හා සාමාන්‍ය උපාධි (පළමු පෙළ සමාර්ථ 46 සහිතව) ලබා දීමේ ප්‍රමුඛ පරමාර්ථය වුයේ උසස් රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා පිටු බලයක් ලබාදීම සහ උසස් අධ්‍යාපනය සඳහා යොමු වීමේ ඉඩකඩ ලබාදීමයි.

තවද, විශේෂ උපාධි පිරිනැමුව ද සියලු පළමු පෙළ සාමාර්ථ උපාධිධාරීන් සඳහා පීඨය මඟින් රැකියා ලබාදීමක් අපේක්ෂා කළ නොහැකි අතර ආධුනික කථිකාචාර්යවරුන් සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දී ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ උපාධිධාරීන් පමණක් නොව සෙසු විශ්වවිද්‍යාලවල අයදුම්කරුවන්ට ද ඒ සඳහා ඉල්ලුම් කිරීමට ඉඩකඩ විවෘතව පවතී.

ඒ අනුව සමස්තයක් ලෙස ගත් විට විශේෂවේදී උපාධි ඇති කිරීමේ මූලික අභිලාෂය වන්නේ ඔවුන් සඳහා රැකියා ලබා ගැනීමේ අවස්ථා පුළුල් කිරීම සහ උසස් අධ්‍යාපනය සඳහා යොමුවීමේ ඉඩකඩ පුළුල් කිරීමයි. ඒ අනුව 2011 වර්ෂය වන විට ව්‍යවහාරිකවිද්‍යා පීඨයෙන් උපාධිය ලබාගත් උපාධිධාරීන්ගේ අනිවාර්ය රැකියා ප්‍රතිශතය 90% කට වැඩි ඉහල මට්ටමක පවතී.

තවද, මේ වන විට පුළුල් විෂය නිර්දේශ සංශෝධනයක් සිදු කොට ඇති අතර අධ්‍යයනාංශ 02 ක් මඟින් විශේෂවේදී උපාධි ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලබාගැනීමෙන් අනතුරුව 2013 වර්ෂය තුලදී බඳවාගනු ලැබූ 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිසුන් සඳහා විශේෂවේදී උපාධිය ලබාදීමට කටයුතු කර ඇති අතර ඉලෙක්ට්‍රොනික්

අධ්‍යයන අංශය මඟින් ලබාදෙන විශේෂවේදී උපාධිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කොට ඇත.

තවද, පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයන අංශය මඟින් ලබාදීමට නියමිත විශේෂවේදී උපාධිය සඳහා අවශ්‍ය නව විෂය නිර්දේශ සැකසීම මේවන විට ආරම්භකර ඇති අතර ඉදිරි අධ්‍යයන වර්ෂයේ සිසුන් සඳහා එය පිරිනැමීමට කටයුතු සූදානම්ව පවතී.

6. පද්ධති හා පාලනයන්

------------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වර්තන්ට උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) පුස්තකාල පොත් මිළදී ගැනීම
(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඇ) අත්තිකාරම්
(ඈ) බාහිර පාඨමාලා
(ඉ) තොග පාලනය
(ඊ) කාර්ය මණ්ඩල
(උ) අයවැය
(ඌ) ප්‍රසම්පාදන

විගණන වාර්තාව මඟින් අවධානයට ලක් කර ඇති පාලන ක්ෂේත්‍රයන්හි පැවති අඩුපාඩු අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි.

මහාචාර්ය එස්.ජේ.බී.ඒ.ජයසේකර

උපකුලපති

උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
කුලියාපිටිය